Message from the Conference Co-Chair xxi
Message from the Conference Secretary xxiii

NACLIS ප්‍රත්‍යාවලෝකනය xxv
පර්යේෂණ සංස්කෘතියට පුස්තකාල සංගමයේ දායකත්වය

**Abstract**

**Technical Session -01** **1**
**Track : Library and Information Services**

Session Chair : Mr. Uditha Alahakoon, Senior Assistant Librarian, National Institute of Library and Information Science (NILIS), University of Colombo

Rapporteur : Mrs. Kaushalya Rathnasekara, Teacher Librarian, Galahitiyawa Central College, Ganemulla

**ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත පරිපාලන සාහිත්‍ය පිළිබඳ ග්‍රන්ථමිතික අධ්‍යයනයක් : 2000 - 2015** **3**
එන්. ඩී. අචිනි දිලූසිකා, ප්‍රියානි බාලසූරිය

**කොළඹ මහජන පුස්තකාලයේ වාර සඟරා අංශය විසින් සපයනු ලබන සේවා පිළිබඳ අධ්‍යයනයක්** **5**
ආර්. එස්. ඩී. එස්. ප්‍රසන්ගිකා

**ඉංග්‍රීසි නිර්ප්‍රබන්ධ (Non-fiction) කෘති එකතුව සහ එහි භාවිතය පිළිබඳ අධ්‍යයනයක් (කොළඹ මහජන පුස්තකාලයේ වැඩිහිටි අංශය ඇසුරින්)** **7**
ඕෂිනී දිල්හාරි හපුආරච්චි

**නොවිධිමත් ඉගෙනුම් කාර්යයේ දී මහජන පුස්තකාලයේ භූමිකාව (මහනුවර ඩී. ඇස්. සේනානායක අනුස්මරණ මහජන පුස්තකාලය ඇසුරින්)** **9**
අභිමානි වීරසිංහ

**සපුගස්කන්ද පිරිපහදු තාක්ෂණික පුස්තකාලයෙන් සපයනු ලබන තොරතුරු සේවා පිළිබඳ පාඨක සංජානනය** **11**
එම්. ඉනෝකා සජීවනී පෙරේරා

**සීල මාතා අධ්‍යාපන ආයතනයන්හි ඉගෙනුම් ක්‍රියාවලිය සහ ඒවායේ පුස්තකාල භාවිතය** **13**
පූජ්‍ය ගෝණදෙණියේ තපස්සි හිමි

**මහජන පුස්තකාලයන්හි විමර්ශන අංශයේ ක්‍රියාකාරිත්වය වෙත පාඨක අධ්‍යාපනයේ බලපෑම (බණ්ඩාරවෙල මහජන පුස්තකාලය ඇසුරින්)** **15**
අයි. එන්. පොල්ගම්පොල

**කථන ඉංග්‍රීසි භාෂාව ප්‍රවර්ධනයට කොළඹ මහජන පුස්තකාලයේ දායකත්වය (2022-2023 වසරේ පවත්වන ලද ඉංග්‍රීසි භාෂා ප්‍රවර්ධන වැඩසටහන ඇසුරින්)** **17**
පවිත්‍රා මධුවන්ති විජයවර්ධන

**කොළඹ මහජන පුස්තකාලයේ තොරතුරු සම්පත් හා සේවා පිළිබඳ පාඨක තෘප්තිය විමසීමක්** **19**
හිමාෂි අල්විස්

---

**Technical Session -02** **21**
**Track : Library Management and Extension Services**

**Session Chair :** Dr. Udaya Cabral, Assistant Director,
National Library and Documentation Services Board, Colombo 07

**Rapporteur** : Mrs. Harshani Hapuarachchi, Librarian III,
S. W. R. D. Bandaranaike Centenary Public Library,
Minuwangoda

---

**තොග සත්‍යාපනය පිළිබඳ අධ්‍යයනයක් (කොළඹ මහජන පුස්තකාලය ඇසුරින්)** **23**
එන්. ජී. ගයානි නිරංජලා, ස්ටැන්ලි ගුණවර්ධන

**The IFLA library map of the world: review of the SDG success stories** **25**
*Teckla Chandani Silva*

**තිරසර සංවර්ධන ඉලක්ක සාධනයෙහිලා 2022 වර්ෂවල කොළඹ මහජන පුස්තකාලයෙන් ක්‍රියාත්මක කරන ලද ව්‍යාප්ති සේවා පිළිබඳ අධ්‍යයනයක්** **27**
ආර්. කේ. පූර්නිමා පියෝමි

**ආපදා සමයක දී පුස්තකාල සම්පත් සංරක්ෂණයේ ඇති වැදගත්කම : ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ පුස්තකාලය ඇසුරෙන් කෙරෙන අධ්‍යයනයකි** **29**
ප්‍රියදර්ශනී හේමකුමාර

**පාසල් පද්ධතිය තුළ සම්පත් පාදක ඉගෙනුම ක්‍රියාත්මක කිරීම (මතුගම අධ්‍යාපන කලාපය ඇසුරින්)** **31**
ඩී. එම්. එන්. බී. දසනායක

**වයඹ පළාතේ ප්‍රාථමික පාසල්වල ක්‍රියාත්මක කරන ලද කියවීම් කාමර ව්‍යාපෘතිය පිළිබඳ ඇගයීමක්** **33**
ඩබ්. ඒ. එස්. එරන්දති ධර්මප්‍රිය

**රූපවාහිනී මාධ්‍ය ආයතන පුස්තකාලයක සංරක්ෂණ භූමිකාවේ වැදගත්කම (ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය ඇසුරින්)** **35**
ප්‍රියන්ත ගොඩකන්ද

**Technical Session - 03** **37**
**Track : Library and Community Information Services**

**Session Chair :** Mr. K.K.G. Wijeweera, Former Chief Librarian, Central Bank of Sri Lanka

Ven. Demunnewe Upali Thero, Lecturer in Library and Information Science, Department of Social Sciences and Comparative Studies, Faculty of Languages and Cultural Studies, Bhiksu University of Sri Lanka

**Rapporteur** : Mrs. Thamara Jayasena, Librarian I, Colombo Public Library

---

**From challenges to change"- Valluvar community library empowering education and community cohesion through library establishment and its initiatives : a case study of Delmar Middle Division in Nuwara Eliya district** **39**
*Shanmugavell Dilushan*

**Awareness on Bolgoda wetlands: a study on Panadura public library users** **42**
*Thushari Seneviratne, Wathsala Liyanaarachchi, Chulantha Jayawardena*

**The Role of public libraries in fostering the creative economy within Gampaha district** **44**
H.G.M Aravindi Gajanayake

තොරතුරු අවශ්‍යතා සපුරාලීමට උඩුගම්පල එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ජන්ම ශත සංවත්සර මහජන පුස්තකාලයේ දායකත්වය (අ. පො. ස. උසස් පෙළ සිසුන් ඇසුරින්) **46**
එච්. ඒ. පී. හර්ෂණී හපුආරච්චි

ප්‍රජා පාදක විශෝධන මධ්‍යස්ථානවල ආශ්‍රාලාභීන්ගේ විශෝධන ක්‍රියාවලියට අදාළ තොරතුරු අවශ්‍යතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් **48**
ඩී. එම්. ඩබ්ලියු. වී. ජයසිංහ

බන්ධනාගාරගත වන කාන්තා රැඳවියන්ගේ දරුවන් සමාජගත කිරීමේ දී මහජන පුස්තකාලයට කළ හැකි කාර්යභාරය **50**
අනූෂා රත්නායක

ප්‍රබන්ධ සාහිත්‍ය ප්‍රවර්ධනයෙහි ලා මුහුණු පොතෙහි කියවීම් කණ්ඩායම්වල දායකත්වය **52**
හිමන්ති කුමාරි

මට්ටක්කුලිය මහජන පුස්තකාලය මඟින් ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට ගත් උත්සාහය පිළිබඳ අධ්‍යයනයක් **54**
චාන්දනී සිල්වා

පාසල් පුස්තකාල පරිපාලනය විධිමත් කිරීම සඳහා විදුහල්පති භූමිකාවේ බලපෑම **56**
ආර්. එම්. පී. ඩී. රත්නායක

**පාසල් සිසුන්ගේ විෂය සාධනයට සහ මෘදු කුසලතා සංවර්ධනයට විවාද තරගාවලියෙන් ලද දායකත්වය (ගම්පහ මහජන පුස්තකාලය ඇසුරින්)** **57**
ඩී. ඩබ්. චන්ද්‍රිකා

**මහජන පුස්තකාල පාඨකයන්ගේ ප්‍රබන්ධ කියවීමේ රුචිකත්වය පිළිබඳ අධ්‍යයනයක්** **59**
එච්. ඩබ්ලිව්. ඉන්දිකා දිශාන්ති

---

**Technical Session - 04** **61**
**Track : Library Services and Information Technology**

**Session Chair** : Dr. S.K. Illangarathne, Librarian, Bhiksu University of Sri Lanka

**Rapporteur** : Mrs. Kusala Sajeewani, Assistant Librarian, Gampaha Wickramarachchi University of Indigenous Medicine, Yakkala

---

**සම්මිශ්‍රිත ඉගෙනුම් ක්‍රමවේදයේ දී** (Blended Learning Method) **ඉ - තක්සලාව ඉගෙනුම් මෙවලමක් ලෙස ව්‍යවහාර කිරීම** **63**
සුමුදු වාසනා විජේසූරිය

**The research articles on palm leaf manuscripts in Sri Lanka: a bibliometric study using Google Scholar articles published during 2015-2022** **65**
*H. U. C. S Kumara, H. D. M.Nishanthi,*
*J. G. Chandani, K. W. A. M. Konpola*

**A study of the use of RFID technology for securing university libraries in Sri Lanka** **67**
*W. R. N. Indrachapa*

**Navigating personal name headings: challenges in Online Public Access Catalogues (OPACs) at the University of Kelaniya and the University of Colombo** **68**
*W. M. T. A. P. Wasala*

මාර්ගගත පොදු ප්‍රවේශ සූචියේ භාවිතය පිළිබඳ අධ්‍යයනයක්: කැලණිය විශ්වවිද්‍යාලයේ තෙවන වසර විද්‍යාර්ථීන් ඇසුරින් 69
ඉරේෂා මධුමාලි

**කැස්බෑවුන් පිළිබඳ අතථ්‍ය පුස්තකාලයක් (Virtual Library) නිර්මාණය කිරීම** **75**
ටි. එම්. පි. වික්‍රමතිලක, කේ. ඒ. ඩි. ඒ. ඩි. ගුණරත්න

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාලවල මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය භාවිතයේ දී මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනයක් **79**
එච්. ජේ. එල්. පෙරේරා, ප්‍රියංවදා වනිගසූරිය

# Technical Session - 01

**Track : Library and Information Services**

**Session Chair** : Mr. Uditha Alahakoon,
Senior Assistant Librarian,
National Institute of Library and Information Sciences (NILIS),
University of Colombo

**Rapporteur** : Mrs. Kaushalya Rathnasekara,
Teacher Librarian,
Galahitiyawa Central Collage, Ganemulla

# ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත පරිපාලන සාහිත්‍ය පිළිබඳ ග්‍රන්ථමිතික අධ්‍යයනයක් : 2011 - 2015

එන්. ඩී. අචිනි දිලුසිකා[1]
ප්‍රියානි බාලසූරිය[2]

රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය කර ක්‍රියාත්මක කරන ආකාරය අධ්‍යයනය කරන ශාස්ත්‍රීය ශික්ෂණයක් යනුවෙන් රාජ්‍ය පරිපාලනය නිර්වචනය කළ හැකිය. රාජ්‍ය පරිපාලනය මූලික වශයෙන් අංග දෙකකින් සමන්විත වේ. එනම්, ව්‍යූහාත්මක සහ කෘත්‍යාත්මක වශයෙනි. ව්‍යූහාත්මක අංගයෙන් රාජ්‍යයේ සංවිධානාත්මක දැක්ම ප්‍රකාශ වේ. පොදු නීති රෙගුලාසි සහ රාජ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය කෘත්‍යාත්මක අංගයට අයත් වේ. ශ්‍රී ලංකාව තුළ ද මෙම කෘත්‍යාත්මක අංගය සවිබල ගැන්වීම සඳහා පරිපාලන සේවාවක් සහ නිලධාරි තන්ත්‍රයක් ස්ථාපිත කර ඇත. එමෙන්ම මෙය උසස් අධ්‍යාපන ආයතනවල විෂයක් වශයෙන් හැදෑරීමේ අවස්ථා ද පුළුල්ව පවතී. මෙම තත්ත්වය හේතුවෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ සාහිත්‍යයක් ද නිර්මාණය වෙමින් තිබේ. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ 2011-2015 දක්වා කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ පළ වූ රාජ්‍ය පරිපාලනයට අදාළ ප්‍රකාශන පිළිබඳ ප්‍රමාණාත්මක අධ්‍යයනයක් කිරීම වේ. මේ සඳහා ග්‍රන්ථමිතික අධ්‍යයන ක්‍රමවේදය භාවිත කරන ලද අතර දත්ත රැස්කිරීමේ මූලාශ්‍රය ලෙස ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය යොදා ගන්නා ලදී. අධ්‍යයනයට ලක් වූ වසර පහ තුළ ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලියේ 350 රාජ්‍ය පරිපාලනය වර්ග පංතියට අයත් ප්‍රකාශන මෙමගින් ආවරණය කෙරිණි. මෙම කාලය තුළ රාජ්‍ය පරිපාලනයට අදාළව පළ වී ඇති සමස්ත කෘති සංඛ්‍යාව 164කි. මෙහිදී අධ්‍යයනයට බඳුන් කරන ලද්දේ සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය කෘති පමණි. සිංහල (83) සහ ඉංග්‍රීසි (81) මාධ්‍ය කෘති ප්‍රකාශනය බොහෝ දුරට සමාන අගයක් ගෙන ඇත. මෙයින් වැඩිම ප්‍රමාණයක් (53.6%) අයත් වන්නේ වාර්ෂික වාර්තා ගනයටය. මෙයට අමතරව කාර්යසාධන වාර්තා (16.4%) පරිපාලන වාර්තා (10.8%) අයවැය වාර්තා (3.7%) විගණකාධිපති වාර්තා (1.8%), වාර ප්‍රකාශන (1.8%) සහ පාර්ලිමේන්තු පනත් (0.6%) යනාදියෙන් සමස්ත ග්‍රන්ථ සංඛ්‍යාවෙන් 88.1%ක් ආවරණය වේ. මෙම ග්‍රන්ථ සියල්ලම අයත් වන්නේ වාර්තා සාහිත්‍යයටය. පරිපාලන විෂයට අදාළ ශාස්ත්‍රීය, පර්යේෂණ හෝ විෂයාත්මක කෘති පළව ඇත්තේ සමස්තයෙන් 11.9%ක් පමණි.

[1] තොරතුරු සහකාර, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
achinidilushika68@gmail.com

[2] පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනය
Priyani@slida.gov.lk

රාජ්‍ය පරිපාලනය විෂයක් ලෙස සංවර්ධනය වීමේ දී ඒ හා බැඳුණු සාරවත් විෂයානුබද්ධ සාහිත්‍යයක් පැවතිම අත්‍යවශ්‍ය සාධකයක් වේ. එහෙත් මෙම විශ්ලේෂණයෙන් පැහැදිලි වන්නේ රාජ්‍ය පරිපාලන විෂය ක්ෂේත්‍රය පිළිබඳ විෂයානුබද්ධ කෘති පළ වීම සතුටුදායක මට්ටමක නොපවතින බවයි. මෙය එහි ව්‍යුහාත්මක මෙන්ම කෘත්‍යාත්මක අංග යාවත්කාලීන වීමටත් නවීකරණය වීමටත් බාධකයකි. මන්ද, ඕනෑම විෂය ක්ෂේත්‍රයක් ගුණාත්මකව වර්ධනය වීම සඳහා අලුත් දැනුම නිර්මාණය මෙන්ම බෙදාහැරීම ද අනිවාර්ය කොන්දේසියක් වන බැවිනි. එහෙයින් ශ්‍රී ලංකාවේ පරිපාලන සාහිත්‍ය, වාර්තා සාහිත්‍යයක් තුළට සීමාවීම වැලැක්වීම සඳහා පියවර ගැනීමට රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ විද්වතුන්, ශාස්ත්‍රඥයන්, නිලධාරීන් මෙන්ම පර්යේෂකයන්ගේ ද අවධානය යොමු වීය යුතුව ඇත.

**ප්‍රමුඛ පද** : රාජ්‍ය පරිපාලනය, ග්‍රන්ථමිතික අධ්‍යයන, වාර්තා සාහිත්‍ය

# කොළඹ මහජන පුස්තකාලයේ වාර සඟරා අංශය විසින් සපයනු ලබන සේවා පිළිබඳ අධ්‍යයනයක්

ආර්. එස්. ඩී. එස්. ප්‍රසංගිකා[1]

මහජන පුස්තකාලයක පවත්නා ප්‍රධානතම අංශයක් ලෙස වාරසඟරා අංශය හැඳින්විය හැකිය. අනෙකුත් මුද්‍රිත මූලාශ්‍රවලට සාපේක්ෂව වඩාත් යාවත්කාලීන තොරතුරු වාර සඟරාවල ඇතුළත් වීම නිසා තොරතුරු සොයා එන පාඨකයන්ගේ අවධානය ඒවා වෙත යොමු වේ. කොළඹ මහජන පුස්තකාලය සතුව පොහොසත් වාර සඟරා එකතුවක් පවතී. බොහෝ විට පාඨකයන් පුස්තකාල පරිශ්‍රයට පැමිණ මෙම එකතුව පරිශීලනය කිරීමට නැඹුරුව සිටිය ද COVID – 19 වසංගත සමයේදී මෙම තත්ත්වය අභියෝගයට ලක් විය. මේ නිසා පුස්තකාලයේ සම්පත් පාඨකයාට භෞතිකව පරිහරණය කිරීම සීමා කෙරිණි. මෙයට විකල්පයක් ලෙස කොළඹ මහජන පුස්තකාලය වාර සඟරා අංශයේ සේවා මාර්ගගතව සැපයීමේ වැඩපිළිවෙළක් සකස් කරන ලදී. වාර සඟරා අංශය මගින් සපයනු ලබන සේවාවන්ගේ ගුණාත්මක තත්ත්වය විමසීමත්, එය ක්‍රියාත්මක වන ආකාරය පරීක්ෂා කිරීමත්, මෙම සේවා පිළිබඳ පාඨක දැනුවත්භාවය විග්‍රහ කිරීමත් මෙම පර්යේෂණයේ අරමුණු වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස සමීක්ෂණ ක්‍රමය භාවිත කරන ලද අතර ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා ඇසුරින් දත්ත එක්රැස් කරන ලදී. වාර සඟරා එකතුව පරිහරණය කරන පාඨකයන් 75ක් නියැදිය ලෙස තෝරා ගැණිනි. එයින් 60 දෙනෙකු ප්‍රතිචාර දක්වා තිබිණි. දත්ත විශ්ලේෂණයේ දී පැහැදිලි වූයේ වසංගත සමයේ ආරම්භ කරන ලද මාර්ගගත සේවා සඳහා පාඨක නැඹුරුව ඉහළ මට්ටමක පවතින බවය. මේ අතරින් වැඩිම පාඨක පිරිසක් ටෙලිග්‍රෑම් ඇප් සේවය (31.63%) භාවිතයට කැමැත්තක් දක්වති. එමෙන්ම අන්තර්ජාල සේවයද ඔවුන්ගේ ජනප්‍රිය අංගයකි. (28%) මේ අතර වට්ස් ඇප් හරහා සඟරා අංශයෙන් තොරතුරු ලබා ගන්නා පිරිසක් ද (0.16%) සිටී. 9%ක් පටුන පිටු සේවය භාවිත කරති. කෙසේ වෙතත්, පුස්තකාලයේ සඟරා අංශය වෙත පැමිණ සේවා ලබා ගන්නා පාඨකයන්ගේ ද (31.2%) අඩුවක් නොමැත. පොදුවේ ගත්විට පාඨකයන්ගෙන් බහුතරයක් (97%) වාර සඟරා අංශය විසින් සපයනු ලබන සේවා පිළිබඳ තෘප්තිමත්භාවයකින් පසුවන බව අනාවරණය විය. නමුත් මෑතකාලීන ආර්ථික අර්බුදය හමුවේ වාර සඟරා මිලදී ගැනීම විශාල වශයෙන් අඩුවී තිබීම සේවාවේ ගුණාත්මකභාවය වෙත නිශේධනාත්මක බලපෑමක් සිදු කරන බව පෙනේ. පාඨකයන් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡාවලදී මේ බව පැහැදිලි විය.

[1] පුස්තකාලයාධිපති III, කොළඹ මහජන පුස්තකාලය
sumudu.prasangika1974@gmail.com

මාර්ගගත සේවා තවදුරටත් පුළුල් කිරීම, වාර සඟරා ලිපි සඳහා විෂය අනුක්‍රමණිකා සම්පාදනය, සඟරා අංශයේ සේවා පිළිබඳ පාඨක අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම මගින් මෙම සේවා වැඩි පාඨක පිරිසක් වෙතට ව්‍යාප්ත කළ හැකිය.

**ප්‍රමුඛ පද** : වාර සඟරා අංශය, මහජන පුස්තකාල, මාර්ගගත සේවා

# ඉංග්‍රීසි නිර්ප්‍රබන්ධ (Non- fiction) කෘති එකතුව සහ එහි භාවිතය පිළිබඳ අධ්‍යයනයක් (කොළඹ මහජන පුස්තකාලයේ වැඩිහිටි අංශය ඇසුරින්)

ඕෂිනී දිල්හාරි හපුආරච්චි[1]

පුස්තකාල එකතුව ප්‍රධාන වශයෙන් ප්‍රබන්ධ සහ නිර්ප්‍රබන්ධ ලෙස පුළුල්ව කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. ශාස්ත්‍රීය මෙන්ම සියලු විෂයානුබද්ධ කෘති නිර්ප්‍රබන්ධ ගණයට අයත් වේ. කොළඹ මහජන පුස්තකාලයේ වැඩිහිටි අංශයේ පවත්නා නිර්ප්‍රබන්ධ එකතුව විශේෂ ස්ථානයක් ගනී. කොළඹ මහජන පුස්තකාලය අයත් වන කොළඹ මහා නගර සහා බල ප්‍රදේශයේ ජන සංයුතිය මෙන් ම භාෂාමය, සංස්කෘතික හා ආගමික සංයුතිය ද බෙහෙවින් විවිධත්වයක් ගනී. එහෙයින් එහි නිර්ප්‍රබන්ධ එකතුව මෙම පාඨක විවිධත්වයේ අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි සංවර්ධනය විය යුතුය. තමන්ගේ මව් භාෂාව කුමක් වූවද මෙම සෑම ජන කණ්ඩායමක් ම ඉංග්‍රීසි භාෂාමය නිර්ප්‍රබන්ධ භාවිත කරනු දැකිය හැකිය. අධ්‍යාපනික අවශ්‍යතා, දැනුම සංවර්ධනය සහ පර්යේෂණ කාර්යයන් සඳහා පාඨකයෝ මෙම නිර්ප්‍රබන්ධ එකතුව පරිහරණය කරති. කොළඹ මහජන පුස්තකාලය ඉංග්‍රීසි නිර්ප්‍රබන්ධ මිල දී ගැනීම සඳහා වාර්ෂිකව අවම වශයෙන් රු. මිලියන දෙකක් පමණ වැය කරයි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ එම එකතුව සංවර්ධනය වන ආකාරය විමසීමත් එහි භාවිතයේ දිශානතිය හඳුනා ගැනීමත්ය. වර්තමානයේ කොළඹ මහජන පුස්තකාලයේ ඉංග්‍රීසි නිර්ප්‍රබන්ධ එකතුව 43138කි. මෙහිදී නියැදිය ලෙස 2022 සහ 2023 වර්ෂවල ඉංග්‍රීසි නිර්ප්‍රබන්ධ භාවිතය සලකා බලන ලදී. අදාළ සංසරණ දත්ත KOHA මෘදුකාංගය මගින් ලබා ගැණිනි. මෙයට අමතරව වාර්ෂික වාර්තාවල සඳහන් දත්ත භාවිත කෙරිණි. දත්ත විශ්ලේෂණය කිරීමේදී ඩිවි දශම වර්ගීකරණයේ ප්‍රධාන වර්ග පංති දහය පදනම් කර ගන්නා ලදී. මේ අනුව දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයක් වන්නේ අනෙකුත් වර්ග පංතිවලට සාපේක්ෂව 500 සහ 600 එනම්, විද්‍යාව හා තාක්ෂණය විෂයන්ට අදාළ ඉංග්‍රීසි නිර්ප්‍රබන්ධ භාවිතය ඉහළ මට්ටමක පවතින බවයි. එමෙන්ම භාෂාව (400) වර්ග පංතියට අදාළ කෘති සඳහා ඇති ඉල්ලුම ක්‍රමයෙන් වර්ධනය වනු පෙනේ. අනෙක් අතට සමාජීය විද්‍යා සහ මානව ශාස්ත්‍ර විෂයන්ගේ භාවිතය අවම මට්ටමක පවතී. මෙම තත්ත්ව මත පැහැදිලි වන්නේ විශේෂයෙන් නාගරික යොවුන් සහ තරුණ ප්‍රජාව සමාජීය විද්‍යා සහ මානව ශාස්ත්‍ර විෂයන්ට

[1] පුස්තකාලයාධිපති (II), කොළඹ මහජන පුස්තකාලය
oshinee123@yahoo.com

වඩා විද්‍යා හා තාක්ෂණ විෂයන් වෙත දක්වන නැඹුරුව කැපී පෙනෙන බවයි. අධ්‍යාපනික ක්‍රියාවලිය සහ රැකියා වෙළඳපොළ අතර පවත්නා සබඳතාවේ දිශානතිය මෙයින් පැහැදිලි ලෙස විද්‍යාමාන වේ. විද්‍යා හා තාක්ෂණික විෂයන්ට අදාළ කෘති වැඩි ප්‍රමාණයක් ඉංග්‍රීසි භාෂාවෙන් රචනා වී තිබීම ද මෙයට හේතුවකි. එමෙන්ම මෙම විෂය ක්ෂේත්‍රයන්හි දැනුම ඉක්මනින් යාවත්කාලීන වේ. මානව ශාස්ත්‍ර විෂයන් අතරින් භාෂා අධ්‍යයනයට වැඩි අවධානයක් යොමුව ඇත. මෙය ද රැකියා වෙළඳපොළ සමඟ සමීපව බැඳුණු තත්ත්වයකි. විශේෂයෙන් අධ්‍යාපනය සහ රැකියා සඳහා විදේශගත වීමට අපේක්ෂාවෙන් සිටින්නන් ජාත්‍යන්තර ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා විභාගය හෝ ඊට සමාන්තර වෙනත් විභාග සමත් වීම අත්‍යවශ්‍ය වේ. ඔවුන් තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කොළඹ මහජන පුස්තකාලයේ ඉංග්‍රීසි නිර්ප්‍රබන්ධ එකතුව භාවිත කිරීමේ ප්‍රවණතාව වර්ධනය වෙමින් තිබේ. එහෙයින් ඉහළ ඉල්ලුමක් පවතින විෂයන්ගේ කෘති එකතුව වර්ධනය කිරීමත් අඩු භාවිතයක් සහිත එකතු පිළිබඳ ප්‍රවර්ධන කටයුතු ශක්තිමත් කිරීමත් මගින් ඉංග්‍රීසි නිර්ප්‍රබන්ධ එකතුවේ භාවිතය තවදුරටත් පුළුල් කර ගත හැකි වේ.

**ප්‍රමුඛ පද :** නිර්ප්‍රබන්ධ, ඉංග්‍රීසි භාෂාව, මහජන පුස්තකාල

# නොවිධිමත් ඉගෙනුම් කාර්යයේදී මහජන පුස්තකාලයේ භූමිකාව (මහනුවර ඩී. ඇස්. සේනානායක අනුස්මරණ මහජන පුස්තකාලය ඇසුරින්)

අබිමානි වීරසිංහ[1]

වර්තමාන අධ්‍යාපන ක්‍රියාවලියේ දී නොවිධිමත් සහ අවිධිමත් අධ්‍යාපනයට විශේෂ අවධානයක් යොමු වී තිබේ. මේ අනුව ඉගෙන ගැනීමට තිබෙන එකම ස්ථානය ලෙස පාසල සැලකිය හැකි නොවේ. මෙහිදී නොවිධිමත් අධ්‍යාපනය යනුවෙන් අදහස් කෙරෙනුයේ පාසල් පද්ධතියෙන් පරිබාහිරව නියත කුසලතා සහ නිපුණත්වයන් ඉලක්ක කර ගත් සංවිධිත හෝ අර්ධ සංවිධිත විෂය බාහිර ක්‍රියාකාරකමකි. මෙම කාර්ය සපුරා ගැනීම සඳහා මහජන පුස්තකාල තීරණාත්මක භූමිකාවක් ඉටු කරයි. යාවජීව ඉගෙනුම, පාසල් වේලාවෙන් පසු ක්‍රියාකාරකම්, තොරතුරු සංස්කෘතිය, විවේක කාල ක්‍රියාකාරකම් හෝ තොරතුරු වෙත ප්‍රවේශය මගින් මහජන පුස්තකාල ඊට දායකත්වය සපයයි. ස්වයං අධ්‍යාපනය සහ ස්ථාවර අධ්‍යාපනය සඳහා පාසල් කෙනෙකු සූදානම් කරන විට මහජන පුස්තකාල නොවිධිමත් ක්‍රමවේද මගින් මෙම එළඹුමට සහාය වේ. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ මහජන පුස්තකාල මගින් ක්‍රියාත්මක කරනු ලබන නොවිධිමත් අධ්‍යාපනික වැඩසටහන් පිළිබඳ විග්‍රහ කිරීමයි. පර්යේෂණයට බඳුන් කරන ස්ථානය ලෙස මහනුවර ඩී. එස්. සේනානායක මහජන පුස්තකාලය තෝරා ගන්නා ලදී. පර්යේෂණ ක්‍රමවේදය ලෙස සිද්ධි අධ්‍යයන ක්‍රමය භාවිත කරන ලද අතර පුස්තකාල කාර්යමණ්ඩලයෙන් සහ පාඨකයන් අතරින් තෝරා ගත් නියැදියකින් දත්ත එක්රැස් කරන ලදී. මේ අනුව පැහැදිලි වූයේ මෙම පුස්තකාලය ප්‍රධාන වශයෙන් පාඨමාලා පැවැත්වීම, දේශන සහ සාහිත්‍ය තරග පැවැත්විම ක්‍රියාත්මක කරන බවය. පාඨකයන් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡාවලදී අනාවරණය වූයේ මෙම වැඩසටහන් කෙරෙහි සාධනීය ආකල්පයක් ඔවුන් සතු බවය. විශේෂයෙන් මහජන පුස්තකාලය විසින් පවත්වනු ලබන වෘත්තීය මාර්ගෝපදේශ පාඨමාලා වෙත ඔවුන්ගේ වැඩි අවධානය යොමු වී තිබිණි. එමෙන්ම විධිමත් අධ්‍යාපනයෙන් ලැබෙන විෂයාත්මක දැනුමෙන් පමණක් සාර්ථක ඉගෙනුමක් අත්පත් කරගත නොහැකි බව පොදු පිළිගැනීම වේ. ඒ සඳහා තවත් කුසලතා රැසක් අවශ්‍ය වේ. කියවීම, ලිවීම, කණ්ඩායම් ක්‍රියාකාරිත්වය, සන්නිවේදනය මෙන්ම සමාජීය කුසලතාද ඊට ඇතුළත් වේ.

[1] තාවකාලික කථිකාචාර්ය, තොරතුරු අධ්‍යයන ඒකකය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
abhinisansala97@gmail.com

විශේෂයෙන් මහජන පුස්තකාලය විසින් සංවිධානය කරනු ලබන කියවීම් ප්‍රවර්ධන වැඩසටහන්, සාක්ෂරතා වැඩසටහන්, සාහිත්‍ය තරග, විද්වත් දේශන යනාදිය මෙකී කුසලතා නොවිධිමත් ආකාරයකින් සපුරා ගැනීමට පාඨකයන්ට සහාය වී ඇත. මෙම වැඩසටහන් තවදුරටත් විවිධාංගිකරණය කිරීමේ වැදගත්කම පර්යේෂණයෙන් අනාවරණය විය. ඉගෙනුම්කරුවන්ට සහාය වීමට අත්‍යවශ්‍ය කුසලතා පද්ධතියක් හඳුනා ගැනීමත්, පුස්තකාලය තුළ ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමත්, වෙනත් ආයතන සමග සම්බන්ධ වී වෘත්තීය අධ්‍යාපනයට හෝ නියත සුදුසුකම් අත්පත් කර ගැනීමට දායක වන පාඨමාලා සංවිධානය කිරිමත්, පාසල් සිසුන් සඳහා ගෙදර වැඩ සමාජ පිහිටුවීමත් පවත්නා තත්ත්වය තවදුරටත් සංවර්ධනය කර ගැනීමට ගත හැකි පියවර ලෙස දැක්විය හැකිය.

**ප්‍රමුඛ පද :** ඉගෙනුම, නොවිධිමත් අධ්‍යාපනය, මහජන පුස්තකාල

# සපුගස්කන්ද පිරිපහදු තාක්ෂණික පුස්තකාලයෙන් සපයනු ලබන තොරතුරු සේවා පිළිබඳ පාඨක සංජානනය

එම්. ඉනෝකා සජීවනී පෙරේරා[1]

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) 1961 අංක 28 දරන පනත මගින් දිවයින පුරා ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීම සඳහා ආරම්භ කරන ලදී. සපුගස්කන්ද තෙල් පිරිපහදුව 1969 අගෝස්තු මාසයේදී මෙහෙයුම් ආරම්භ කළ අතර, මුලින් දිනකට බොරතෙල් බැරල් 38000ක් සැකසූ අතර පසුව දිනකට බැරල් 50,000 දක්වා පුළුල් විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, පිරිපහදු අංශයේ තාක්ෂණික පුස්තකාලය 1971 දී ආරම්භ කරන ලද්දේ පිරිපහදුව සහ පර්යන්ත ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ අරමුණෙනි. ප්‍රමිති, පිරිපහදු අත්පොත්, තාක්ෂණික පොත් සහ අනෙකුත් අත්‍යවශ්‍ය සාහිත්‍ය සහ ද්‍රව්‍යවල විස්තීර්ණ එකතුවක් පුස්තකාලයේ ඇත. එහි අරමුණ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ වැඩ සහ පර්යේෂණ කටයුතු සඳහා සහාය වීමය. දැනට, පිරිපහදු තාක්ෂණික පුස්තකාලයේ පොත්, අත්පොත්, වාර සඟරා සහ ප්‍රමිති 5000කට වඩා ඇත. මෙම ද්‍රව්‍යවල අන්තර්ගතය මූලික වශයෙන් අවධානය යොමු කරන්නේ ඛනිජ තෙල් රසායනික ක්‍රියාවලි, යාන්ත්‍රික, විදුලි, සිවිල්, උපකරණ, පරීක්ෂණ, කළමනාකරණය, ආර්ථික විද්‍යාව, උපලේඛනගත කිරීම, ගින්න සහ ප්‍රවේශම වැනි ඉංජිනේරු විෂයන් කෙරෙහිය. මීට අමතරව, පුස්තකාල එකතුවට තෙල්/ගෑස් සහ පෙට්‍රෝලියම් කර්මාන්තයේ කීර්තිමත් සඟරා ගණනාවක් ඇතුළත් වේ. පර්යේෂණ ව්‍යාපෘති, වාර්තාවලට මෙම පුස්තකාල එකතුවෙන් ද ප්‍රවේශ විය හැකිය. තවද, පුස්තකාලය විවිධ විෂය ක්ෂේත්‍රවල අභ්‍යාසලාභීන්ට පහසුකම් සැලසීම සඳහා සිය සේවා පුළුල් කර ඇත. 2012 දී, පිරිපහදු පුස්තකාලය WINISIS මෘදුකාංගයෙන් නිර්මාණය කරන ලද දත්ත ගබඩාවකට දත්ත ඇතුළත් කිරීමෙන් එහි සූචිය ස්වයංක්‍රීය කිරීම ආරම්භ කළේය. 2020 දී, තාක්ෂණික පුස්තකාලය KOHA ඒකාබද්ධ පුස්තකාල පද්ධතිය භාවිත කරමින් පූර්ණ ස්වයංක්‍රීය පුස්තකාල පද්ධතියක් ස්ථාපනය කරන ලද අතර, වසර පනහකට ආසන්න කාලයක් තුළ එහි පුස්තකාල පද්ධතියේ පළමු වැදගත් යාවත්කාලීන කිරීම එමගින් සනිටුහන් කෙරිණි. විශේෂ පුස්තකාල යනු විශේෂිත පරිශීලක ප්‍රජාවන්ට සේවය කරන හෝ විශේෂිත විෂය අවධානය යොමු කරන තොරතුරු එකතුවකි. මෙම පුස්තකාල යම් ක්ෂේත්‍රයක් හෝ කර්මාන්තයක් තුළ වෘත්තිකයන්, පර්යේෂකයන් හෝ උද්යෝගිමත් අයගේ අවශ්‍යතා සපුරාලයි. ඒවා පොදු හෝ ශාස්ත්‍රීය පුස්තකාලවලට වඩා වෙනස් වන්නේ සේවාවන්හි නියත විෂය පථයක් ඇති බැවින්, හා විශේෂයෙන් ඔවුන්ගේ පරිශීලකයන්ගේ අද්විතීය අවශ්‍යතා සඳහා සකස් කර ඇති බැවිනි. පරිශීලක තෘප්තිය විශේෂ පුස්තකාලවල සේවා ගුණාත්මකභාවය

[1] පුස්තකාලයාධිපති, තාක්ෂණ පුස්තකාලය, පිරිපහදු කාර්යාංශය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
inokasp73@gmail.com

පිළිබඳ ප්‍රධාන දර්ශකයකි. සේවා ගුණාත්මකභාවය ඇගයීම විශේෂ පුස්තකාල පරිශීලකයන් සඳහා ඔවුන්ගේ සේවා වැඩිදියුණු කිරීම සඳහා වටිනා ප්‍රතිපෝෂණ ලබා දෙයි. පිරිපහදු පුස්තකාලය ප්‍රධාන වශයෙන් පර්යේෂණ හා විමර්ශන පුස්තකාලයක් වන අතර එය පිරිපහදුවේ යන්ත්‍රාගාරයේ සිදුවන බොරතෙල් පිරිපහදු ක්‍රියාවලියේදී සිදුවන තාක්ෂණික ගැටලු නිරාකරණය කර ගැනීමට තොරතුරු සපයනු ලබන මධ්‍යස්ථානය වේ. පිරිපහදු පුස්තකාලය දුර්ලභ හා සුවිශේෂී වටිනා ලේඛනවල සුවිශේෂී එකතුවකින් සමන්විත වන අතර ඒවායින් සමහරක් රහසිගත ස්වභාවයකින් යුක්ත වන බැවින් ප්‍රවේශ වීමට විශේෂ අවසරය අවශ්‍ය වේ. පුස්තකාලයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්තයට අදාළ තොරතුරු රැස්කිරීමයි. සේවා ගුණාත්මකබව පිළිබඳ වඩා වැඩි අවධානයක් යොමුවී ඇති මේ යුගයේ තම පුස්තකාලයේ සේවා ගැන සහ විවිධ තත්වයන් පිළිබඳ අගය කිරිම අත්‍යවශ්‍ය කරුණකි. පුස්තකාලයේ සේවකයන්, එකතුව සහ පුස්තකාලයේ බාහිර පහසුකම් යන මූලික සංරචක යටතේ සේවා ගුණාත්මක බව අගය කළ හැකිය.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු පුස්තකාලයෙන් සපයනු ලබන තොරතුරු සේවා කෙරෙහි පාඨක සංජානනය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම වේ. ඒ අනුව පිරිපහදු පුස්තකාලයේ සම්පත් එකතුවේ ස්වාභාවය පිළිබඳ පාඨක ප්‍රතිචාර අධ්‍යයනය කිරිම, සේවාවේ ගුණාත්මක මට්ටම වැඩිදියුණු කරන්නේ කෙසේද යන්න පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරිම, KOHA මෘදුකාංගය හරහා හඳුන්වාදුන් මාර්ගගත ප්‍රවේශන සූචිය හරහා තොරතුරු සමුද්ධරණය කිරිම පහසු වී ඇති දැයි සොයා බැලීම සිදු කරන ලදි. ප්‍රශ්නාවලියක් භාවිතයෙන් ප්‍රාථමික දත්ත රැස් කරන ලදී. අධ්‍යයනයේ ජනගහනය සමීක්ෂණ කාලය තුළ පිරිපහදු තාක්ෂණික පුස්තකාලය භාවිත කළ පරිශීලකයන් පිරිපහදුවේ විධායක සහ විධායක නොවන තාක්ෂණික කාර්ය මණ්ඩලය මෙන්ම පුහුණු දෙපාර්තමේන්තුවේ කාර්මික අභ්‍යාසලාභීන්ගෙන්ද ලියාපදිංචි පුස්තකාල සාමාජිකයින්ගෙන්ද සමන්විත විය. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් පුස්තකාලය මගින් සපයනු ලබන සේවා පිළිබඳ තෘප්තිමත් බව ප්‍රකාශ කළහ. නිකුතු මේසයේ කඩිනම් සේවාව ගැන ඔවුන් විශේෂයෙන් සතුටු විය. සමස්තයක් වශයෙන්, පරිශීලකයන්ට ඔවුන්ගේ ආචාරශීලී බව සහ උපකාරක බව පිළිබඳ ධනාත්මක ආකල්පයක් තිබුණි. කෙසේ වෙතත්, බොහෝ පරිශීලකයන් වාර්තා කළේ පුස්තකාලයේ ඇති පොත් එකතුව ඔවුන්ගේ අධ්‍යයන ක්ෂේත්‍ර සඳහා ප්‍රමාණවත් නොවන බවත්, පෙළපොත් සහ ප්‍රමිතිවල නවතම සංස්කරණයන්හි හිඟයක් පවතින බවත්ය.ප්‍රමාණවත් පර්යන්ත (Terminals) නොමැති වීම හේතුවෙන් බොහෝ පරිශීලකයන්ට පුස්තකාලයේ මාර්ගගත ප්‍රවේශ සූචිය වෙත ප්‍රවේශ වීමට නොහැකි බව පෙන්වා දී තිබුණි.ඔවුන් පුස්තකාලයේ ආසන, උෂ්ණත්වය සහ අවකාශය ගැන සෑහීමකට පත් නොවීය. පිරිපහදු පුස්තකාලයේ අනාගත සංවර්ධනය සඳහා පරිශීලකයන්ගේ වටිනා යෝජනා මත පුස්තකාලය සපයන සේවාවල ගුණත්වය තවදුරටත් වර්ධනය කළ හැකි වේ.

ප්‍රමුඛ පද : පරිශීලක තෘප්තිය, පරිශීලක සංජානනය, සේවා ගුණත්වය, තොරතුරු අවශ්‍යතා, පාඨක සේවා

# සීල මාතා අධ්‍යාපන ආයතනයන්හි ඉගෙනුම් ක්‍රියාවලිය සහ ඒවායේ පුස්තකාල භාවිතය

පූජ්‍ය ගෝණදෙණියේ තපස්සි හිමි[1]

සිල මාතා අධ්‍යාපන ආයතනය 2019 වර්ෂයේ දී රජයේ අනුමත ආයතන බවට පත් කෙරිණි. ශ්‍රී ලංකාව පුරා සීල මාතා අධ්‍යාපන ආයතන 11ක් පවතී. මෙම සෑම ආයතනයකම අවම වශයෙන් කුඩා පරිමාණයේ පුස්තකාලයක් හෝ පිහිටුවා තිබේ. මෙම සීල මාතා අධ්‍යාපන ආයතනවල ගිහි / පැවිදි සිසුවියන් පුස්තකාලය භාවිත කරනු ලබන අයුරු නිශ්චය කර ගැනීමත් පරිවේණාචාර්යවරියන් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පුස්තකාලය යොදා ගන්නා ආකාරය විමසීමත් පුස්තකාල භාරකරුවන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා දක්වන දායකත්වය අනාවරණය කර ගැනීමත් මෙම පර්යේෂණයේ අරමුණ වේ. සමීක්ෂණ ක්‍රමවේදයට අනුව බස්නාහිර පළාතේ සීල මාතා අධ්‍යාපන ආයතන 06ක ගිහි / පැවිදි ශිෂ්‍යාවන් 118ක් ද විෂයභාර ගිහි/පැවිදි පරිවේණාචාර්යවරියන් 40ක් ද පුස්තකාල භාරකරුවන් 06ක් ද නියැදිය ලෙස තෝරා ගන්නා ලදී. පරිවේණාචාර්යවරියන්ගෙන් සහ සිසුවියන්ගෙන් ප්‍රශ්නාවලියක් මගින් ද පුස්තකාල භාරකරුවන්ගෙන් ප්‍රශ්නාවලියක් සහ මාර්ගගත සම්මුඛ සාකච්ඡා මගින් ද දත්ත එක්රැස් කෙරිණි. මෙම ආයතනවල පුස්තකාල භාරව කටයුතු කරන්නන් හට පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ විධිමත් අවබෝධයක් නොමැති වූවද, ඔවුන් සැවොම අ. පො. ස. (උ. පෙ) හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලද්දෝ වෙති. මෙම ආයතනවල පූර්ණකාලීන පුස්තකාල භාරකරුවන් නොමැති අතර විෂයභාර පරිවේණාචාර්යවරියකු අර්ධ කාලීනව එහි සේවයේ යෙදී සිටි. එහෙයින් පුස්තකාල එකතුව විද්‍යාත්මකව සංවිධානය වීමක් දැකිය නොහැක. ඒ ඒ සීලමාතා අධ්‍යාපන ආයතන තමන්ට ආවේණික ආකාරයට එකතුව සංවිධානය කර තිබේ. මේ අනුව පුස්තකාලය සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතර ශක්තිමත් සබඳතාවක් දක්නට නොමැත. පරිවේණාචාර්යවරියන් වැඩි වශයෙන්ම (21%) පුස්තකාල පරිහරණය කරනු ලබන්නේ නිදහස් කාලඡේදවලදී වන අතර පංතිකාමර ඉගැන්වීම සඳහා පුස්තකාලයෙන් පොත් බැහැර ගෙන යාමට වැඩි රුචියක් දක්වයි. ඉගෙනුමේ දිගුව ලෙස පැවරුම් හෝ ව්‍යාපෘති සිසුවියන්ට ලබාදීමේ දී පුස්තකාල භාරකරු සමඟ පූර්ව සාකච්ඡාවක නියැලෙනුයේ 24%ක පිරිසකි. සිසුවියන්ගේ පුස්තකාල භාවිතය වැඩි වශයෙන් සිදු වන්නේ (65%) ඊට නියමිත කාලඡේදයේ දීය.

[1] නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්), අධ්‍යාපන අමාත්‍යාංශය
gthapassit66@gmail.com

එමෙන් බහුතරයකට (75%) පුස්තකාල එකතුව පිළිබඳ නිසි අවබෝධයක් නොමැති බව පෙනේ. තවද, පාඩමට අදාළ අතිරේක තොරතුරු පුස්තකාලයට ගොස් සොයා ගැනීමට උනන්දුවක් දක්වන්නේ සුළු පිරිසකි. (14%) බහුතරයක් (85%) පෙළපොත මත රඳා පැවතීමට යොමුව සිටිති. එහෙයින් අර්ධ කාලීනව පුස්තකාලවල කටයුතු කරන පරිවේණාචාර්යවරියන් සඳහා කෙටිකාලීන පුස්තකාල පුහුණුවක් ලබා දීමත් ගිහි/පැවිදි සිසුන් සඳහා තොරතුරු කුසලතා හා වැඩසටහන් පැවැත්වීමත් පුස්තකාලය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සමෝධානය කර ගන්නා ආකාරය පිළිබඳ විෂය භාර පරිවේණාචාර්යවරියන්ට දැනුවත්භාවයක් සැපයීමත් සීල මාතා අධ්‍යාපන ආයතන පුස්තකාල සඳහා පූර්ණකාලීන පුස්තකාලයාධිපතිනියන් පත් කිරීමත් මගින් සීල මාතා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වර්ධනය කර ගත හැකි වේ.

**ප්‍රමුඛ පද :** සීල මාතා අධ්‍යාපනය, පුස්තකාල භාවිතය, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, තොරතුරු කුසලතා

# මහජන පුස්තකාලයන්හි විමර්ශන අංශයේ ක්‍රියාකාරිත්වය වෙත පාඨක අධ්‍යාපනයේ බලපෑම (බණ්ඩාරවෙල මහජන පුස්තකාලය ඇසුරින්)

අයි. එන්. පොල්ගම්පොල[1]

මහජන පුස්තකාලයක් විසින් පාඨකයන්ට සපයනු ලබන සේවා අතරින් බැහැරදීමේ සේවාව සහ විමර්ශන සේවාව ප්‍රමුඛස්ථානයක් ගනී. මෙයින් විමර්ශන සේවාව පවත්වා ගෙන යාමේදී පුස්තකාල කාර්යමණ්ඩලයට එම ක්ෂේත්‍රය පිළිබඳ මනා අවබෝධයක් පැවතීමත් පාඨකයන්ට විමර්ශන මූලාශ්‍ර සහ සේවා පිළිබඳ දැනුවත්භාවයක් තිබීමත් අත්‍යවශ්‍ය කොන්දේසියක් වේ. විමර්ශන මූලාශ්‍ර අත්පත් කර ගැනීම සඳහා පුස්තකාලය විශාල පිරිවැයක් දරන හෙයින් එම මූලාශ්‍ර භාවිතය ඉහළ මට්ටමක පවත්වා ගෙන යාම එකී පිරිවැය සාධාරණීකරණය කිරීමක් වේ. ආචාර්ය එස්. ආර්. රංගනාදන් වැනි පුස්තකාල විද්‍යා ශාස්ත්‍රඥයන් විමර්ශන සේවාව පුස්තකාලයේ හදවත යැයි හඳුන්වන්නේ එහෙයිනි. මේ නිසා පුස්තකාලයක් තුළ විමර්ශන අංශයට සුවිශේෂ වැදගත්කමක් හිමි වේ. බැහැරදීමේ අංශයට සාපේක්ෂව විමර්ශන අංශයේ කාර්යක්ෂම හා ඵලදායි ක්‍රියාකාරිත්වය සඳහා පාඨක අධ්‍යාපනය තීරණාත්මක භූමිකාවක් ඉටු කරයි. බණ්ඩාරවෙල මහජන පුස්තකාලයේ විමර්ශන සේවා භාවිත කරන පාඨකයන් වෙත පුස්තකාල විසින් සපයනු ලබන පාඨක අධ්‍යාපන වැඩසටහන්වල මට්ටම විශ්ලේෂණය කිරීමත් මෙම පාඨක අධ්‍යාපනය සම්බන්ධයෙන් විමර්ශන අංශයේ කාර්යමණ්ඩලයේ දායකත්වය විමසීමත් මෙම අධ්‍යයනයේ අරමුණ වේ. පර්යේෂණයේ නියැදිය ලෙස අ. පො. ස. උසස් පෙළ සිසුන් විසිපස් දෙනෙකු (25) සහ පුස්තකාල විමර්ශන අංශයේ කාර්යමණ්ඩල සාමාජිකයන් තිදෙනෙකු යොදා ගැණිනි. දත්ත එක්රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ භාවිත කරන ලදී. මෙම නියැදියෙන් පාඨක අධ්‍යාපනය පිළිබඳ කිසියම් හෝ දැනුවත්භාවයකින් යුක්ත වූයේ 27%ක් පමණි. ඔවුන් අවම වශයෙන් පුස්තකාලය විසින් පවත්වන ලද පාඨක අධ්‍යාපන වැඩසටහන් එකකට හෝ සහභාගී වූ අය වේ. මෙම පාඨක අධ්‍යාපන වැඩසටහන් අතර විමර්ශන මූලාශ්‍ර හඳුන්වාදීම, තොරතුරු ගවේශණය සහ KOHA මෘදුකාංගය භාවිතය ප්‍රධාන ස්ථානයක් ගනී. මොවුන් වැඩි වශයෙන් ම පාඨක අධ්‍යාපනය ලබා ගනුයේ පෞද්ගලිකව ලබා ගන්නා උපදෙස් (20%) සහ තොරතුරු පුවරු (17%) මගිනි.

[1] පුස්තකාලයාධිපති, මහජන පුස්තකාලය, බණ්ඩාරවෙල
inpnilmini@gmail.com

කෙසේ වෙතත්, පුස්තකාලය විසින් සපයනු ලබන විද්‍යුත් විමර්ශන සේවා පිළිබඳ පාඨක අවබෝධය බොහෝවිට පහළ මට්ටමක පවතී. නියැදියෙන් 73%ක් ඒ පිළිබඳ දැනුවත්භාවයෙන් තොරය. විමර්ශන මූලශ්‍ර භාවිතයේදී පාඨකයන්ගේ වැඩි අවධානය විභාග ප්‍රශ්නෝත්තර (27%) සහ ශබ්දකෝෂ (24%) වෙත යොමුව ඇත. මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ මූලික කරුණක් ලෙස පොදු පාඨක අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම තවදුරටත් ඵලදායි නොවන බව පෙන්වා දිය හැකිය. පුස්තකාල පරිසරය පාඨකයන්ට ආගන්තුක වීම (27%), විමර්ශන මූලාශ්‍ර පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැතිකම (17%) සහ තොරතුරු ගවේෂණ ශිල්පක්‍රම පිළිබඳ අනවබෝධය (17%) විමර්ශන අංශයේ භාවිතය අඩුවීමට මූලික වශයෙන් හේතු වී ඇත. මේ නිසා පොදු පාඨක අධ්‍යාපන වැඩසටහන්වල සිට තොරතුරු සාක්ෂරතා වැඩසටහන් දක්වා පාඨක අධ්‍යාපනය පරිණාමය විය යුතු බව අවධාරණය කෙරේ. එමෙන් ම විශේෂිත වැඩසටහන් සම්පාදනය ද අත්‍යවශ්‍ය වේ. කාර්යමණ්ඩල සාමාජිකයන් සඳහා ද විමර්ශන පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ විධිමත් පුහුණුවක් සහ අවබෝධයක් ලබාදීමට පියවර ගැනීම ද වැදගත්ය. විමර්ශන ප්‍රශ්නවල ස්වභාවය, මූලාශ්‍රවල විවිධත්වය සහ විමර්ශන සම්මුඛ සාකච්ඡා වැනි අංග කෙරෙහි මෙහිදී අවධානය යොමු කළ යුතුය.

**ප්‍රමුඛ පද** : පාඨක අධ්‍යාපනය, විමර්ශන මූලාශ්‍ර, විමර්ශන අංශය, විමර්ශන පුස්තකාලයාධිපතිත්වය

# කථන ඉංග්‍රීසි භාෂාව ප්‍රවර්ධනයට කොළඹ මහජන පුස්තකාලයේ දායකත්වය (2022 - 2023 වසරේ පවත්වන ලද ඉංග්‍රීසි භාෂා ප්‍රවර්ධන වැඩසටහන ඇසුරින්)

පවිත්‍රා මධුවන්ති විජයවර්ධන[1]

ජීවිතකාලය පුරාවටම ඉගෙනීමේ අවස්ථා සඳහා පහසුකම් සපයන ආයතනයක් බවට වර්තමානය වන විට මහජන පුස්තකාල පරිණාමය වී ඇත. මහජන පුස්තකාල මඟින් සිදුකරනු ලබන "විස්තාරණීය සේවා" ඔස්සේ වර්තමානයට අවශ්‍ය වන සේවා සැපයීමට ලෝකය පුරා ඇති මහජන පුස්තකාල මේ වනවිට සමත් වී ඇත. කොළඹ මහජන පුස්තකාලය මඟින් සිදුකරනු ලබන විස්තාරණීය සේවා රැසකින් එකක් ලෙස "විවිධ භාෂා ප්‍රවර්ධනය සඳහා සිදුකෙරෙන වැඩසටහන්" පෙළ පෙන්වා දිය හැකිය. ඒ අනුව ඉංග්‍රීසි, කොරියානු, දෙමළ සහ පර්සියානු ලෙස භාෂා කිහිපයකටම අයත් පාඨමාලාවන් මෙම පුස්තකාලය මඟින් පවත්වනු ලැබේ. ඒ අතරින් දිගුකාලීන ව්‍යාපෘතියක් ලෙස "කථන ඉංග්‍රීසි පාඨමාලාව" (Spoken English @ CPL) 2022 වසරේ සිට අඛණ්ඩව අදියර කිහිපයකින් පවත්වාගෙන යනු ලැබේ. වයස අවුරුදු 10-18 අතර සහ අවුරුදු 18 ට වැඩි ලෙස කාණ්ඩ 05 කින් යුක්තව මෙම පාඨමාලා සකස් කර ඇත. මේ වන විට ස්වේච්ඡා ගුරුවරුන් 35 ක් පමණ සම්බන්ධ වී දැනුම නොමිලේම ලබාදීමට කටයුතු කර ඇත. සතියේ දින 05 ම ප්‍රධාන පුස්තකාලයේ සහ කිරුළපන ශාඛා පුස්තකාලයේ මෙම පාඨමාලා පවත්වනු ලැබේ. මෙම අධ්‍යයනයේ යෙදීමට හේතු වූ ගැටලුව ලෙස කථන ඉංග්‍රීසි පාඨමාලාවෙන් පාඨක ප්‍රජාවගේ කථන භාෂා හැකියාව ප්‍රවර්ධනයට පිටිවහලක් ලැබී තිබේද, එසේනම් එය අඛණ්ඩව පවත්වාගෙන යාම ප්‍රයෝජනවත් වේද? යන්න දැක්විය හැකිය. මෙම අධ්‍යයනයේ අරමුණු කිහිපයකි. එනම්, කොළඹ මහජන පුස්තකාලයේ ව්‍යාප්ති සේවාවක් ලෙස කරන මෙම වැඩසටහනේ සාර්ථකත්වය පිළිබඳ විග්‍රහයක් කිරීම, පාඨමාලාව හැදෑරීමෙන් පසු ඔවුන්ගේ ඉංග්‍රිසි කථන හැකියාව වර්ධනය වී ඇත්දැයි සමීක්ෂණය කිරීම සහ  මෙම පාඨමාලාව හදාරණ පාඨකයන්ගේ සහභාගීත්වය වර්ධනය සංඛ්‍යාත්මකව කෙසේ සිදුවී තිබේදැයි විශ්ලේෂණය කිරීමයි. සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලී මඟින් දත්ත එක්රැස් කරන ලදී.

[1] පුස්තකාලයාධිපති II, කොළඹ මහජන පුස්තකාලය
pavithramw@gmail.com

ඒ සඳහා යොදාගන්නා ලද්දේ 2022 වසරේ සිට 2023 වර්ෂය දක්වා කොළඹ මහජන පුස්තකාලය මඟින් පැවැත් වූ කථන ඉංග්‍රීසි පාඨමාලාවට සහභාගී වූ සිසුන්ගෙන් 50 ක නියැදියකි. මෙම පාඨමාලාව හැදෑරීමේ ප්‍රයෝජන, එය ඉංග්‍රීසි කථාකිරීම වර්ධනයට කොපමණ උපකාරී වී තිබේ ද, පාඨමාලා අන්තර්ගතයේ වඩාත්ම කැමති පන්ති ක්‍රියාකාරකම කුමක්ද, භාෂාව තවදුරටත් වර්ධනය කිරීමට කරන යෝජනාවන් මොනවාද, වාර විභාග ලකුණු වර්ධනය වීමට ප්‍රමාණාත්මකව එය කොතරම් බලපා තිබේද සහ මෙම පාඨමාලාවේ තවත් වැඩිදියුණු විය යුතු යැයි ඔවුන් කරන යෝජනා මොනවාද ආදී ලෙස ප්‍රශ්න 10 කින් යුතුව ප්‍රශ්නාවලියක් ලබා දී දත්ත සංඛ්‍යාත්මකව විග්‍රහ කරන ලදී. ඒ අනුව 100% ක්ම දරුවන් තමන්ට මෙම පාඨමාලාව කථන ඉංග්‍රීසි හැකියාව වර්ධනයට ප්‍රයෝජනවත් වූ බව දක්වා ඇත. තමන්ට දෛනිකව ඉංග්‍රීසි භාෂාව කථා කිරීමේදී මෙම පාඨමාලාව මහඟු උපකාරයක් වන බව 90% ක්ම පෙන්වා දී ඇත. පන්ති ක්‍රියාකාරක්ම්වලින් විවිධ ක්‍රීඩාවල යෙදීම, වීඩියෝ හා චිත්‍රපට නරඹමින් ඒ පිළිබඳ සංවාදයේ යෙදීම, විවිධ මාතෘකා ඔස්සේ ක්ෂණිකව කථා කිරීමට අවස්ථාව සැලසීම, විවාද පැවැත්වීම, භූමිකා රංග ක්‍රියාකාරකම්වල යෙදීම වැනි කරුණු පාඨමාලාවේ ප්‍රයෝජනවත්ම කොටස් බව 85% ක්ම දක්වා ඇත. එසේම වාර විභාග ලකුණුවල ප්‍රමාණාත්මක වර්ධනයට 95% ක්ම මෙම පාඨමාලාව උපකාරී වූ බව ද සඳහන් කර ඇත. එසේම පුස්තකාල කාර්යය මණ්ඩලයේ සේවයේ නියුතු මෙම පාඨමාලාව හැදෑරූ පිරිසකගේ ඉංග්‍රීසි හැසිරවීමේ ශක්‍යතාව සාධනීයව වර්ධනය වී තිබෙන බව සම්මුඛ සාකච්ඡා ඔස්සේ හඳුනාගත හැකි විය. මේ අනුව නිගමනය කළ හැක්කේ කොළඹ මහජන පුස්තකාලය මඟින් පවත්වාගෙන යනු ලබන කථන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව භාෂා ප්‍රවර්ධනයට සෘජුවම පිටිවහලක් වී ඇති බවයි. පාසල් දරුවන්ට මෙන්ම රැකියාවේ යෙදී සිටින වැඩිහිටියන්ට පවා මෙම දැනුම ධනාත්මක වශයෙන් ඔවුන්ගේ ජීවිතය ජයගැනීමට රුකුලක් වී ඇති බව තොරතුරු අධ්‍යයනය කිරීමෙන් පෙනී යයි. එම නිසා මෙම කථන ඉංග්‍රීසි පාඨමාලාව අඛණ්ඩව පවත්වාගෙන යාම ප්‍රයෝජනවත් වේ. අධ්‍යයනය අවසානයේ යෝජනා කිහිපයක් සඳහන් කළ යුතුමය. ඒ අනුව මහජන පුස්තකාල සඳහා පාඨක පිරිස වර්ධනය කර ගැනීමට නවීන ලෝකයට අත්‍යවශ්‍ය වන වෙනත් භාෂා (උදාඃ චීන, ජපන්, මැන්ඩරින්) ඉගැන්වීමට අවස්ථාව සලසා දීම සුදුසු වේ. එසේම පාඨමාලා අවසානයේ යෝග්‍යතා විභාගයක් හරහා සහතික ලබාදීම, ප්‍රශ්නාවලියක් නිසියාකාරව සකසා ශිෂ්‍යයන්ට මෙන්ම දෙමාපියන්ට ලබාදීම, පාඨමාලාව හැදෑරූ සිසුන් පිළිබඳ පසුවිපරමක් කිරීම ද සුදුසුය.

**මූලික පදඃ** මහජන පුස්තකාල, කොළඹ මහජන පුස්තකාලය, ඉංග්‍රීසි භාෂාව, භාෂා ප්‍රවර්ධනය

# කොළඹ මහජන පුස්තකාලයේ තොරතුරු සම්පත් හා සේවා පිළිබඳ පාඨක තෘප්තිය විමසීමක්

හිමාෂි අල්විස්[1]

ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල අතරින් පැරණිතම සහ ප්‍රමුඛතම පුස්තකාලය ලෙස කොළඹ මහජන පුස්තකාලය හැඳින්විය හැකිය. කොළඹ මහා නගර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ට පමණක් නොව පාසල් හා විශ්වවිද්‍යාල සිසුන්ටත් පර්යේෂකයන්ටත් ශ්‍රී ලංකාවේ ඕනෑම පුරවැසියෙකුටත් එහි සාමාජිකත්වය ලබා ගැනීමට පුළුවන. එමෙන්ම විදේශිකයන්ට ද පොත් පත් පරිශීලනයට අවසර තිබේ. එය මෙරට බොහෝ මහජන පුස්තකාලවල සාමාජිකත්වය ලබා ගැනීමේදී පවත්නා නීතිරීතිවලට වඩා වෙනස් තත්ත්වයකි. මෙම පුස්තකාලය පාඨකයන් වෙත පරිශ්‍රය තුළ මෙන්ම පරිශ්‍රයෙන් පිටත ද විවිධ තොරතුරු සේවා සපයන අතර ශ්‍රවණාගාර, නවීන කියවීම් ශාලා, ආපන ශාලා, යනාදී පහසුකම්වලින් ද සමන්විත වේ. කොළඹ මහජන පුස්තකාලය සතු තොරතුරු සම්පත් සහ එමගින් සපයන සේවා පිළිබඳ පාඨක තෘප්තිය විමසීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. මෙම අධ්‍යයනය සඳහා සමීක්ෂණ ක්‍රමවේදය භාවිත කරන ලද අතර මහජන පුස්තකාලයේ අංශ හතක (07) පාඨකයන් 300ක් සරල අහඹු නියැදියක් ලෙස තෝරා ගන්නා ලදී. මෙහිදී නියැදියෙන් 95%ක් පුස්තකාලයේ සම්පත් හා සේවා පිළිබඳ තෘප්තියකින් පසුවන බව අනාවරණය විය. විශේෂයෙන් බැහැර දෙන අංශයේ සහ ළමා පුස්තකාලයේ සේවා කෙරෙහි ඔවුන්ගේ තෘප්තිය ඉහළ මට්ටමක පැවතිණි. පාඨකයන් පුස්තකාලයට පැමිණෙන කාල අන්තරය ද පාඨක තෘප්තිය පිළිබඳ මිනුම් දණ්ඩක් වේ. දත්ත විශ්ලේෂණයට අනුව නියැදියෙන් බහුතරයක් (63%) සතියකට වරක් පුස්තකාලයට පැමිණෙති. මෙයට අමතරව 22%ක් මසකට වරක් පුස්තකාලයේ සේවා ලබා ගනිති. තවද, කාර්යමණ්ඩලයේ ප්‍රවීණත්වය සහ සත්කාරක බව පාඨක තෘප්තිය රඳා පවත්නා තවත් සාධකයක් වේ. නියැදියෙන් 80% මෙම සාධකය සම්බන්ධයෙන් සාධනීය ප්‍රතිචාර දක්වා ඇත. පුස්තකාල කටයුතු ස්වයංක්‍රීයකරණය මගින් පාඨක සේවා කාර්යක්ෂම කිරීම පාඨක තෘප්තියට බලපාන තවත් නිර්ණායකයකි. මෙහිදී මාර්ගගත පොදු ප්‍රවේශකසූචිය (OPAC) ප්‍රධාන ස්ථානයක් ගනී. ප්‍රතිචාරිකයන්ගෙන් 55%ක් මේ පිළිබඳ තෘප්තියකින් පසු විය. අධ්‍යයනයෙන් අනාවරණය වූ කරුණු අනුව පාඨක තෘප්තිය සතුටුදායක මට්ටමක පැවතියද එය තිරසර ලෙස පවත්වා ගෙන යාමට ගත යුතු පියවර පවති. මාර්ගගත පොදු ප්‍රවේශයක සූචිය භාවිතය පිළිබඳ පාඨක දැනුවත්භාවය තවදුරටත්

[1] පුස්තකාල සහකාර, කොළඹ මහජන පුස්තකාලය
himashi1993nuwanthika@gmail.com

වර්ධනය කිරීමට කටයුතු කිරීමත් විෂයානුබද්ධ කෘති එකතුව යාවත්කාලීන කිරීමත්, පුස්තකාලයෙන් සපයන තොරතුරු සේවා සහ පුස්තකාල එකතුවේ පවත්නා සම්පත් ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් දියත් කිරීමත් මෙම පියවර අතර ප්‍රධාන වේ.

**ප්‍රමුඛ පද** : මහජන පුස්තකාලය, තොරතුරු සම්පත්, තොරතුරු සේවා, පාඨක තෘප්තිය

# Technical Session - 02

**Track : Library Management and Extension Services**

| | | |
|---|---|---|
| **Session Chair** | **:** | Dr. Udaya Cabral<br>Assistant Director<br>National Library and Documentation Services Board, Colombo 07 |
| **Rapporteur** | **:** | Mrs. Harshani Hapuarachchi<br>Librarian III<br>S. W. R. D. Bandaranaike Centenary Public Library<br>Udugampala |

# තොග සත්‍යාපනය පිළිබඳ අධ්‍යයනයක් (කොළඹ මහජන පුස්තකාලය ඇසුරින්)

එන්.ජී.ගයානි නිරංජලා[1]
ස්ටැන්ලි ගුණවර්ධන[2]

ලෝකයේ සෑම රටකම පාහේ පුළුල්ව ව්‍යාප්තව ඇති පුස්තකාල පද්ධතියක් ලෙස මහජන පුස්තකාල හැඳින්විය හැකිය. මහජන පුස්තකාලය යනු වයස, අධ්‍යාපන මට්ටම, සමාජ තත්ත්වය හා ජාති,භාෂා,ආගම් යනාදී කිසිදු භේදයකින් තොරව සමාජයේ ඕනෑම තරාතිරමක පුද්ගලයන්ට සේවාව සපයන සමාජ ආයතනයකි. ඒ අනුව යමින් 1925 ආරම්භ වූ කොළඹ මහජන පුස්තකාලය විශේෂ ශ්‍රේණියේ පුස්තකාලයක් ලෙස බැහරදෙන අංශය, ළමා අංශය, විමර්ශන අංශය, විශේෂ විමර්ශන අංශය, පුවත්පත් අංශය, වාර සඟරා අංශය, කොරියානු කවුළුව, ජපන් කවුළුව, ජංගම පුස්තකාලය, පොත් පෙට්ටි ව්‍යාපෘතිය යනාදී අංශ ගණනාවකින් සහ ශාඛා පුස්තකාල 12කින් සමන්විතව සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම ලක්ෂ තුනකට (3,000,000) අධික පොත් එකතුවක් සහිත පුස්තකාලයකි. 2015 වසරේ සිට කොහා (KOHA) දත්ත පද්ධතිය ඔස්සේ පුස්තකාල තොරතුරු ස්වයංක්‍රීයකරණය කොට ඇති අතර, පොත් මිලදී ගැනීම සඳහා කොළඹ මහා නගර සභාව විසින් වාර්ෂිකව මිලියන 13 කට ආසන්න මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලබයි.

මෙම පුස්තකාලය ආරම්භ කර වසර සියයකට (100) ආසන්න කාලයක් ගත වුවද, මෙහි එකතුව මෙතෙක් පුනරාවර්තන වියදම් යටතේ පැවති අතර, 2023 වසරේ සිට එය ප්‍රාග්ධන වැය ශීර්ෂය යටතට ගත් බැවින් තොග සත්‍යාපනය සිදු කළ යුතු විය. ඒ අනුව 2023/12/31 දිනට කොළඹ මහජන පුස්තකාලය සතු පොත් තොගය සහ එහි වටිනාකම ගණනය කිරීම සඳහා ආයතනික විගණන හා කළමණාකරණ කමිටුව සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අදියර කිහිපයක් යටතේ තොග සත්‍යාපනය සිදු කිරීමට තීරණය විය. මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වූයේ කොළඹ මහජන පුස්තකාලය සතු පොත් තොගය සහ එහි වටිනාකම පිළිබඳ අධ්‍යයනය කිරීමේදී මතුවන ගැටලු හඳුනා ගැනීම සහ මෙවන් විශාල එකතුවක් පවතින සෙසු පුස්තකාලවලටද පූර්වාදර්ශයක් වෙමින් එම පුස්තකාල සඳහා තොග සත්‍යාපනය කිරීමේ පහසු ක්‍රමවේදයක් හඳුන්වා දීමයි.
පර්යේෂණ ක්‍රමවේදය ලෙස සිද්ධි අධ්‍යයන ක්‍රමය භාවිත කරන ලදී. පරිග්‍රහණ ලේඛනය අනුව ඇති පොත් ගණන සහ කොහා දත්ත පද්ධතිය අනුව ඇති පොත්වල පරස්පරයක් තිබේදැයි විමසා බැලිනි. එමෙන්ම වාර්ෂික වැය ශීර්ෂයද අධ්‍යයනය කරන ලද අතර, ඒ අනුව පොත් රාක්කයෙන් පොත් එකින් එක ලබාගන්නා දත්ත සහ කොහා දත්ත පද්ධතිය ඔස්සේ ලබා ගන්නා ලද දත්ත

[1] පුස්තකාලයාධිපති III, කොළඹ මහජන පුස්තකාලය
gayaniniranjala23@yahoo.com

[2] පුස්තකාලයාධිපති අධිශ්‍රේණිය, කොළඹ මහජන පුස්තකාලය

පැතුරුම්පත්වලට ඇතුළත් කර එම තොරතුරු හා සංසන්දනය කරමින් තොග සත්‍යාපනය සිදු කරන ලදී. ඒ සඳහා තිදෙනකුගෙන් යුත් සංගණන කමිටු 10 ක් සහ අධීක්ෂණ නිලධාරීන් දෙදෙනෙකු ද පත්කළ අතර, බැහැරදෙන අංශයේ පොත් ප්‍රමාණය විශාල බැවින් කමිටු 7 ක්ද සෙසු අංශ සඳහා කමිටු 1 බැගින් යෙදවීමට තීරණය විය. ඩිවි දශම වර්ගීකරණය අනුව 000-900 දක්වා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයේම ග්‍රන්ථ මේ සඳහා අන්තර්ගතය. එහි පළමු අදියර යටතේ බැහැරදෙන අංශය, ළමා අංශය, විමර්ශන අංශය සහ විශේෂ විමර්ශන අංශය යොදා ගත් අතර, 2 අදියර යටතේ ශාඛා පුස්තකාල සහ ජංගම පුස්තකාල යොදා ගැනීමට නියමිතය. තොග සත්‍යාපනය සිදු කිරීමේදී පොත් එකතුව විශාල බැවින් එය සිදුකරන්නේ කෙසේද යන්න පුස්තකාලයාධිපතිවරුන්ට විශාල අභියෝග යක් විය. තවද, පුස්තකාලය සති 5 ක පමණ කාලයක් වසා තැබීම හේතුවෙන් පාඨකයන්ගෙන් විවිධ චෝදනා හා මැසිවිලි එල්ල වීම, කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවීම හා තොග සත්‍යාපනය පිළිබඳ අත්දැකීම් අවම වීම යනාදිය අනෙකුත් ගැටලු විය. එමෙන්ම කොහා දත්ත පද්ධතිය සමග සූචියේ දත්ත නොගැලපීම යනාදී ගැටලු ඇති විය. එමෙන්ම ප්‍රවේශ අංක වැරදී තිබීම නිසා පරිග්‍රහණ ලේඛනය සමග සංසන්දනය කර සූචිය නිවැරදි කිරීමට සිදු විය.

තොග සත්‍යාපනයේ ප්‍රතිඵල ලෙස වර්තමානයේ පවත්නා තොගය හඳුනා ගැනීම, (000-900) රාක්ක ලැයිස්තුව නිවැරදි කර ගැනීමට හැකි වීම, අතිරේක පිටපත් සංඛ්‍යාවක් සහිත ග්‍රන්ථ සහ අභාවිත ග්‍රන්ථ ඉවත් කිරීමේ නිර්ණායකවලට අනුව එකතුවෙන් ඉවත් කිරීමට හැකිවීම, අලුත්වැඩියා කළ යුතු ග්‍රන්ථ හඳුනාගත හැකි වීම, සූචිකරණය දත්ත පද්ධතිය නිවැරදි කරගත හැකි වීම, සංගණනය කරන විට බැහැරට ගෙන ගොස් තිබූ පොත් ප්‍රමාණය දැන ගැනීමට හැකි වීම යනාදිය දැක්විය හැක. එමෙන්ම තොග සත්‍යාපනය තුළින් බැහැරදෙන අංශය, ළමා අංශය, විමර්ශන අංශය හා විශේෂ විමර්ශන අංශයන්හි මූලික තොගය හඳුනාගත හැකි විය. ඩිවි 000-900 වර්ග පන්ති අනුව වර්තමාන තොගය බෙදී ඇති ආකාරය පිළිබඳ නිශ්චිත අවබෝධයක් ලබා ගත හැකි විය. පාඨක රුචිකත්වය වැඩි ග්‍රන්ථ හඳුනාගත හැකි වීම සහ ඉදිරියේදී ප්‍රමුඛත්වය දියයුතු ක්ෂේත්‍ර හඳුනා ගත හැකිවිය. විශාල අභියෝග මධ්‍යයේ වුවද කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව නිසා සංගණනයට ඇස්තමේන්තුගත කාලයෙන් සතියකට පෙර අවසන් වූ බැවින් කොහා දත්ත පද්ධතියේ නවතම සංස්කරණය යාවත්කාලීන කරගත හැකි වියත් ඒ අනුව පුස්තකාල එකතුව විධිමත් කිරීම තුළින් ප්‍රශස්ථ පාඨක සේවාවක් ලබා දීමටත් හැකියාව ලැබිණි.

පුස්තකාලය විසින් මෙතෙක් මිලදී ගෙන ඇති පොත් තොගය හඳුනා ගත්තද, නිශ්චිතව මෙය ආරම්භයේ සිට පැවති තොගය ලෙස අනුමාන කළ නොහැකි නමුත්, 2023/12/31 වන දිනට පවතින මෙම තොගය භෞතිකව නිවැරදි තොගය ලෙස සලකා ඉදිරි සංගණන කටයුතු සඳහා මෙම තොගය පිළිගැනීමත්, පුස්තකාලය සඳහා වාර්ෂිකව විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් බැවින් සහ වාර්ෂිකව තොගයට විශාල පොත් ප්‍රමාණයක් එකතු වන බැවින් පුස්තකාලය වසර 5 කට වරක් නියැදි පරීක්ෂණයක් මගින් තොග සත්‍යාපනය සිදු කිරීමත් සුදුසු බව යෝජනා කෙරේ.

**ප්‍රමුඛ පදඃ** මහජන පුස්තකාල, පුස්තකාල එකතුව, තොග සත්‍යාපනය

# The IFLA library map of the world: review of the SDG success stories

Teckla Chandani Silva[1]

The Library Map of the World (LMW) is a statistical tool developed in 2017 by the International Federation of Library Associations (IFLA) to collect and visualize basic library statistics. Among the tools used for the LMW, the Sustainable Development Goals (SDG) Success Stories section aims to serve as the unifying platform, providing access to SDG stories that demonstrate how libraries in different countries contribute to the United Nations SDGs and develop strategies to achieve SDGs while addressing local development needs. The ultimate objective of the tool is to secure access to information, contribute to improved outcomes across all the SDGs, and share knowledge among nations. As a developing nation in the Asian region, with the leadership of the National Library of Sri Lanka, libraries and information professionals are working on the 2030 agenda. However, there is a lack of evidence on how the libraries are achieving the SDGs with their existing resources. The four objectives of this study are (i) to identify the main SDGs achieved and addressed by the libraries; (ii) to determine how libraries are taking action to achieve the SDGs in different regions; (iii) to determine what strategies they have used to achieve their set goals towards the SDGs; and (iv) to determine how they communicate and share knowledge among the libraries of the nations. Further, it is expected that the findings of the study will be helpful to make libraries and information professionals aware of IFLA LMW and SDGs and identify the strategies nations used to achieve the SDGs with the existing resources of the countries. The findings of the study and the identified strategies through success stories could be useful to improve the service of libraries and Information professionals in the Sri Lankan context. Desk research methods on qualitative data analysis together with case study research methodology used in the study.

[1] Publications and Publicity Officer, Tea Research Institute of Sri Lanka, Talawakelle
tecklawh05@gmail.com

The qualitative secondary data sources published data on the LMW webpage and 58 success stories were used. both quantitative and qualitative data used for the analysis and the thematic analysis method used to analyse the case studies. Tabulations and graphs were used to present the data. 14 success stories representing the Asian and Eurasian regions in nine countries were used for the analysis. SDG No. 04: Quality Education; SDG No. 17: Partnership for the Goals; and SDG No. 10: Reduced Inequalities are the highly prioritized three SDGs addressed. Out of 14 countries, five addressed the five SDGs and shared their success stories. Nine countries approached the community and improve the reading habits of the children. Community reading projects, improving learning skills through online educational programs, developing skills in digitalizing, and modernizing library spaces are the key areas addressed by the countries of the Asian and Eurasian regions. The results imply that the libraries are more focusing on the children's engagement and improving their reading habits together community reading programmes. the south east Asian countries facilitating digitalized online learning environment; which indicate that libraries engagement in achieving SDG No. 04. The libraries in the Asian region are required to improve the library services to achieve the SDGs in innovative ways and means going beyond the traditional strategies used by the libraries and Information professionals.

**Keywords:** SDGs, IFLA, Library Map of the World, Sustainable Strategies, Libraries, Asia and Eurasia countries

# තිරසර සංවර්ධන ඉලක්ක සාධනයෙහිලා 2022 සහ 2023 වර්ෂවල කොළඹ මහජන පුස්තකාලයෙන් ක්‍රියාත්මක කරන ලද ව්‍යාප්ති සේවා පිළිබඳ අධ්‍යයනයක්

ආර්.කේ. පූර්නිමා පියෝමි[1]

මහජන පුස්තකාල සුවිශේෂ වන්නේ විවිධ වයස් මට්ටම් නියෝජනය වන ජන වර්ග සඳහා සේවා සපයන ග්‍රාමීය පරිසරයේ සිට නාගරික පරිසරය දක්වා වර්ධිත සේවා සැපයුම් මධ්‍යස්ථානයක් වශයෙනි. මහජන පුස්තකාල අතරින් වසර 100කට ආසන්න අතීතයක් ඇති දෙස් විදෙස් ආකර්ශනය දිනාගත් ක්‍රියාශීලි ආයතනයක් ලෙස සම්භාවනාවට පාත්‍ර කොළඹ මහජන පුස්තකාලය පර්යේෂකයා විසින් සිය අධ්‍යයනය සඳහා පාදක කර ගෙන ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ කොළඹ මහජන පුස්තකාලය විසින් සිදු කරන ලද ව්‍යාප්ති සේවා වර්ග කර හඳුනාගැනීමත්, එම සේවා තිරසර සංවර්ධන ඉලක්ක සඳහා දායකවේද යන්න පිළිබඳ විමර්ශනය කිරීමයි. ප්‍රාථමික දත්ත රැස් කිරීමට කොළඹ මහජන පුස්තකාලයේ ප්‍රධාන පුස්තකාලයාධිපති, වැඩිහිටි බැහැරදීමේ අංශයේ සහ ළමා පුස්තකාලයේ පුස්තකාලයාධිපතිවරුන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. ද්විතියික දත්ත රැස් කිරීමට පුස්තකාලය විසින් පවත්වාගෙන යනු ලබන නෛතික ලේඛන භාවිත කෙරිණි. ඒ සඳහා 2022 සහ 2023 වර්ෂයන්ගේ ක්‍රියාකාරි සැලැස්ම, වාර්ෂික ප්‍රගති සමාලෝචනය, පාලන වාර්තා වැඩසටහන්වල අදාළ වෙනත් ලේඛන පරිශීලනය කෙරිණි. ප්‍රාථමික දත්ත විශ්ලේෂණයේ දී එම නිලධාරීන් තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ අවබෝධයක් ලබා ගෙන ඇති බවත්, ඔවුන් ව්‍යාප්ති සේවා සැපයීමේ දී නිරන්තර අවධානයෙන් කටයුතු කළ ඇති බවත් නිරීක්ෂණය විය. එසේ ම තිරසර සංවර්ධන ඉලක්ක පමණක් නොව, කියවීම් රුචිය වර්ධනය සඳහා ද ජාතික කියවීමේ මාසය මූලික කරගත් වැඩසටහන් ද නිරීක්ෂණය විය. කොළඹ මහජන පුස්තකාලය මූලික කරමින් වෙනත් අධ්‍යයන ආයතනයන්හි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සිදු කරනු ලබන පර්යේෂණ මගින් ප්‍රතිපෝෂණය ලබා ගැනිම තුළින් ගුණාත්මක වු සේවාවක් ලබා දීමටත්, එයට තිරසර සංවර්ධන ඉලක්ක හා මහජන පුස්තකාල ප්‍රඥප්තිය මූලික කර ගැනීමටත් හැකි වේ. ද්විතීයික දත්ත අනුව ව්‍යාප්ති සේවා පහත පරිදි වර්ග කර දැක්විය හැකිය.

[1] පුස්තකාල සහකාර III, කොළඹ මහජන පුස්තකාලය
poornimaranawaka@gmail.com

එනම්, ගෝලීය පරිසර වැඩසටහන්, විවිධ භාෂා වැඩසටහන්, කෘෂිකර්මාන්ත පිළිබඳ වැඩසටහන්, නවෝත්පාදන වැඩසටහන්, ජාත්‍යන්තර දින සැමරීම, ජාතික වශයෙන් වැදගත් දින සැමරීම, කාන්තා ව්‍යවසායකයන් සවිබල ගැන්වීම, කියවීම් ප්‍රවර්ධන වැඩසටහන්, සෞඛ්‍ය වැඩසටහන්, අධ්‍යාපනික වැඩසටහන්, කුසලතා සංවර්ධන වැඩසටහන් සහ පාඨක ඉල්ලීම් අනුව සිදු කරන ලබන විශේෂ වැඩසටහන් වශයෙනි. මේ සඳහා සහභාගී වු පිරිස අතරින් 75% ම වයස අවුරුදු 14 ට අඩු දරුවන් වීම විශේෂත්වයකි. තවද, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 10% පමණ ප්‍රතිශතයකුත්, අනෙකුත් වයස් මට්ටම් සියල්ල ම ඉතිරි 15% නියෝජනය කරයි. එසේම ඉහත සඳහන් වැඩසටහන් මාතෘකා තිරසර සංවර්ධනය ඉලක්ක බොහෝ දුරට ආවරණය කරමින් සිදු කර ඇති බව දත්ත විශ්ලේෂණයේදී හඳුනා ගැනිමට හැකි විය. මෙම ව්‍යාප්ති සේවාවන්ගේ අතුරු ප්‍රතිඵලයක් ලෙස ලේඛන විමර්ශනයේ දී නව සාමාජිකත්වයන් ක්‍රමයෙන් වර්ධනය වන බව නිරීක්ෂණය විය. ඉහත සඳහන් කරන ලද ව්‍යාප්ති සේවා තිරසර සංවර්ධන ඉලක්කවල SDG 1,2,3,4,5, 8,9,10,12,14, සහ 17 යනාදියට දායකවන බවත්, අද වන විට රටේ පවතින ආර්ථිකය නඟා සිටුවිමට අවශ්‍ය මූලික සහායක් කොළඹ මහජන පුස්තකාලය මගින් සිදු කරනු ලබන ව්‍යාප්ති සේවා තුළින් ලැබෙන බවත් අනාවරණය වේ. මෙහි ඇති සුවිශේෂ කරුණක් වන්නේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ වයස අවුරුදු 14 ට අඩු දරුවන් මෙම සේවා සඳහා යොමු වීම මගින් ශ්‍රී ලංකාවේ අනාගතයට දැනුමෙන් මෙන්ම පරිසර හිතකාමී, පවතින සම්පත් තිරසර පරිභෝජනයට හුරුවු පිරිසක් බිහිවිමට පසුබිමක් සැලසීමයි. ඒ අනුව කොළඹ මහජන පුස්තකාලය මගින් සිදුකරනු ලබන ව්‍යාප්ති සේවා ඵලදායි බවත්, ඒවා තිරසර සංවර්ධන ඉලක්ක කරා තම පාඨකයන් රැගෙන යන බවත්, ඒ තුළින් රටේ සංවර්ධනය බිම් මට්ටමින් දායකත්වයක් ලබා දිමට ඔවුන්ට හැකි වි ඇති බවත් නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද :** තිරසර සංවර්ධන ඉලක්ක, මහජන පුස්තකාලය, ව්‍යාප්ති සේවා

# ආපදා සමයක දී පුස්තකාල සම්පත් සංරක්ෂණයේ වැදගත්කම

ප්‍රියදර්ශනී හේමකුමාර[1]

හදිසි ආපදා තත්ත්වයන් ඇති වීම පිළිබඳ නිදසුන් ලෝක ඉතිහාසයේ අප්‍රමාණව දක්නට ලැබේ. මෙම හදිසි ආපදා අතරින් බොහොමයක් ස්වාභාවික පරිසරයේ හට ගන්නා අසාමාන්‍ය සංසිද්ධිවල ප්‍රතිඵලයකි. මෙම ස්වාභාවික හදිසි ආපදා පුරෝකථනය කළ හැකි දැනුමක් සහ තාක්ෂණික හැකියාවක් වර්තමාන ලෝකය සතුය. ලොව පුරා පුස්තකාල මෙවන් තත්ත්වයන්ට මුහුණ දීමට ආපදා කළමනාකරණ සැලසුම් සම්පාදනය කර ඇත. එහෙත් 2021 වසරේ ලොව පුරා පැතිර ගිය කොවිඩ් 19 වැනි වසංගත තත්ත්ව එවන් පුරෝකථනාත්මක බවින් දුරස්ථය. ශ්‍රී ලංකාවේ පුස්තකාලවලට ද එය මෑත ඉතිහාසය තුළ නොවූ විරූ අත්දැකීමක් විය. විශේෂයෙන් කඩදාසි පරිහරණයට පැවති සීමා හේතු කොට ගෙන පුස්තකාල මාස ගණනාවක් විවෘත නොකර තැබීමට සිදු විය. මෙහි අනිවාර්ය ප්‍රතිඵලය වූයේ පුස්තකාල ද්‍රව්‍යවලට අදාළ සංරක්ෂණ ගැටලු රැසක් මතු වීමය. මේ පිළිබඳ ප්‍රකාශිත පර්යේෂණ සාහිත්‍යයෙන් ද පෙනී යන්නේ කොවිඩ් 19 වැනි දැවැන්ත ගෝලීය වසංගතයකට මුහුණදීම සඳහා පුස්තකාලවලට විධිමත් පෙර සූදානමක් පැවතී නොමැති බවයි. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ මෙවන් අනපේක්ෂිත වසංගත තත්ත්වයක් හමුවේ දිගු කාලයක් වසා තැබීමට සිදුවීම හේතුවෙන් පුස්තකාල සම්පත්වලට සිදුවන හානිය සහ ඒ සමඟ මතුවන සංරක්ෂණ ගැටලු විමසා බැලීම වේ. මෙහි පර්යේෂණ ස්ථානය ලෙස ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ පුස්තකාලය භාවිත කර ඇත. මෙහිදී සිද්ධි අධ්‍යයන පර්යේෂණ ක්‍රමවේදය ව්‍යවහාර කරන ලද අතර ස්ථානීය නිරීක්ෂණය මගින් දත්ත එක්රැස් කෙරිණි. මෙම තත්ත්වය නිසා පුස්තකාල උපකරණවලට මෙන්ම පුස්තකාල ද්‍රව්‍යවලට විවිධ මට්ටමේ හානි සිදු වී තිබිණි. විශේෂයෙන් මාස කීපයක් පුස්තකාලය නිසි ආලෝක තත්ත්වයක් යටතේ නොපැවතීම නිසා කෘමි හානි වඩාත් බලපෑම් සහගත බවට නිරීක්ෂණය විය. මෙම කාලය තුළ කෘත්‍රිම ආලෝකය භාවිතයක් නොවූ අතර ස්වාභාවික ආලෝක පවා නොලැබෙන ස්ථානයක තිබූ පොත් රාක්කයක් වේයන්ගේ ප්‍රහාරයට ලක් වීමෙන් මුළුමනින් ම විනාශ වී තිබිණි. මෙම පොත් රාක්කය තොග සමීක්ෂණයෙන් පසු අපහරණයට නිර්දේශ කර තිබූ පොත් සහ සඟරා තැන්පත් කර තිබූවකි. එමෙන්ම මෙම කාලසීමාව තුළ ආර්ද්‍රතාව, උෂ්ණත්වය සහ ආලෝකය වැනි පාරිසරික සාධක නියමිත පාලනයක් යටතේ නොපැවතීම නිසා විශේෂයෙන් ම මුද්‍රිත ද්‍රව්‍යවල

[1] පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනය
prihemakumara@gmail.com

දිලීර හා පුස් බැඳීමේ තත්ත්වයක් දක්නට හැකි විය. මෙම නිරීක්ෂණවලට අනුව පැහැදිලි වන්නේ පුස්තකාලවලට අදාළ ආපදා කළමනාකරණ සැලසුම් හුදෙක් ස්වාභාවික ආපදාවලට පමණක් සීමා නොවිය යුතු බවය. කොවිඩ් 19 හෝ වෙනත් ගෝලීය වසංගත තත්ත්වයක් පුරෝකථනය කර ඊට අදාළ පූර්ව සංරක්ෂණ ක්‍රියාමාර්ග ආපදා කළමනාකරණ සැලසුම්වලට ඇතුළත් කිරීම අත්‍යවශ්‍ය වේ.

**ප්‍රමුඛ පද :** ආපදා කළමනාකරණය, පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය, වසංගත

# පාසල් පද්ධතිය තුළ සම්පත් පාදක ඉගෙනුම ක්‍රියාත්මක කිරීම (මතුගම අධ්‍යාපන කලාපය ඇසුරින්)

ඩී.එම්.එන්.බී. දසනායක[1]

1998 වසරේ දී ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් පාසල් පුස්තකාල සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කෙරිණි. ඒ අනුව පවත්නා පුස්තකාල ගොඩනැගිලි 2000 ක් ප්‍රතිසංස්කරණය කරන ලද අතර අලුතින් පාසල් පුස්තකාල ගොඩනැගිලි 2000 ක් ඉදි කරන ලදී. මෙම කටයුතු අධීක්ෂණය සහ නියාමනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධන ඒකකයක් පිහිටුවීය. ගුරු පුස්තකාලයාධිපති නමින් නව තනතුරක් ද නිර්මාණය කරන ලද අතර ඔවුන්ගේ උසස් අධ්‍යාපන සහ පුහුණු කටයුතු සඳහා කොළඹ විශ්වවිද්‍යාලය යටතේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය ස්ථාපිත කෙරිණි. මෙහිදී පාසල් පුස්තකාල, පාසල් පුස්තකාල හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය යනුවෙන් යළි නම් කරන ලදී. ඒ අනුව සම්පත් පාදක ඉගෙනුම නම් සංකල්පය පාසල් අධ්‍යාපනය වෙත හඳුන්වා දෙනු ලැබීය. මෙයින් අදහස් කරන ලද්දේ පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පුස්තකාලයේ ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ සහ පරිගණක විද්‍යාගාරයේ තිබෙන තොරතුරු සම්පත් භාවිත කිරීමයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පුස්තකාල සම්පත් ව්‍යවහාර කරන අයුරු විශ්ලේෂණය කිරීමත් සම්පත් පාදක ඉගෙනුම ව්‍යවහාර කිරීමේ දී මතුවන ගැටලු විවරණය කිරීමත් මෙම පර්යේෂණයේ අරමුණ වේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මතුගම අධ්‍යාපන කලාපයේ හතළිස් දෙනෙකුගේ (40) නියැදියක් තෝරා ගැණිනි. මෙම නියැදියට විදුහල්පතිවරුන්, ගුරු පුස්තකාලයාධිපතිවරුන්, විෂයභාර ගුරුවරුන් සහ සිසුන් ඇතුළත් විය. දත්ත රැස්කිරීමේදී සම්මුඛ සාකච්ඡා ක්‍රමය මූලික වශයෙන් යොදා ගන්නා ලදි. එමෙන්ම ලිකර්ට් මානය භාවිතයෙන් ප්‍රකාශ විස්සක් (20) සඳහා ප්‍රතිචාර ලබා ගැනිණි. සම්මුඛ සාකච්ඡාවලින් මතු වූ ප්‍රධානතම අනාවරණයක් වූයේ ප්‍රතිචාරිකයන් බහුතරයක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පුස්තකාලයේ වැදගත්කම ගැන අවබෝධයෙන් සිටිය ද, සම්පත් පාදක ඉගෙනුම වැනි අලුත් සංකල්ප පිළිබඳ පූර්ණ දැනුවත්භාවයකින් නොසිටීමය.

[1] විදුහල්පති, ලින්ඩ්සේ බාලිකා විද්‍යාලය, කොළඹ.
nayomidassanayake@gmail.com

සම්පත් පාදක ඉගෙනුම යනු පුළුල් පරාසයකින් යුත් යෝග්‍ය මුද්‍රිත, මුද්‍රිත නොවන සහ මානව සම්පත් ඵලදායී ලෙස පරිහරණයට සිසුන් ක්‍රියාශීලීව සහභාගී වන සැලසුම්සහගත අධ්‍යාපනික වැඩසටහනක් යනුවෙන් න්‍යායාත්මකව හැඳින්වුව ද, මතුගම කලාපයේ පාසල්වල එය එලෙසම ක්‍රියාත්මක වීම අවම මට්ටමක පවතී. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ පාසල් ප්‍රජාවේ පාර්ශවකරුවන් තුළ සම්පත් පාදක ඉගෙනුම සහ පාසල් පුස්තකාලය හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය අතර පැවතිය යුතු ශක්තිමත් සබඳතාව පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොවීමයි. එමෙන්ම සම්පත් පාදක ඉගෙනුම සාර්ථක කර ගැනීම සඳහා විෂයභාර ගුරුවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් එක්ව සිදුකරන සහයෝගී ඉගැන්වීම් අත්‍යවශ්‍ය කොන්දේසියක් වේ. එහෙත් මෙම පර්යේෂණයෙන් අනාවරණය වූයේ එවන් සහයෝගී ඉගැන්වීමක නියැලීමක් දක්නට ලැබීම උගහට බවයි. මේ අනුව සම්පත් පාදක ඉගෙනුම මෙරට පාසල් පද්ධතිය තුළ යථාර්ථයක් බවට පත්වීමට ඇති ප්‍රධාන බාධකය පාසල් ප්‍රජාවේ සෑම පාර්ශවකරුවෙකුටම පාසල් පුස්තකාලය සහ ඉගෙනුම සම්පත් මධ්‍යස්ථානයේ වර්තමාන භූමිකාව පිළිබඳ පවත්නා අඩු අවබෝධය බව පෙනී යයි. එහෙයින් ඔවුන්ගේ අවබෝධය වර්ධනය කිරීමට නිර්මාණශීලී පියවර ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. මේ සඳහා මධ්‍යම රජයේ, පළාත් සභා හා කලාප මට්ටමින් අදාළ නිලධාරීන් දැනුවත් කිරිමයි. මෙන්ම ගුරු පුස්තකාලයාධිපතීන් ද සම්බන්ධ කර ගනිමින් පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන් දියත් කිරීම ද වැදගත් වේ.

ප්‍රමුඛ පද : සම්පත් පාදක ඉගෙනුම, පාසල් ප්‍රජාව, පාසල් පුස්තකාලය, සහයෝගීත්ව ඉගැන්වීම

# වයඹ පළාතේ ප්‍රාථමික පාසල්වල ක්‍රියාත්මක කරන ලද කියවීම් කාමර ව්‍යාපෘතිය පිළිබඳ ඇගයීමක්

ඩබ්. ඒ. එස්. එරන්දති ධර්මප්‍රිය[1]

2017 වර්ෂයේ දී අධ්‍යාපන අමාත්‍යාංශය ප්‍රාථමික පාසල් සඳහා ක්‍රියාකාරකම් කාමරය සහ කියවීම් කාමරය නමින් ව්‍යාපෘතියක් හඳුන්වා දිණි. මේ අනුව දිවයිනේ පාසල් 939ක කියවීම් කාමර ඉදිකර, එය භාවිත කරන ආකාරය පිළිබඳ අත් පොතක් සම්පාදනය කර ඇත. එමෙන්ම මෙම ව්‍යාපෘතිය පිළිබඳ විදුහල්පතිවරුන් සහ ප්‍රාථමික අංශවල ගුරුභවතුන් දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් ද පවත්වා තිබේ. ප්‍රාථමික සිසුන්ගේ කියවීමේ හැකියාව මෙන් ම රුචිකත්වය වර්ධනය කිරීමත් කියවීම් අවස්ථා බහුල කිරීමත් මෙහි මූලික අරමුණු වේ. මෙම පර්යේෂණයේ ප්‍රධානතම අරමුණ වන්නේ කියවීම් කාමර ව්‍යාපෘතිය කවර මට්ටමකින් එහි අරමුණු සාක්ෂාත් කර ඇත් දැයි විමසා බැලීමය. වයඹ පළාතේ ඇති සමස්ත ප්‍රාථමික පාසල් සංඛ්‍යාව 137ක් වන අතර එයින් 16ක් අධ්‍යයනයට බඳුන් කරන ලදී. ඒ අනුව වයඹ පළාතේ අධ්‍යාපන කලාප අටෙන් පාසල් දෙක බැගින් තෝරා ගැණිනි. විදුහල්පතිවරුන්, කොට්ඨාස අධ්‍යක්ෂවරුන්, ප්‍රාථමික අංශ ප්‍රධානීන්, ප්‍රාථමික ගුරු උපදේශකවරුන් නියැදියකින් ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ මගින් දත්ත එක්රැස් කරන ලදී. දත්ත විශ්ලේෂණයේදී මතු වූ ප්‍රධාන කරුණක් වූයේ කියවීම් කාමර උපදෙස් සංග්‍රහය වැඩි වශයෙන් (10) ප්‍රාථමික ගුරුභවතුන් සතුව පැවතීමය. මෙම කිසිදු පාසලක පුස්තකාලයේ එහි පිටපතක් නොවීය. පාසලේ ප්‍රාථමික අංශයට සම්බන්ධ බහුතරයකට (56%) උපදෙස් සංග්‍රහය පිළිබඳ සාමාන්‍ය දැනුවත්භාවයක් පවතී. මෙම කියවීම් කාමර භාවිතය වැඩි වශයෙන් සිදු වන්නේ (50%) පංතිභාර ගුරුභවතාගේ අවශ්‍යතාව මතය. කියවීම් කාමර බොහෝ විට (50%) දෛනිකව අධීක්ෂණය සහ නියාමනය වන අතර කිසිදු අධීක්ෂණයකට හෝ නියාමනයකට ලක් නොවන කියවීම් කාමර සංඛ්‍යාවක් ද (18.7%) තිබේ. කියවීම් කාමරවල සිදු කරන ක්‍රියාකාරකම් අතර කණ්ඩායමක් ලෙස නිදහසේ කියවීම (23.5%) සහ තනිව නිදහසේ කියවීම (19.6%) ප්‍රමුඛ ස්ථානයක් ගෙන ඇත. සිසුන්ගේ කියවීමේ හැකියාව සහ කියවීමේ රුචිකත්වය වර්ධනය කිරීමට මෙම කියවීම් කාමර ව්‍යාපෘතිය ප්‍රබල ලෙස බලපා ඇති බව පෙනේ. මෙහිදී සිසුන් මුහුණ පාන ගැටලු අතර පොත්වල විවිධත්වය අඩුවීම සහ පොත් ප්‍රමාණවත් නොවීම ප්‍රධාන වේ.

[1] නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
walpola1972@gmail,com

ප්‍රාථමික සිසුන් සඳහා ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකම් පිළිබඳ යාවත්කාලීන පුහුණුවක් ගුරුවරුන්ට නොලැබීම ද තවත් ගැටලුවකි. එමෙන් ම මෙම කියවීම් කාමර ක්‍රමයෙන් සාම්ප්‍රදායික පුස්තකාල බවට පරිවර්තනය වෙමින් තිබීමත්, බාහිර වශයෙන් සිදු කෙරෙන අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතීමත් ඇතැම් විට මෙම කියවීම් කාමර පාසලේ වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීමත් මෙම ව්‍යාපෘතියේ අරමුණු සපුරා ගැනීමට බාධා ලෙස පවතින බව අනාවරණය විය. සිසුන්ගේ කියවීමේ හැකියාව සහ රුචිය වර්ධනයට ඉහළ බලපෑමක් කර ඇති මෙම කියවීම් කාමර ව්‍යාපෘතියට අදාළ පහසුකම් ලබා දීමත් එය භාවිත කිරීම පිළිබඳ ප්‍රාථමික අංශයේ ගුරුභවතුන්ට අඛණ්ඩව පුහුණුවක් ලබාදීමත් නිසි අභ්‍යන්තර හා බාහිර අධීක්ෂණයකට යටත් කිරීමත් මගින් එහි අරමුණු සාක්ෂාත් කර ගත හැකි වේ.

**ප්‍රමුඛ පද :** ප්‍රාථමික පාසල්, කියවීම් කාමර, කියවීම් ක්‍රියාකාරකම්

# රූපවාහිනී මාධ්‍ය ආයතන පුස්තකාලයක සංරක්ෂණ භූමිකාවේ වැදගත්කම (ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය ඇසුරින්)

ප්‍රියන්ත ගොඩකන්ද [1]

වත්මන් තොරතුරු සමාජය තුළ තොරතුරු බෙදාහැරීමේ ක්ෂේත්‍රයට අද්විතීය ස්ථානයක් හිමි වේ. රූපවාහිනී තාක්ෂණයේ බිහිවීමත් සමඟ එතෙක් තොරතුරු බෙදාහැරීමේ ආධිපත්‍ය දැරූ පුවත්පත් සහ ගුවන්විදුලිය අභිබවා පෙරට ඒමට රූපවාහිනිය සමත් විය. 1979 අප්‍රියෙල් 13 දින විකාශන කටයුතු ආරම්භ කළ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය ශ්‍රී ලංකාවේ ප්‍රථම රූපවාහිනී විකාශනය ලෙස ඉතිහාසයට එක් වේ. මේ වනවිට දිවයින පුරා ස්ථානගත කරන ලද සම්ප්‍රේෂණ කුළුණු දහයක් (10) මගින් රටේ 95%ක භූමි ප්‍රදේශයක් ආවරණය කිරීමට මෙම මාධ්‍ය ජාලය සමත්ව තිබේ. රූපවාහිනී ආයතනයක් ස්වකීය වැඩටසහන් සම්පාදනයේ දී සහ සම්ප්‍රේෂණයේ දී ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය වර්ග ගණනාවක් භාවිත කළ ද මෙම අධ්‍යයනයේදී අවධානය යොමු කරනුයේ රූපවාහිනී කැසට්පට වෙතටය. රූපවාහිනී සල රූ ශබ්ද සහ දෘශ්‍ය පට වසර 45 පමණ කාලයක් පුරා ලෝකයේ ජනප්‍රිය සන්නිවේදන මාධ්‍යයක් ලෙස පරිණාමය වී ඇත. මෙම පරිණාමය වර්තමානයේ භාවිතයට ගැනෙන අංකිත තැටි (Digital Disc) දක්වා විහිදේ. මේ අනුව VHS, U-matic, Betacam, PFD & Mini DV tapes සහ XDCam යනාදිය රූපවාහිනී ආයතන විසින් භාවිතයට ගෙන තිබේ. ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය පසුගිය වසර 45 පුරා මෙම විවිධ තාක්ෂණික ආකෘතිවලින් පටිගත කිරීම් කර ඇති අතර ඒවා සංරක්ෂණය කිරිම ආයතනික පුස්තකාලයේ ප්‍රමුඛතම කාර්යයක් බවට පත්ව ඇත. මෙහිදී මෙම ද්‍රව්‍ය ගබඩා කිරීම මෙන් ම ඒවා යාවත්කාලීන තාක්ෂණයන් වෙත පරිවර්තනය කිරීම ප්‍රධානතම සංරක්ෂණ ක්‍රියාමාර්ග වේ. වීඩියෝ කැසට්පට / තැටි පුස් බැඳීමෙන් ආරක්ෂා වීම සඳහා ඒවා නියත වර්ගීකරණයකට ලක් කර ගබඩා කිරීමේ පියවර ගෙන ඇත. මේ අනුව එම පටි / තැටි Masters and edited masters, sub masters සහ Copy, Sub copy යනුවෙන් වර්ග කර ඒ ඒ වර්ග විශේෂිත පාරිසරික, ආර්ද්‍රතා සහ උෂ්ණත්ව තත්ත්වයන් යටතේ ගබඩා කර ඇති අතර ඒවායේ ප්‍රවේශන සීමා ද සලකුණු කර ඇත. ගොනු මත පදනම් වූ මාධ්‍ය (File based media) මේ සඳහා ගන්නා ලද තවත් ක්‍රියාමාර්ගයකි. කැසට් රහිත කැම්රෙකෝඩර් වීඩියෝ පටිගත කිරීමේ තාක්ෂණය ව්‍යාප්ත වීමත් සමඟ DV වීඩියෝ දෘශ්‍ය තැටි (Optical Disc), ෆ්ලෑෂ් මතක කාඩ්පත් (Flash memory card) සහ දෘඪ තැටි (Hard Disc) ධාවක මත පටිගත කර පරිගණක ගොනු ලෙස භාවිත කෙරේ.

[1] පුස්තකාලයාධිපති, ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය
Janakpri14@gmail.com

මෙලෙස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ පුස්තකාල එකතුවේ පවත්නා කැසට් පට නවීන තාක්ෂණික ක්‍රමවලට පරිවර්තනය කිරීම අත්‍යවශ්‍ය කාර්යයකි. මේ සඳහා කරනු ලබන මූල්‍යමය ආයෝජනය කිසිසේත් අපතේ යන්නක් නොවනු ඇත. මන්ද, මෙම තොරතුරු සම්භාරය මෙරට සමාජ පරිණාමයේ ඓතිහාසික ශ්‍රව්‍ය දෘශ්‍ය උරුමයක් වන බැවිනි. වත්මන් සහ අනාගත පර්යේෂකයන් සඳහා අවශ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය සාක්ෂි එමගින් සපයන බැවිනි.

**ප්‍රමුඛ පද :** ජනමාධ්‍ය පුස්තකාල, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය, සංරක්ෂණය

# Technical Session - 03

**Track : : Library and Community Information Services**

**Session Chair :** Mr. K.K.G. Wijeweera
Former Chief Librarian
Central Bank of Sri Lanka

Ven. Demunnewe Upali Thero
Lecturer in Library and Information Science
Department of Social Sciences and Comparative Studies,
Faculty of Languages and Cultural Studies,
Bhiksu University of Sri Lanka

**Rapporteur :** Mrs. Thamara Jayasena
Librarian I
Colombo Public Library

# "From challenges to change"- Valluvar community library empowering education and community cohesion through library establishment and its initiatives : a case study of Delmar middle division in Nuwara Eliya district

Shanmugavell Dilushan[1]

Delmar Middle Division, situated within the Nuwara Eliya District, is a tea estate community characterized by its diverse population, primarily employed in tea estate labor with low income levels. The onset of the COVID-19 pandemic and the economic crisis in Sri Lanka exacerbated existing educational challenges faced by the children of Delmar Estate. Limited space in their homes, coupled with a lack of public learning areas and inadequate access to educational resources, hindered their learning process. Moreover, the economic strain on families made it difficult to afford education for their children. Additionally, many children lacked the knowledge of effective time management. The absence of a reading culture among both children and the wider community further compounded these challenges. Social divisions, including those based on religion, caste, and ethnicity, also hindered unity among the Delmar people. Recognizing the urgent need for intervention to address these issues and foster community cohesion, the Valluvar Educational Development Forum, composed of University Undergraduate students from Delmar Estate, established a community library. This initiative aimed to provide a supportive learning environment and promote unity within the Delmar community. This study seeks to examine the potential impact of the established community library. Specifically, we aim to explore how it cultivated a reading culture among children, fostered community unity, and enhanced learning outcomes. By analyzing the planning, implementation, and outcomes of this initiative, we endeavor to offer insights to support other communities facing similar educational challenges. Through our findings, we hope to contribute to the collective efforts to improve education accessibility and quality in underserved areas like Delmar Middle Division. This case study aims to

1 President, Valluvar community library, Valluvar education development forum, Ragala
dilushanar7@gmail.com

evaluate the multifaceted impact of the library initiative on the Delmar community. Specifically, it seeks to evaluate if the new library at Delmar Estate encourages a culture of reading among children, to determine if the library at Delmar Estate effectively fosters a reading culture among children, to assess the library usage and engagement with reading materials to gauge the level of adoption of reading habits within the community, to examine how the establishment process of the library at Delmar Middle Division, fosters community cohesion in its diverse population, s to assess how the establishment of community library promotes unity and collaboration among its diverse population, to investigate the impact of library events on bringing together people from various backgrounds within the community of Delmar Middle Division and to examine how library events at Delmar Middle Division facilitate social cohesion among diverse community members. The study adopted a participatory methodology, integrating needs assessment, community engagement, resource mobilization, and capacity building to implement a library initiative in Delmar Estate. The study encompassed a population of over 500 children and 2000 community members from Delmar Middle Division. Utilizing purposive sampling, 50 consistent library users were selected across various age groups, while convenience sampling recruited 50 community members from diverse socio-economic backgrounds. Data collection methods included surveys, interviews, and focus group discussions to assess the library's impact on fostering a reading culture among children. Qualitative techniques such as interviews and observation were employed to investigate the library's role in enhancing community cohesion. Ensuring cultural sensitivity, data collection aimed for inclusivity and representation across all segments of the population. This approach facilitated a comprehensive understanding of the library initiative's effects on both individual reading habits and broader community cohesion within Delmar Estate. The findings reveal the significant impact of the new library at Delmar Estate on both the community's reading culture and social cohesion. Children's active engagement with the library reflects its success in fostering a culture of reading, enhancing literacy skills, and nurturing a lifelong love for learning. Additionally, the library's establishment has fostered a sense of unity among residents, transcending social divisions as diverse community members come together to support the initiative. Furthermore, library events have played a crucial role in bridging social divides by providing inclusive platforms for interaction, learning, and cultural exchange. Through these events, individuals from various backgrounds find common ground, fostering mutual understanding and respect. Overall, the library emerges

as a transformative force in Delmar Estate, not only promoting literacy and learning but also fostering community cohesion and bridging social divisions, thus contributing to the holistic development of the community. The study underscores the transformative impact of the Valluvar Community Library initiative in Delmar Middle Division. It discusses the successful cultivation of a reading culture among children through active engagement with reading materials and the development of literacy skills. Additionally, the establishment of the library has notably enhanced community cohesion, as evidenced by diverse residents coming together to support the initiative, transcending social divisions and fostering unity. Furthermore, library events have played a pivotal role in bridging social divides by providing inclusive platforms for interaction, learning, and cultural exchange. These events have facilitated mutual understanding and respect among individuals from various backgrounds. Overall, the study highlights the multifaceted impact of the library initiative, emphasizing its role in promoting literacy, fostering community cohesion, and bridging social divisions within Delmar Middle Division. The case study of Delmar Middle Division highlights the transformative role of library establishment in addressing educational challenges and fostering community development. The findings underscore the importance of libraries in promoting a culture of reading among children, enhancing community cohesion, and providing inclusive platforms for interaction and celebration of diversity. Overall, this study demonstrates the significant impact of libraries in empowering education and promoting social unity in rural areas like Delmar Middle Division.

**Keywords :** community library, cultural cohesion, reading culture, case studies

# Awareness of Bolgoda wetlands: a study on Panadura public library users

Thushari Seneviratne[1]
Wathsala Liyanaarachchi[2]
Chulantha Jayawardena[3]

Bolgoda wetlands are one of the most sensitive regions in a sub-urban environment, and have the largest freshwater lake arrangement in Sri Lanka. The lakes, once identified as threatened due to urbanization and industrialization contain immense socio-economic and ecological value, demanding the attention of citizens, especially those inhabiting the nearby suburbs. Raising environmental awareness on all societal levels is a challenging task, and the environmental awareness in the context of this study is confined to the human attitude regarding pro-environmental behaviour in association with the use of public libraries. The authors consider that the degree of environmental awareness is crucial to formulate strategies and actions pertaining to all societal levels and to comply with sustainable development goals where the environment is an integral component. This case study evaluates the awareness levels of Panadura, Migettuwathe Gunananda Himi Memorial Public Library users, about the Bolgoda ecosystem which consists of two prominent freshwater lakes and a widespread wetland system. A survey questionnaire was utilized to gather information from the library users during a week starting from 20th February 2024 adhering to convenience sampling. Among the total of 130 respondents, 92.9% were residents of Panadura Divisional Secretariat; 4.7% were residents of Moratuwa Divisional Secretariat and 0.8% each from Kesbewa, Haputale and Medawachchiya; 53.1% identified as females; 26.4% were indicated in the age group of 15-20 years: 23.2% within 21-30 years; 10.1% within 31-40 years; 8.5% within 41-50 years and 20.8% above 60 years. The sample represented 78.9% with G.C.E. Advanced Level or above qualifications; 34.9% employed individuals; and 15.4% retired.

1 Senior Assistant Librarian, University of Moratuwa
thusharims@uom.lk
2 Librarian, Migettuwathe Gunananda Himi Memorial Public Library, Panadura
Wathsala22222@gmail.com
3 Senior Lecturer, Department of Earth Resources Engineering, University of Moratuwa
chulanthaj@uom.lk

Respondents visited the library an average of 7 times per month and out of those 20% were for educational needs; 19.2% for study notes; 16.2% were for reading books; 13.8% were seeking new knowledge and 10% were for reading newspapers. Most of the respondents (93.3%) have heard of Bolgoda; 40.2% have read about Bolgoda; and 67.2% have viewed photographs or watched videos on Bolgoda. In the context of the Bolgoda Ecosystem and human interactions, the level of awareness by the public library users varied from 0.8% to ‘excellent knowledge’; 14.6% to ‘good knowledge’; 23.1% to ‘satisfactory knowledge’; 29.2% to ‘poor knowledge’ and 32.3% having ‘no knowledge’. Furthermore, respondents have selected the following five themes out of the given ten as interested in finding more information about the Bolgoda Ecosystem: Biodiversity (74.3%); attractive locations (62%); threats to the Bolgoda Ecosystem (53.1%); historic and cultural values (52.2%) and recreational activities (52.2%). Most respondents preferred to obtain the above information via social networks such as Facebook and WhatsApp (37.9%) in comparison to lectures, leaflets/posters, environmental excursions, and video documentaries, and 98.1% of the respondents consider public libraries to be a mediator in promoting environmental awareness. Overall, the study highlights the limited environmental awareness of a majority of library users, irrespective of age category, level of education, etc. and interest in being knowledgeable through the library. Hence, public libraries could play a vital role in knowledge dissemination to raise environmental awareness and community engagement in protecting sensitive ecosystems and natural resources.

**Keywords :** Bolgoda Ecosystem; Sensitive Environments; Freshwater Lakes; Public Libraries.

# The Role of public libraries in fostering the creative economy within Gampaha district

H.G.M Aravindi Gajanayake[1]

The public library service in Sri Lanka has evolved into a focal point for social empowerment extending beyond its conventional functions. The concept of the creative economy, which assigns economic value to the creative capacities of communities, has emerged as a strategic tool for economic development in several advanced nations. Given Sri Lanka's current economic downturn, there is a pressing need for the adoption of an economic strategic plan that prioritizes local industries and services. The creative economy is typically examined through three fundamental approaches, with arts and culture serving as pivotal instruments in assessing the economic development strategies of various countries such as Japan, South Korea, Malaysia, Singapore and China. Notably, arts and culture have played a significant role in the economic advancement of Singapore, primarily aiming to enhance tourism appeal and attract foreign investment. Moreover, China was the leading country for handicrafts during the period from 2014 to 2018 has laid the groundwork for economic development.
Hirimuthugodage et al. (2020) identified sixteen creative industries in Sri Lanka, emphasizing the necessity of direct government intervention for their development. Recent research underscores the significance of consolidating local industrialists, intervening to preserve locally dispersed industries, establishing knowledge-enhancement centres through the aggregation of industrialists, and acting as facilitators for economic development. Furthermore, Sri Lanka possesses a distinctive arts and culture, thereby harbouring a substantial number of industrialists contributing to the nation's arts industry.

The aim of this study is to examine the potential contribution of public libraries in the Gampaha district to the creative economy through the promotion of arts and culture. Gampaha district was chosen due to its concentration of arts and culture industrialists. Utilizing data from the

[1] Librarian, Public Library, Gampaha
m.aravindi86@gmail.com

Graded public libraries in Sri Lanka (2022), the study focused on the 80 graded libraries within the district, assuming their standardized provision of services to the public. Data collection was conducted via telephone interviews, reaching data saturation at the 30th response level.

The findings revealed that cultural and religious events are prevalent at a rate of 90%, with high levels of engagement in promoting traditional arts (65%), offering training programs for local arts (50%), and supporting community-based local artists (50%). However, initiatives such as promoting products and services through local arts, creating market value for local artists, and hosting performance programs were observed at a lower percentage, below 30%.

Despite the unfamiliarity of librarians with the concept of the creative economy, public libraries have already made significant contributions to its promotion. By fostering local artists, providing opportunities for learning traditional arts and facilitating the development of products and services with market value, public libraries contribute to nurturing community artistic abilities and generating economic value. Thus, it can be inferred that public libraries play a direct role in advancing creative industries in Sri Lanka while harnessing the economic potential of community creative abilities.

**Keywords :** public libraries, creative economy, arts and culture promotion, economic development.

# තොරතුරු අවශ්‍යතා සපුරාලීමට උඩුගම්පල එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ජන්ම ශත සංවත්සර මහජන පුස්තකාලයේ දායකත්වය (අ. පො. ස. උසස් පෙළ සිසුන් ඇසුරින්)

එච්.ඒ.පී. හර්ෂණී හපුආරච්චි[1]

මහජන පුස්තකාල සාමාන්‍යයෙන් පරිශීලකයන්ට පොත් සහ අනෙකුත් ද්‍රව්‍ය තාවකාලිකව පරිශ්‍රයෙන් පිටතට ගෙන යාමට ඉඩ සලසයි. මහජන පුස්තකාලය ස්ථාපිත කර ඇත්තේ එක් පුද්ගලයෙකුගෙන් වෙනත් අයෙකුට අත්දැකීම් සහ සංකල්ප සන්නිවේදනය කිරීමට සහ සියලු දෙනාට හෝ ඕනෑම පුද්ගලයෙකුට ඒවා සරලව හා නිදහසේ ගොඩනැංවීමට අවශ්‍ය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා ය. තොරතුරු අවශ්‍යතා පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ. ප්‍රජාවගේ විවිධ තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා සම්පත් සහ සේවා සැපයීමේදී මහජන පුස්තකාල ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. විශේෂයෙන්ම පාසල් සිසුන්ට මහජන පුස්තකාලවල ඇති සම්පත් සහ ආධාරකවලින් සැළකිය යුතු ප්‍රතිලාභයක් ලැබේ. මෙම සම්පත්වලට ඔවුන්ගේ අධ්‍යයන, පර්යේෂණ ව්‍යාපෘති සහ පුද්ගලික සුපෝෂණයට සහාය විය හැකිය. එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ජන්ම ශත සංවත්සර මහජන පුස්තකාලය පරිහරණය කරන උසස් පෙළ සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා ගවේෂණය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. උඩුගම්පල ප්‍රදේශයේ උසස් පෙළ සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා හඳුනාග ැනීම, සිසුන් සඳහා අවශ්‍ය නිශ්චිත සම්පත් හා සේවා හඳුනාගැනීම සහ ඔවුන් තොරතුරු සොයන විට මුහුණ දෙන බාධක සහ අභියෝග විමර්ශනය කිරීම විශේෂිත අරමුණු වේ. මහජන පුස්තකාල තොරතුරු අවශ්‍යතා අනුසාරයෙන් ප්‍රකාශිත පර්යේෂණ ශ්‍රී ලංකාවේ ඉතා දුර්ලභ ය. සමීක්ෂණය සඳහා උසස් පෙළ සිසුන් අධ්‍යයන ජනගහනය ලෙස යොදා ගැණුනු අතර පුස්තකාලය වැඩිදියුණු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මෙන්ම පුස්තකාලයේ සම්පත්, පහසුකම් සහ සේවා සම්බන්ධයෙන් පරිශීලක තෘප්තිමත් මට්ටම හඳුනාගැනීම තුළින් උසස් පෙළ ශිෂ්‍යයන් වෙත ඉහළම සේවාවක් ලබාදීම මෙම අධ්‍යයනයෙහි වැදගත්කම තහවුරු කරයි. පුස්තකාලය භාවිත කරන උසස් පෙළ සිසුන් හාරසියයකට අධික සංඛ්‍යාවක් නියෝජනය සඳහා සමීක්ෂණ සහ නියැදි ක්‍රමවේදයක් මෙම ගවේෂණයේ දී යොදා ගන්නා ලදී. මේ සඳහා අහඹු නියැදීමේ ක්‍රමය භාවිත කර ඇති අතර සමීක්ෂණ පර්යේෂණ ක්‍රමය භාවිත කරන ලදී.

[1] පුස්තකාලයාධිපති III,එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ජන්ම ශත සංවත්සර මහජන පුස්තකාලය, මිනුවන්ගොඩ
hapuarachchigeharshani@gmail.com

ප්‍රථම වරට අ.පො.ස උසස් පෙළ විභාගයට පෙනී සිටි සියලුම සිසුන් අධ්‍යයන ජනගහනය විය. ඉන් 50 ක් නියැදිය ලෙස තෝරා ගන්නා ලදී. දත්ත රැස්කිරීම සඳහා උසස් පෙළ සිසුන් 50 ක් සඳහා ප්‍රශ්නාවලිය බෙදාදුනි. සමස්ථ ප්‍රතිචාර අනුපාතය 100% කි. ප්‍රතිචාර දැක්වූවන් 50 දෙනා අතර සිසුවියන් 29 ක් සිටි අතර 21 ක් සිසුන් විය. ප්‍රශ්නාවලිය විශ්ලේෂණයෙන් පෙනී ගියේ පරිශීලකයන් තම අධ්‍යයන ක්ෂේත්‍රයේ තොරතුරු රැස්කිරීමේ දී විවිධ ගැටලුවලට මුහුණ දී ඇති බවත්, සලකා බැලිය යුතු සහ දියහැකි විසඳුම් උසස් පෙළ විභාගයෙන් පසුව සිසුන්ගෙන් උපරිම ප්‍රතිචාර ලැබී ඇති බවත්ය. උසස් පෙළ සිසුන් 60% පොත් බැහැර ගෙනයාමට සහ ආපසු ලබාදීම සඳහා පුස්තකාලය භාවිත කරන බවයි. එබැවින් උසස් පෙළ සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා නව සම්පත් ලබාදීමට පුස්තකාලය කටයුතු කළ යුතුය. මෙම විග්‍රහයේ දී සිසුන් දස දෙනෙකු සඳහන් කළේ තමන් ඉගෙනීම සඳහා පුස්තකාලය භාවිත කළ බවයි. එම ප්‍රතිශතය 20% කි. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 10% ක් විනෝදාස්වාදය සඳහා පුස්තකාලයට පැමිණ ඇත. සිසුන්ගෙන් අතිමහත් බහුතරයක්, එනම් පුස්තකාලයේ ඇති සාමාන්‍ය දැනුම පොත් භාවිත කිරීමට කැමැත්ත පළ කර ඇත. 36% ක් අමතර කියවීමේ දැනුමක් ලබා ගැනීම සඳහා පුස්තකාලය භාවිත කරයි. පුස්තකාල සම්පත් උපයෝගී කර ගනිමින් සිසුන් තම දැනුම දියුණු කර ගැනීමට උත්සාහ කරන බව පෙනේ. තෘප්තිමත්භාවයේ මට්ටම විශ්ලේෂණාත්මකව පෙන්නුම් කරන්නේ සිසුන්ගෙන් 48% ක් සම්පත්වලින් සෑහීමකට පත්වන බවයි. සිසුන්ගෙන් 30% ක් මධ්‍යස්ථව තෘප්තිමත් වී ඇත.

**ප්‍රමුඛ පද** : තොරතුරු අවශ්‍යතා, මහජන පුස්තකාල, තොරතුරු සේවා

# ප්‍රජා පාදක විශෝධන මධ්‍යස්ථානවල ආඥාලාභීන්ගේ විශෝධන ක්‍රියාවලියට අදාළ තොරතුරු අවශ්‍යතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩී. එම්. ඩබ්ලියු. වී ජයසිංහ[1]

සුළු අපරාධකරුවන් බන්ධනාගාරගත නොකර ප්‍රජාව තුළ විශෝධනය කරන අතර තුර දඬුවම ක්‍රියාත්මක කිරීම ප්‍රජා පාදක විශෝධනයයි. මෙම ක්‍රියාවලියේදී විශෝධන කාර්යයට අදාළව දැනුම, ආකල්ප සහ කුසලතා සංවර්ධනය කිරීම සඳහා තොරතුරු භාවිත කරයි. විශෝධනය කරනු ලබන ආඥාලාභීන් සැලකිය යුතු ප්‍රතිශතයක් නැවත බන්ධනාගාරගත වීමට හේතුව සහ ඔවුන් යහපත් පුරවැසියන් ලෙස සාර්ථකව සමාජගත කිරීමේදී තොරතුරු අවශ්‍යතා පවතීද? යන්න පර්යේෂණ ගැටලුව ලෙස ඉදිරිපත් කරන ලදී. මෙම අධ්‍යයනයෙන් අනාවරණය කර ගන්නා කරුණු විශෝධන කාර්යය සාර්ථකව සැලසුම් කිරීම සඳහා වැදගත් වේ. විශෝධන කාර්යයේදී ආඥාලාභීන්ගේ සහ ප්‍රජා විශෝධන නිලධාරීන්ගේ තොරතුරු අවශ්‍යතා අනාවරණය කර ගැනීම, මෙම ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කර අපේක්ෂිත ප්‍රතිඵල සාධනය කර ගැනීමේදී බලධාරීන් මුහුණ දෙන ගැටලු හඳුනා ගැනීම අධ්‍යයනයේ අරමුණු වේ. අළුත්කඩේ, මාළිගාකන්ද සහ කොටුව යන මහේස්ත්‍රාත් අධිකරණවලද පර්යේෂණය ආරම්භ කළ දින වන විට අධිකරණය මගින් ආඥාලාභීන්ගෙන් (අලුත් කඩේ 28, මාළිගාකන්ද 21, කොටුව 16) එක් විශෝධන මධ්‍යස්ථානයකින් අසම්භාවී ලෙස තෝරාගත් 10 දෙනෙකු බැගින් 30 දෙනෙකු සහ මධ්‍යස්ථාන 03හි ප්‍රධාන විශෝධන නිලධාරීන් තිදෙනා පර්යේෂණ නියැදිය වශයෙන් යොදා ගන්නා ලදී. පර්යේෂණ කාර්යයේදී අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, පර්යේෂකයාගේ නිරීක්ෂණ සහ මූලාශ්‍ර විමර්ශනය යන බහුවිධ දත්ත රැස්කිරීමේ උපකරණ යොදා ගනිමින් සිද්ධි අධ්‍යයන පර්යේෂණ ක්‍රමවේදයේ ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය යොදා ගන්නා ලදී. විශෝධන කාර්යයේදී ආඥාලාභීන් සහ විශෝධන නිලධාරීන් සඳහා තොරතුරු අවශ්‍යතා පැවතීම, විශෝධන නිලධාරීන් මූලික වශයෙන් රාජ්‍ය ලේඛන සහ රාජ්‍ය ආයතනවලින් තොරතුරු ලබා ගැනීම, විශෝධනය වූ ආඥාලාභීන්ගෙන් 33%ක් පමණ අපරාධවලට යොමු වී නැවත බන්ධනාගාරගත වීම, ආඥාලාභීන් 95%ක්ම 10 වසර දක්වා අධ්‍යාපනය ලබා තිබීම යන කරුණු මෙම අධ්‍යනයේදී අනාවරණය විය.

1 පුස්තකාලයාධිපති, අතුරුගිරිය මහජන පුස්තකාලය, කඩුවෙල මහා නගර සභාව.
jayasinghevijith@gmail.com

ආගන්තුකයින්ගේ දැනුම, ආකල්ප සහ කුසලතා අත්පත් කර ගැනීම සඳහා තොරතුරු අත්‍යවශ්‍ය සාධකයක් වන අතර දැනට ක්‍රියාත්මක තොරතුරු ලබාදීමේ ක්‍රමවේදය සාර්ථක නොමැත. විශෝධන ක්‍රියාවලිය මගින් අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට අපහසු සාධක අතර ආගන්තුකයින් සහ විශෝධන නිලධාරීන්ට තොරතුරු ලබා ගැනීමේදී මතු වන ගැටලු ප්‍රධාන සාධකයක් වන බව නිගමනය කළ හැකිය. ප්‍රජා විශෝධන නිලධාරීන්ට ප්‍රජා විශෝධනය සම්බන්ධ නව දැනුම ලබා ගැනීම සඳහා පුහුණු වැඩමුළු සංවිධානය කිරීම, ප්‍රජා විශෝධන ක්‍රියාවලියේදී දැනුම, ආකල්ප සහ කුසලතා සංවර්ධනය කිරීම සඳහා විෂය නිර්දේශයක් සකස් කිරීම, අදාළ  අධිකරණ බල ප්‍රදේශයේ මහජන පුස්තකාලයාධිපති සහ විශෝධන නිලධාරී එක්ව විශෝධන කාර්යයට අදාළව මහජන පුස්තකාල ආශ්‍රිතව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යෝජනා වශයෙන් ඉදිරිපත් කළ හැකිය.

**මූලික පද :** ප්‍රජා පාදක විශෝධනය, ආගන්තුකයින්, තොරතුරු අවශ්‍යතා

# බන්ධනාගාරගත වන කාන්තා රැඳවියන්ගේ දරුවන් සමාජගත කිරීමේ දී මහජන පුස්තකාලයට කළ හැකි කාර්යභාරය

අනූෂා රත්නායක[1]

කාන්තාවන් විවිධ විෂමාචාර ක්‍රියා හේතු කොට ගෙන බන්ධනාගාරගත වීම ඔවුන්ගේ පවුල් සංස්ථාව වෙත මෙන්ම පුළුල් වශයෙන් සමාජය වෙත ද කරනු ලබන නිශේධනීය බලපෑම අතිමහත්ය. විශේෂයෙන් මෙවන් තත්ත්වයක් නිසා පීඩාවට පත්වන කණ්ඩායම් අතරින් දරුවන් ප්‍රමුඛ වේ. මෙම කාන්තාවන් කාණ්ඩ තුනකට බෙදා දැක්විය හැක. එනම්, දරුවන් ගෘහස්ථව හැදී වැඩෙද්දී බන්ධනාගාරගතව සිටින කාන්තාවන්, දරුවන් ද සමඟ බන්ධනාගාරයේ සිටින කාන්තාවන් සහ බන්ධනාගාරගතව සිටියදී දරුවන් ප්‍රසූත කරන කාන්තාවන් වශයෙනි. එහෙයින් බන්ධනාගාර පුනරුත්ථාපන ක්‍රියාවලියේදී විශේෂ අවධානයට ලක් විය යුතු කණ්ඩායමක් ලෙස මෙම කාන්තා රැඳවියන්ගේ දරුවන් සැලකිය හැකිය. මෙම දරුවන් නියමාකාරයෙන් සමාජානුයෝජනය කිරීම සමාජීය යහපත වෙත බලපාන ප්‍රධාන සාධකයක් වේ. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ කාන්තාවන් බන්ධනාගාරගත වීමට තුඩු දී ඇති හේතු විමසීමත් ඔවුන්ගේ දරුවන් සමාජගත කිරීමේදී මහජන පුස්තකාලවලට සැපයීමට හැකි දායකත්වය විග්‍රහ කිරීමත් ය. මෙහිදී සිද්ධි අධ්‍යයන පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලද අතර මහනුවර බෝගම්බර බන්ධනාගාරයේ කේ වාට්ටුව පර්යේෂණ ස්ථානය ලෙස තෝරා ගැනිණි. මෙම කේ වාට්ටුවේ කාන්තාවන් හැටදෙනෙකු (60) රඳවා සිටින අතර ඔවුන් මරණ දඬුවම නියම වූවන් , එම තීන්දුවට අභියාචනය කර සිටින්නන් සහ ජීවිතාන්තය දක්වා සිරගෙට නියමවූවන් ලෙස වර්ග කළ හැකිය. ඔවුන් අතරින් දරුවන් සිටින සහ තොරතුරු ලබා දීමට එකඟතාවක් දැක්වූ කාන්තාවන් විසිපස් දෙනෙකු (25) නියැදිය ලෙස තෝරා ගන්නා ලදි.

දත්ත එක්රැස් කිරීමේ මෙවලම ලෙස සම්මුඛ සාකච්ඡා යොදා ගැණිනි. මෙම කාන්තාවන් බන්ධනාගාරගත වීමට හේතු වූ කරුණු පිළිවෙළින් ලිංගික ශ්‍රමිකයන් වීම (47%), මත්ද්‍රව්‍ය භාවිතය (42%), මත්ද්‍රව්‍ය විකිණීම (38%) , මූල්‍යමය වංචා (30%), වෙනත් හේතු (18%) සහ මිනිමැරීම (12%) දැක්විය හැකිය. සම්මුඛ සාකච්ඡාවලදී ඇතැමුන් ලබාදුන් පිළිතුරු අතර " යාළුවෝ විශ්වාස කරලා තමයි මට මේ දේ වුණේ", "ණය තුරුස් ගෙවාගන්න විදියක් නැතුව ගියා", "උං මාවයි මගේ කෙලීවයි දෙන්නම අඹුවට ගන්න ආවා" , "මට ඒක

---

[1] මහජන පුස්තකාලය, මාතලේ
anudil7858@gmail.com

නැතුව බැරුව ගියා" වැනි ප්‍රකාශ ද අසන්නට ලැබිණි. මෙම කාන්තාවන්ගේ දරුවන් වැඩි ප්‍රමාණයක් (64%) මවගේ දෙමාපියන් හෝ ළමා නිවාසවල දිවි ගෙවති. එමෙන්ම ඔවුන්ගෙන් බහුතරයක් (68%) නාගරික දිළිඳු ප්‍රජාවට අයත් වේ. මෙම කාන්තාවන්ගේ දරුවන් අතර පාසල් යා යුතු වයසේ සිටින එහෙත් පාසල් නොයන දරුවන් පිරිසක් (48%) ද සිටී. මෙම දරුවන් නිසි පරිදි සමාජානුයෝජනය කිරීමට සහාය වීම සමාජීය ආයතනයක් ලෙස මහජන පුස්තකාලයේ වගකීමක් වුවද, මහනුවර දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාල මෙකී කාර්ය වෙත මේ දක්වා එතරම් අවධානයක් යොමු කර ඇති බව නොපෙනේ. එහෙයින් මෙම දරුවන් මහජන පුස්තකාල සඳහා නව ඉලක්ක කණ්ඩායමක් වන අතර ස්වකීය සමාජීය භූමිකාව අර්ථවත් කර ගැනීමට අවකාශයක් ද සපයයි. මෙම දරුවන් දිවිගෙ වන ස්ථාන හඳුනාගෙන ඔවුන් මහජන පුස්තකාල පරිශ්‍රයට කැඳවා ගැනීමට හෝ ජංගම සේවාව මඟින් ඔවුනට සේවා සැපයීමට හෝ ව්‍යාප්ති සේවා හරහා ඔවුන් සමාජානුයෝජනය කිරීමට සහාය වීම සඳහා වැඩපිළිවෙළක් සැකසීම සුදුසු වේ. මන්ද, දෙමාපිය රැකවරණයක් නොමැති මෙම දරුවන් විෂමාචාර සඳහා පොළඹවා ගැනීමට පවත්නා සම්භාවිතාව ඉහළ බැවිනි.

**ප්‍රමුඛ පද :** කාන්තා රැඳවියන්, බන්ධනාගාර, මහජන පුස්තකාලය

# ප්‍රබන්ධ සාහිත්‍ය ප්‍රවර්ධනයෙහි ලා මුහුණු පොතෙහි කියවීම් කණ්ඩායම්වල දායකත්වය

හිමන්ති කුමාරි[1]

කියවීම ප්‍රවර්ධනයේ දී ප්‍රබන්ධ සාහිත්‍යයට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. නවකතා, කෙටිකතා, පද්‍ය, කාව්‍ය සහ ගීත රචනා යනාදිය ප්‍රධාන ප්‍රබන්ධ ශානර ලෙස සැලකේ. මේ අතරින් ද පාඨක අවධානය වැඩි වශයෙන් යොමු වන්නේ නවකතා වෙතටය. නවකතා කියවීම පාඨක ප්‍රජාව අතර ප්‍රචලිත කිරීම සඳහා ලේඛකයන්, ප්‍රකාශකයන්, පොත් වෙළඳුන්, විචාරකයන් විවිධ උපක්‍රම සහ ක්‍රියාමාර්ග භාවිත කරති. මෙම කෘති ප්‍රවර්ධනය සඳහා බොහෝ කලක් ප්‍රධානතම වේදිකාව ලෙස භාවිත වූයේ මුද්‍රිත පුවත්පත්වල සාහිත්‍ය අතිරේකයන්ය. එහෙත් සමාජ මාධ්‍යයේ ආගමනයත් සමඟ නවකතා ප්‍රචාරණයේ සහ ප්‍රවර්ධනයේ ආධිපත්‍ය අත්පත් කර ගැනීමට මුහුණු පොත සමත් විය. මුහුණු පොත තුළ කේවල වශයෙන් මෙන්ම කණ්ඩායම් වශයෙන් ද මෙකී ක්‍රියාකාරීත්වය දක්නට පුළුවන. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ නවකතා කියවීම ප්‍රවර්ධනය සඳහා මුහුණු පොතේ සක්‍රීයව සිටින කියවීම් කණ්ඩායම්වල දායකත්වය පිළිබඳ විමසීම සහ එම දායකත්වයේ ස්වරූප විශ්ලේෂණය කිරීම වේ. ග්‍රන්ථමිතික අධ්‍යයන ක්‍රමවේදය මෙහිදී පර්යේෂණ ක්‍රමවේදය ලෙස භාවිත කර ඇත. මේ අනුව මාස තුනක කාලයක් පුරා ''පොත් කියවන අය'' සහ ''පොත් කියවන්නන්ගේ සංගමය'' යන කණ්ඩායම් නවකතා කියවීම ප්‍රවර්ධනය කර ඇති ආකාරය පරීක්ෂාවට ලක් කෙරිණි. මෙම කියවීම් කණ්ඩායම් විසින් මෙම කාල පරාසය තුළ නවකතා අසූවක් (80) ප්‍රවර්ධනය කර තිබූ අතර එයින් 58 (72.5%) ක් ස්වතන්ත්‍ර සහ 22 (27.5%) ක් පරිවර්තන කෘතිවලින් සමන්විත වේ. කතුවරුන් විසි අට (28) දෙනෙකුගේ ස්වතන්ත්‍ර කෘති මීට අයත් වන අතර කරුණාසේන ජයලත්, ඩබ්ලිව්. ඒ. සිල්වා, දර්ශනා ශම්මි විජේතිලක, මාර්ටින් වික්‍රමසිංහ සහ ලියනගේ අමරකීර්ති යන නවකතාකරුවන්ගේ කෘති වෙත පිළිවෙළින් වැඩි අවධානය යොමු වී තිබිණි. පරිවර්තන නවකතා අතරින් ඉංග්‍රීසි සහ රුසියානු කෘති අනෙක් භාෂා සාහිත්‍යයට සාපේක්ෂව බොහෝ ඉදිරියෙන් සිටි. එමෙන්ම මෙම සමස්ත කෘතිවලින් බහුතරයක් 2000 වර්ෂයෙන් පසු පළවූ කෘති බව පෙනේ. පිටකවරය පමණක් පළ කළ අවස්ථා 19 ක් ද, පිටකවරය සමඟ කෙටි සටහනක් දැක්වූ අවස්ථා 17 ක් ද, පිටකවරය සමඟ මධ්‍යස්ථ ප්‍රමාණයේ අදහස් දැක් වූ අවස්ථා 21 ක් ද, දීර්ඝ විවරණයක් කළ අවස්ථා 23 ක් ද වශයෙන් ප්‍රවර්ධනයේ මට්ටම හඳුනාගත හැකිය.

[1] නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, සාමය හා සංහිඳියාව පිළිබඳ අධ්‍යාපන ඒකකය, අධ්‍යාපන අමාත්‍යාංශය
himanthikumari@gmail.com

එමෙන්ම ශානරීය වශයෙන් ගත්විට සමාජ දේශපාලනික, ප්‍රේම සහ ඓතිහාසික නවකතා ප්‍රවර්ධනයට වැඩි උනන්දුවක් දක්වා ඇත. අධ්‍යයනයට ලක් වූ කාල පරාසය තුළ වරකට වඩා මෙම කණ්ඩායම්වල මුහුණු පොතේ පළ වූ නවකතා ද තිබේ. මෙලෙස දස වතාවකට වඩා ප්‍රවර්ධනයට බඳුන් වූ කෘති හතරකි. කන්ද උඩ ගින්දර, තී හා තා, තරු විසුළ රැය සහ අම්මා එම නවකතා වේ. මුහුණු පොතේ විශේෂ ලක්ෂණයක් වන්නේ පාඨක ප්‍රතිචාර සඳහා වැඩි අවස්ථාවක් පැවතීමය. එය හුදු කැමැත්ත සටහන් කිරීම (Like), අදහසක් පළ කිරීම (Comment) සහ බෙදාහදා ගැනීම (Share) ලෙස වර්ග කළ හැකිය. ඒ අනුව දස දෙනෙකුට වඩා කැමැත්ත සටහන් කර ඇති පොත් සංඛ්‍යාව 39කි. අදහසක් දක්වා ඇති කෘති ගණන 32කි. බෙදාහදා ගෙන ඇති කෘති ප්‍රමාණය 33කි. මේ අනුව පෙනී යන්නේ නවකතා කියවීම ප්‍රවර්ධනයේ දී මුහුණු පොතෙහි ක්‍රියාත්මක වන කියවීම් කණ්ඩායම් සුවිශාල දායකත්වයක් දක්වන බවය. විශේෂයෙන් ස්වකීය රුචිකත්ව මට්ටම අනුව මෙම ප්‍රවර්ධන කාර්යයට සම්බන්ධවීමට පාඨකයන්ට අවස්ථා බහුලව ලැබීම මෙහි දක්නට ඇති සාධනීය ලක්ෂණය වේ. මහජන සහ පාසල් පුස්තකාල පාඨකයන් මෙම කියවීම් කණ්ඩායම්වලට එක් වීමටත් විවිධ කෘති පිළිබඳ අදහස් පළ කිරීමටත් පෙළඹවීම මගින් නවකතා කියවීම ප්‍රවර්ධනය තවදුරටත් ව්‍යාප්ත කළ හැකිය.

**ප්‍රමුඛ පද :** ප්‍රබන්ධ, නවකතා, කියවීම ප්‍රවර්ධනය, මුහුණු පොත

# මට්ටක්කුලිය මහජන පුස්තකාලය මගින් ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට ගත් උත්සාහය පිළිබඳ අධ්‍යයනයක්

චාන්දනී සිල්වා[1]
එම්. එම්. එම්. ධනුෂ්කි දිල්හාරා[2]

මහජන පුස්තකාලයක් විසින් ප්‍රදේශයේ ජනතාව දැනුම්වත් කිරීමට විවිධ වැඩසටහන් සංවිධානය කරනු ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් පාඨක පිරිසගේ තොරතුරු අවශ්‍යතා විවිධ ක්‍රමවේද යටතේ සම්පූර්ණ වෙයි. එකී සේවා සැපයීම ද පළාත් පාලන ආයතන පුස්තකාල සතු වගකීමකි. වර්තමානයේ පුස්තකාලයක ඉලක්කය වනුයේ තොරතුරු, දැනුම ලබාදීම පමණක් ම නොවන අතර ප්‍රජාව සවිබල ගැන්වීම ද වේ. පුස්තකාලය යනු එදිනෙදා තොරතුරු සෙවීමට, දැනුම වැඩි කරගැනීම සහ විවිධ ප්‍රජාවගේ ප්‍රශ්න ගැටලුවලට විසඳුම් ලබාදෙන සම්පත් මධ්‍යස්ථානයකි. කොළඹ මහා නගර සභාවට අයත් කොළඹ මහජන පුස්තකාලයේ ශාඛාවක් වන මට්ටක්කුලිය මහජන පුස්තකාලය පිහිටා ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී පවුල් වැඩි සංඛ්‍යාවක් වෙසෙන ප්‍රදේශයකය. මෙහි මුළු ජනගහනය 40,000ක් පමණ වන අතර අඩු ආදායම් පවුල් 8,537ක් පමණ වාසය කරන බව සංඛ්‍යා ලේඛනවල සඳහන් වෙයි. මෙම පිරිසගෙන් සැලකිය යුතු පිරිසක් සේවය කරනුයේ මත්ස්‍ය වෙළෙඳපොළ හා මැනිං වෙළෙඳපොළෙහිය. මොවුන් වැඩි වශයෙන් නාටාමි රැකියාවේ නිරත වේ. පුස්තකාලයට පැමිණෙන කුඩා දරුවන් මෙම දෙමාපියන්ගේ දරුවන්ය. වර්තමානයේ ඉතාමත් ව්‍යසනකාරී ක්‍රියාවක් වන මත්ද්‍රව්‍ය භාවිතයට මෙම ප්‍රදේශයේ ජනතාව බහුල වශයෙන් ඇබ්බැහි වී ඇත. තම දෛනික වේතනය ශරීරයට අහිතකර මද්‍යසාර මිලදී ගැනීමට වැය කරයි. එය මෙම ප්‍රදේශයේ ජීවත් වන කාන්තාවන්ට සහ කුඩා දරුවන්ට විශාල ලෙස බලපෑම් එල්ල කරන ගැටලුවකි.මෙවැනි සමාජ ව්‍යසන හමුවේ ජනතාව දැනුම්වත් කිරීම පළාත් පාලන ආයතන පුස්තකාලවල ප්‍රජා සේවාවකි. ඒ අනුව ඒ සඳහා ක්‍රමවේද කීපයක් භාවිත කෙරිණි. පළමුව ප්‍රදේශයේ මෙම මද්‍යසාර භාවිතය අවම කිරීමට පුස්තකාලයේ දැන්වීම් පුවරුව උපයෝගී කරගන්නා ලදී. එයින් පාඨකයන් ආකර්ශනය වන අයුරින් ADIC ආයතනයෙන් ලබාදුන් දැන්වීම් හා පුස්තකාලය විසින් නිර්මාණය කළ පෝස්ටර් හා දැන්වීම් ප්‍රදර්ශනය කෙරිණි. දෙවනුව සමාජ මාධ්‍ය ඔස්සේ ඒවා ප්‍රචාරණය කරන ලදී.

1 පුස්තකාලයාධිපති I, මට්ටක්කුලිය මහජන පුස්තකාලය
ubliclibrarymattakkuliya@gmail.com
2 පුස්තකාල සහකාර III, මට්ටක්කුලිය මහජන පුස්තකාලය

එහිදී පුස්තකාලයේ වට්ස්ඇප් ගිණුම හා පුස්තකාලයේ මුහුණු පොත ගිණුම මගින් අදාළ දැන්වීම් ප්‍රචාරණය කෙරිණි. පර්යේෂණ අධ්‍යයනයේ ප්‍රතිඵල වශයෙන් දරුවන් මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ හා භාවිත නොකරන්නන්ගේ මුහුණේ ඇති වෙනස්කම් පැහැදිලිව හඳුනා ගන්නා ලදී. දරුවන් මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් දුටු විට ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා දීම. දරුවන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන හානි පිළිබඳ, මනා අවබෝධයක් ලබා ගැනීම, දරුවන්ගේ දෙමාපියන් හා ඥාති පිරිස් මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන හානි පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම, දරුවන් එය විවිධ ක්‍රියාකාරකම් ඇසුරෙන් තම මිතුරන් හා පවුල් සංස්ථාව තුළ ප්‍රචාරණය කිරීම, දරුවන් දෙමාපියන් දැනුවත් කළ පසු දෙමාපියන් මත්ද්‍රව්‍ය සඳහා වියදම් කළ මුදල් දරුවන්ගේ අභිවෘද්ධිය උදෙසා වියදම් කිරීම, තිරසර සංවර්ධන ඉලක්ක වන දිළිඳුකමෙන් මිදීම. කුසගින්නෙන් මිදීම. නිරෝගීකම හා යහපැවැත්ම හා ගුණාත්මක අධ්‍යාපනය යන ඉලක්කයන් වෙත සුළුවෙන් හෝ ළඟාවීමට හැකි වීම හඳුනාගත හැකි විය. මද්‍යසාර පිළිබඳ නිසි අවබෝධයක් දරුවන්ට ලබාදීම, දරුවන් එය පවුල් සංස්ථාව තුළ ප්‍රචාරණය කිරීම හා ඥාති පිරිස්, අසල්වාසීන් අතර ප්‍රචාරණය කර අවබෝධයක් ලබාදීම හරහා මෙම පණිවුඩය ගම තුළ ප්‍රචාරණය කිරීම මගින් මතින් තොර සමාජයක් ගොඩනැගීමට පුස්තකාලයට මැදිහත් විය හැකිබව නිගමනය විය. පුස්තකාලය මගින් ප්‍රදේශයේ ප්‍රජාවගේ ජීවන හා ආර්ථික ගැටලුවලට නිවැරදි උපදේශනයක් ලබාදීමෙන් විසඳුම් ලබාදිය හැකි බව නිගමනය විය. තම ශරීරයට සිදුවන හානිය පිළිබඳ නිවැරදි උපදේශනයක් ලැබීමෙන් පසු ඇතැම් පියවරුන් මද්‍යසාර භාවිතය ප්‍රමාණාත්මකව අඩු කර ඇති බව නිරීක්ෂණය විය.

**ප්‍රමුඛ පද :** මහජන පුස්තකාල සේවා, ව්‍යාප්ති සේවා, ප්‍රජා සේවා, මත්ද්‍රව්‍ය භාවිතය

# පාසල් පුස්තකාල පරිපාලනය විධිමත් කිරීම සඳහා විදුහල්පති භූමිකාවේ බලපෑම

ආර්. එම්. පී. ඩී. රත්නායක[1]

තොරතුරු ලබාගත හැකි මාධ්‍ය පුළුල්වීමත් සමඟ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පාසල් පුස්තකාලයට ප්‍රමුඛස්ථානයක් හිමි වී ඇත. සිසුන්ගේ තොරතුරු කුසලතා වර්ධනය, ඉගෙනුමේ දිගුවට සහායවීම, නව තාක්ෂණය භාවිත කරමින් සිසුන්ගේ කියවීම ප්‍රවර්ධනය කිරීම, විවේකය ඵලදායිව ගත කිරීමට හුරු කිරීම, රුචිකත්වය සහ රසවින්දනය ඉහළ නැංවීම පාසල් පුස්තකාලයේ මූලික කාර්යභාරය වේ. මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා පාසලේ ප්‍රධානියා වන විදුහල්පතිගේ පරිපාලන මැදිහත්වීම සහ නායකත්වය තීරණාත්මක සාධකයක් වේ. විදුහල්පතිවරුන්ගේ අත්දැකීම්, අධ්‍යාපනික සුදුසුකම්, සේවා පලපුරුද්ද සහ ආකල්ප අනුව පුස්තකාල පරිපාලනයට දක්වන දායකත්වය විවිධ මට්ටම්වල පවතී. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ පාසල් පුස්තකාලයේ පරිපාලනය විධිමත් කිරීමට විදුහල්පතිවරුන් කවරාකාර දායකත්වයක් සපයන්නේ දැයි විමසා බැලීමය. මෙහි නියැදිය ලෙස 1AB පාසල් 10 ක් තෝරා ගෙන ඇත. 1AB පාසලක් යනු අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ සඳහා විද්‍යා, කලා, වානිජ, තාක්ෂණ යන විෂය ධාරා සියල්ල උගන්වන පාසල්ය. ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ මගින් දත්ත එක්රැස් කරන ලදී. මෙහි ප්‍රධානතම අනාවරණය වූයේ පාසල් පුස්තකාලයේ කටයුතු කෙරෙහි විදුහල්පතිවරුන් දක්වන දායකත්වය සතුටුදායක මට්ටමක නොපවතින බවය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පාසල් පුස්තකාලයේ නූතන භූමිකාව පිළිබඳ ඔවුන්ගේ දැනුවත් බව යාවත්කාලීන වී නොතිබීමය. එමෙන්ම පුස්තකාලය පිළිබඳ පසුවිපරම් ප්‍රමාණවත්ව සිදු නොවන අතර අභ්‍යන්තර අධීක්ෂණය ද විධිමත්ව සිදු කිරීම අවම මට්ටමක පවතී. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමට නම්, පුස්තකාල හා ඉගෙනුම් ක්‍රියාවලිය අතර ශක්තිමත් සබඳතාවක් තිබීම අත්‍යවශ්‍ය වේ. විදුහල්පතිගේ අධීක්ෂණය සහ නායකත්වයෙන් තොරව එවන් ශක්තිමත් සබඳතාවක් ගොඩ නැංවීම දුෂ්කර වේ. එහෙයින් ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා පාසල් පුස්තකාලයේ භූමිකාව කෙරෙහි යාවත්කාලින දැනුවත්භාවයක් විදුහල්පතීන්ට ලබා දීමත් පාසලේ අභ්‍යන්තර අධීක්ෂණ කාල සටහනට පුස්තකාල අධීක්ෂණය ද ඇතුළත් කිරීමත් පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන්වල දී පුස්තකාල භාවිතයේ වැදගත්කම අවධාරණය කිරීමත් මගින් පාසල් පුස්තකාලයේ පරිපාලනය විධිමත් කිරීමට විදුහල්පතිට සක්‍රීය සහ ඵලදායී ආකාරයෙන් දායක වීමට හැකියාව ලැබේ.

ප්‍රමුඛ පද : විදුහල්පති භූමිකාව, පාසල් පුස්තකාලය, පුස්තකාල පරිපාලනය

[1] හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් පුස්තකාල සංවර්ධන ශාඛාව), අධ්‍යාපන අමාත්‍යාංශය
prajarathnayake@gmail.com

# පාසල් සිසුන්ගේ විෂය සාධනයට සහ මෘදු කුසලතා සංවර්ධනයට විවාද තරගාවලියෙන් ලද දායකත්වය (ගම්පහ මහජන පුස්තකාලය ඇසුරින්)

ඩී.ඩබ්. චන්ද්‍රිකා[1]

ගම්පහ යනු අධ්‍යාපනය සඳහා පාසල් ප්‍රජාව විශාල වශයෙන් පිවිසෙන නගරයකි. ඔවුන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීමේ දී ගම්පහ මහජන පුස්තකාලය සඳහා පැවරී ඇත්තේ සුවිශාල වගකීමකි. ගම්පහ දිස්ත්‍රික්කයේ පාසල්වල දරුවන් තුළ අධ්‍යයන ක්‍රියාවලියට පරිබාහිරව විවිධ විෂයාත්මක කරුණු සංවර්ධනය සඳහා අන්තර් පාසල් විවාද තරගාවලියක් සංවිධානය කෙරිණි. 2017 වර්ෂයේදී ගම්පහ මහා නගර සභා සීමාවේ පාසල් 08ක් පමණ සහභාගී කර ගනිමින් ආරම්භ වූ අන්තර් පාසල් විවාද තරගාවලිය 2019 වර්ෂයේ දී වඩාත් ව්‍යාප්ත කරමින් ගම්පහ දිස්ත්‍රික් අන්තර් පාසල් විවාද තරගාවලියක් ලෙස ගම්පහ දිස්ත්‍රික්කුයේ තිබෙන්නා වූ අධ්‍යාපන කලාප 04 නියෝජනය වන පරිදි රාජ්‍ය, අර්ධ රාජ්‍ය, ජාත්‍යන්තර වශයෙන් ඇති පාසල් 32ක නියෝජනයකින් යුතුව ඉතා උත්කර්ෂවත් අයුරින් දින 30ක දී තරග 32ක් පවත්වන ලදී. මෙම පර්යේෂණ අධ්‍යයනයේ අරමුණ වූයේ දරුවන්ගේ භාෂාමය හැකියාව, කාලය කළමනාකරණය, සන්නිවේදන කුසලතා, තර්ක ගොඩනැගීම හා කථිකත්වය දියුණු කිරීමේදී විවාද තරගාවලියක් මගින් ලැබෙන දායකත්වය කුමක්ද යන්න අධ්‍යයනය කිරීමයි. අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීමේ දී විෂය පාදක කරුණුවලට අමතරව බාහිර ක්‍රියාකාරකම්වල නියැලීමේදී පරිපූර්ණ දක්ෂතා සහිත දරුවෙකු නිර්මාණය කරගත හැකි අතර පාසල් මගින් ඒ සඳහා ලබා දෙන උත්ප්‍රේරණය අවම මටට්මක පවතී. මේ සඳහා මහජන පුස්තකාල මගින් ලබා දිය හැකි දායකත්වය ඉතා විශාල වන අතර ඒ අනුව මහජන පුස්තකාලයක් ලෙස විවාද තරගාවලියක් සංවිධානය කිරීමේ අවශ්‍යතාව වැදගත් බව නිරීක්ෂණය විය. ඒ අනුව ගම්පහ මහජන පුස්තකාලය මගින් සංවිධානය කරන ලද අන්තර් පාසල් විවාද තරගාවලිය ඒ සඳහා කුමන බලපෑමක් ඇතිකර ඇත්ද යන්න මෙහිදී නිරීක්ෂණය කරනු ලබන ප්‍රධාන ගැටලුවකි. සාම්ප්‍රදායික විවාද රාමුවට ඔබ්බෙන් ගොස් සෑම තරගයක්ම තරග වට 03කින්, එක් තරගයක් විනාඩි 72ක කාලයකින් යුතුව යෝජක හා ප්‍රතියෝජක ලෙස ලැබෙන්නා වූ මාතෘකාව යටතේ විනාඩි 36ක් දරුවන්ගේ හැකියාවන් ප්‍රධාන ක්‍රම 04ක් ඔස්සේ තරග පුරාම නිරීක්ෂණය විය. ඒ සඳහා දරුවන් භාෂාමය හැකියාවන් ප්‍රදර්ශනය කරන ආකාරය, නියමිත කාලයේ

[1] පුස්තකාලයාධිපති, ගම්පහ මහජන පුස්තකාලය
gmp.publiclibrary@gmail.com

දී තාර්කිකව කරුණු ඉදිරිපත් කිරීම හා සන්නිවේදන හැකියාව ප්‍රදර්ශනය කරන ආකාරය පිළිබඳ 0 - 100 අතර ලකුණු පරාසය මඟින් ඇගයීම සිදුකරන ලදී. එම සෑම වටයකට ප්‍රථම සම්පාදක රැස්වීමක් තුළින් තරග මාතෘකාව හඳුන්වා දී සති 02ක කාලයක් තොරතුරු එක්රැස් කිරීම සඳහා කාලය ලබා දෙන ලදී. එමෙන්ම ඒ සඳහා පොත්, පුවත්පත්, සඟරා, රූපසටහන්වලට අමතරව ස්මාර්ට් දුරකථන, ටැබ් යන්ත්‍ර, ලැප්ටොප් යන්ත්‍ර ආධාරයෙන් ඕනෑම තොරතුරක් ලබා ගැනීමට සහ තරග මාතෘකාවට අදාළව ඉදිරිපත් කිරීමේ විලාසිතාව පෙන්වීම සඳහා අවශ්‍ය පහසුකම් සහ අන්තර්ජාල පහසුකම් ද ලබාදෙන ලදී. මෙම ක්‍රමවේදය අනුව වසරින් වසර පාසල් සිසුන්ගේ කුසලතා වර්ධනය වීම නිරීක්ෂණය කරන ලදී. මෙහි ප්‍රතිඵල මෙසේ සම්පිණ්ඩනය කළ හැකිය. සහභාගී වූ දරුවන්ගෙන් 90% ක් සන්නිවේදනය සඳහා ලබාගන්නා ලකුණු 2017ට සාපේක්ෂව සෙසු වර්ෂවල වැඩිවීම, කාලය කළමනාකරණය සිදු කිරීමේදී 65% දරුවන් වි. 05 ඇතුළත අදාළ කරුණු උපරිමව ඉදිරිපත් කිරීම නිරීක්ෂණය විම, දරුවන්ගේ භාෂා හැකියාව (85%) වර්ධනය වීම, ජය පරාජය කුමන කණ්ඩායමට හිමි වුවත් සෑම කණ්ඩායමක ම විවාදකයන් හට තොරතුරු විශාල ප්‍රමාණයක් පුස්තකාලයේ පොත්පත්, සඟරා, අන්තර්ජාලයෙන් මෙන්ම තරග මාතෘකාව අදාළ වන රජයේ ආයතන මඟින් ද එක් රැස් කරගැනීමට හැකිවීම, පුස්තකාල පාඨක සංඛ්‍යාව වර්ධනය කර ගැනීමට හැකිවීම මෙයින් ලද ප්‍රතිඵල වේ. තවද, 2019 වර්ෂයේදී සහභාගී වූ සියලුම පාසල්වල විවාදකයින් බහුතරයක් 2020 අ.පො.ස. උ/පෙළ විභාගය සඳහා පෙනීසිටි අතර ඔවුන් සියලු දෙනාම රජයේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් වූ අතර ඔවුන් සියලු දෙනාම එක් එක් විශ්වවිද්‍යාලයන්හි විවාද කණ්ඩායම් වෙනුවෙන්ද තම දයකත්වය ලබා දීම සුවිශේෂි කරුණකි. 2030 වර්ෂයේ දී තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීම සඳහා අධ්‍යාපනික වශයෙන් මහජන පුස්තකාලවලට සෘජුවම දායක විය හැකි බව මෙයින් පැහැදිලි වේ.

**ප්‍රමුඛ පද :** විවාද තරග, මෘදු කුසලතා, සන්නිවේදන කුසලතා

# මහජන පුස්තකාල පාඨකයන්ගේ ප්‍රබන්ධ කියවීමේ රුචිකත්වය පිළිබඳ අධ්‍යයනයක්

එච්. ඩබ්ලිව්. ඉන්දිකා දිශාන්ති[1]

මහජන පුස්තකාලවල එකතු සංවර්ධනයේ දී ප්‍රබන්ධ එකතුව වෙත විශේෂ අවධානයක් යොමු වේ. එයට හේතුව මහජන පුස්තකාලවල එකතු අතරින් වැඩි වශයෙන් ම පරිහරණය වන එකතුව එය වීමය. එමෙන්ම ප්‍රජාවගේ රසවින්දනාත්මක කියවීම ප්‍රවර්ධනය කිරිම මහජන පුස්තකාලයක මූලික කාර්යයක් බව පොදුවේ පිළිගැනෙන හෙයිනි. සමබර පෞරුෂයක් සහිත පුරවැසියන් බිහි කිරීමේ දී වින්දනාත්මක කියවීම අත්‍යවශ්‍ය සාධකයක් වේ. එම නිසා මහජන පුස්තකාලයේ ප්‍රබන්ධ එකතුව සංවර්ධනය කිරීමේදී යොමු විය යුතු දිශානතීන් පිළිබඳ යථාර්ථවාදී අවබෝධයක් පුස්තකාලයාධිපතීන්ට පැවතීම අත්‍යවශ්‍ය වේ. පාඨකයන් විසින් ගාල්ල ආචාර්ය රිචඩ් පතිරණ මහජන පුස්තකාලයේ ප්‍රබන්ධ එකතුව පරිහරණය කරන ආකාරය විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙම පර්යේෂණය සමීක්ෂණ ක්‍රමවේදය භාවිතයෙන් සිදුකරන ලද අතර පාඨකයන් පනස් දෙනෙකුගේ (50) නියැදියක් යොදා ගන්නා ලදී. එනම්, කාන්තා සහ පිරිමි පාඨකයන් 25 බැගිනි. මෙලෙස තෝරා ගන්නා ලද නියැදියේ සියල්ලන්ම වයස අවුරුදු 18 ඉක්මවූවන් වේ. එමෙන්ම ඔවුන් සැවොම අ.පො.ස. (සා.පෙ) හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලද්දවුන්ය. නියැදියේ ප්‍රතිචාරවලට අනුව, ප්‍රබන්ධ සාහිත්‍ය ශානර අතරින් බහුතරයක් (50%) කැමැත්ත දක්වා ඇත්තේ නවකතා කියවීමටය. අවම නැඹුරුවක් (8%) දක්වනුයේ පද්‍ය කෘති කියවීමටය. නවකතා කියවීමේ දී පාඨක රුචිකත්වය ප්‍රධාන වශයෙන් නවකතාවල උපශානරිය ස්වභාවය මත රඳා පවතී. ප්‍රේම ශානරයේ නවකතා කියවීමට නියැදියෙන් වැඩි පිරිසක් (25%) රුචියක් දක්වන අතර පිළිවෙළින් මායා (20%) සහ විද්‍යා ප්‍රබන්ධ (18%) ඔවුන්ගේ ඊළඟ තෝරා ගැනීම වේ. පරිවර්තන ප්‍රබන්ධ කියවීමේ දී ඉංග්‍රීසි සාහිත්‍ය වෙත බෙහෙවින් වැඩි නැඹුරුවක් (90%) පවතී. එමෙන්ම පරිවර්තන ප්‍රබන්ධවලට වඩා ස්වතන්ත්‍ර ප්‍රබන්ධවලට වැඩි කැමැත්තක් දැක්වීම ද හඳුනාගත හැකිය. තවද සම්මානලාභී ප්‍රබන්ධ කෘති කියවීමට දක්වන රුචිය ද විශේෂ ලක්ෂණයකි. ශ්‍රී ලංකාව තුළ සාහිත්‍ය සම්මාන උත්සව ගණනාවක් වාර්ෂිකව පවත්වනු ලබන අතර ඒවායේ අවසන් වටයට නිර්දේශ වන සහ ජයග්‍රහණය කරනු ලබන කෘති වෙත වැඩි පාඨක අවධානයක් යොමු වන බව මෙම පර්යේෂණයේ

1 පුස්තකාලයාධිපති, ආචාර්ය රිචඩ් පතිරණ මහජන පුස්තකාලය, ගාල්ල
indikadishanthi@gmail.com

අනාවරණයන්ගෙන් ද තහවුරු වේ. නියැදියේ ප්‍රබන්ධ කියවීමේ චර්යාව සලකා බැලූ විට පෙනී යන්නේ 50% සතියකට වරක් ප්‍රබන්ධ කෘතියක් කියවීමේ යෙදෙන බවය. එමෙන්ම දිනකට පැයක් පමණ ඒ සඳහා කාලය වෙන් කරන පිරිස 60%කි. ප්‍රතිචාරිකයන් බොහෝ දෙනෙක් (80%) කියවීමට අවශ්‍ය ප්‍රබන්ධ තෝරා ගැනීමේ දී මිතුරන්ගේ හෝ විචාරකයන්ගේ නිර්දේශවලට වඩා ස්වයං තේරීමට කැමැත්තක් දක්වති. මෙම විශ්ලේෂණයට අනුව පැහැදිලි වන්නේ පාඨක රුචිකත්වයේ ශානරිය විවිධත්වය මෙන් ම පරිවර්තිත ප්‍රබන්ධ පිළිබඳ රුචිකත්වයේ විවිධත්වය ද පහළ මට්ටමක පවත්නා බවය. එහෙයින් මහජන පුස්තකාල විසින් ක්‍රියාත්මක කරනු ලබන කියවීම් ප්‍රවර්ධන වැඩසටහන්වල දී මෙම තත්ත්වය මඟහරවා ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාමාර්ග ගැනීම සුදුසු වේ.

**ප්‍රමුඛ පද :** ප්‍රබන්ධ, කියවීමේ රුචිකත්වය, මහජන පුස්තකාල, සාහිත්‍ය ශානර

# Technical Session - 04

**Track : Library Services and Information Technology**

| | | |
|---|---|---|
| **Session Chair** | **:** | Dr. S.K. Illangarathne<br>Librarian<br>Bhiksu University of Sri Lanka |
| **Rapporteur** | **:** | Mrs. Kusala Sajeewani, Assistant Librarian,<br>Gampaha Wickramarachchi University of<br>Indigenous Medicine, Yakkala |

# සම්මිශ්‍රිත ඉගෙනුම් ක්‍රමවේදයේ දී (Blended Learning Method) ඉ - තක්සලාව ඉගෙනුම් මෙවලමක් ලෙස ව්‍යවහාර කිරීම

සුමුදු වාසනා විජේසූරිය[1]

පාසල් පද්ධතිය තුළ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අධ්‍යාපනික තාක්ෂණය වෙත වැඩි නැඹුරුවක් දැක්වීම වර්තමානයේ බොහෝ රටවල දක්නට ලැබෙන ලක්ෂණයකි. ශ්‍රී ලංකාවේ ද මේ සඳහා භෞතික පහසුකම් ලබාදීම සැලකිය යුතු සංවර්ධනාත්මක මට්ටමක් අත් කර ගෙන ඇත. මෙලෙස ලබා දෙනු ලබන පරිගණක සහ උපාංග, විෂයානුබද්ධ තාක්ෂණික මෙවලම්, තාක්ෂණික මෙවලම් භාවිතය සඳහා වූ උපදෙස් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ඵලදායි ලෙස අවශෝෂණය කර ගැනීමට නිශ්චිත, අනුමත සෛද්ධාන්තික සහ ප්‍රායෝගික රාමුවක් හඳුන්වා දිය යුතු වේ. ඒ සඳහා අන්තර්ජාතික වශයෙන් පවත්නා සම්මිශ්‍රිත ඉගෙනුම් ප්‍රවේශය ශ්‍රී ලංකාවට ගැලපෙන පරිදි අනුගත කර ගැනීම අවශ්‍යය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ සම්මිශ්‍රිත ඉගෙනුම් ක්‍රමවේදයේ දී ඉගෙනුම් මෙවලමක් ලෙස ඉ- තක්සලාව යනුවෙන් හඳුන්වන ඉගෙනුම් අන්තර්ගත කළමනාකරණ පද්ධතියේ භාවිතය විශ්ලේෂණය කිරීම වේ. මෙහිදී සම්පරීක්ෂණ ක්‍රමවේදය භාවිත කරන ලද අතර ප්‍රායෝගිකව පංතිකාමර ඉගැන්වීමට ඉ - තක්සලාව යොදා ගැණිනි. ඒ අනුව පාසල් වාරයක් තුළ තොරතුරු තාක්ෂණ විෂය සඳහා පවත්නා කාල සටහන යොදා ගන්නා ලදී. නියැදිය ලෙස සිසුන් 40 ක් සහ ගුරුවරුන් 20ක් යොදා ගන්නා ලද අතර ඔවුන්ගේ පශ්චාත් ඇගයීම් ලකුණු සහ ප්‍රශ්නාවලියක් මගින් ලබා ගත් ප්‍රතිපෝෂණ ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කෙරිණි. දත්ත විශ්ලේෂණය බහුප්‍රතිපායන විශ්ලේෂණය භාවිතයෙන් සිදු කරන ලදී. එමෙන්ම සමාන පරිගණක විද්‍යාගාර පහසුකම් සහිත පාසල්වල ගුරුවරුන් සහ සිසුන් මේ සඳහා තෝරා ගැණිනි. විචල්‍යයන් හයක් යොදා ගනිමින් කල්පිත පරීක්ෂාව සිදු කෙරිණි. මෙහිදී ශිෂ්‍ය සාධන මට්ටම වැඩිවීම කෙරෙහි ඉ-තක්සලාව පරිශීලනය කරමින් බුද්ධිය මෙහෙයවා කරනු ලබන විශ්ලේෂණාත්මක ඉගෙනුමත් මෙම අන්තර්ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරයේ දී සිසුන් තුළ ගොඩනැගෙන අභිප්‍රේරණයත් ස්වාධීන ඉගෙනුම් චින්තනය මත ගොඩ නැගෙන ආත්ම අභිමානයත් ධනාත්මකව බලපාන බව තහවුරු විය. ශිෂ්‍ය සාධන මට්ටම වැඩිවීම කෙරෙහි සිසුන් ඉ-තක්සලාව භාවිත කිරිම මගින් ඇති වන විශ්වාසය ධනාත්මක වේ යැයි ගොඩනැංවූ කල්පිතය ප්‍රතික්ෂේප විය.

[1] නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය
sumudusleas@gmail.com

මේ අනුව ඉ-තක්සලාව අන්තර්ගත ඉගැන්වීම් කළමනාකරණ පද්ධතිය භාවිතයෙන් පංතිකාමරය තුළ ක්‍රියාත්මක කරන ලද ඉගෙනුම් ක්‍රියාවලිය සාධනීය බව සනාථ කෙරිණි. එහෙයින් මෙම ඉගෙනුම් ක්‍රමවේදය පිළිබඳ විධිමත් උපදෙස් පාසල් පද්ධතිය වෙත සැපයීමත් මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා අඛණ්ඩ හා පුහුණු සැලැස්මක් සකස් කිරීමත් මෙම ඉගෙනුම් ක්‍රමවේදය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීමත් ඊට අදාළ ප්‍රතිපත්තිමය රාමුව සවිමත් කිරීමත් සුදුසු බව නිර්දේශ කෙරේ.

**ප්‍රමුඛ පද** : ඉගෙනුම් ක්‍රමවේද, සම්මිශ්‍රිත ඉගෙනුම, ඉ-තක්සලාව, ශිෂ්‍ය සාධනය

# The research articles on palm leaf manuscripts in Sri Lanka : a bibliomertic study using Google Scholar articles published during 2015-2022

H. U. C. S Kumara[1], H. D. M.Nishanthi[2],
J.G.Chandani[3], K.W.A.M. Konpola[4]

Palm leaf manuscripts are one of the oldest written forms found in Sri Lanka. Palm leaf manuscripts can be found throughout Sri Lanka in temples, monasteries, national museums, national archives, national libraries, university libraries, and special libraries. Bibliometric analysis is the application of statistical and mathematical tools to books and media communication. The statistical analysis of written publications, such as books, articles, or other publications, is known as bibliometric analysis. In the field of library and information science, as well as in other fields, library statistics are often used to provide quantitative analysis of academic research. This bibliometric study focuses on the research articles based on palm leaf manuscripts in Sri Lanka. The objectives of the study were to identify the annual growth of research publications, examine authorship patterns, and identify the most cited articles in palm leaf manuscripts in Sri Lanka during 2015-2022. Additionally, this study was used to identify the affiliation with the highest number of publications on palm leaf manuscripts in Sri Lanka and to analyze the most popular keywords in the publications. The study examined 36 research articles based on Sri Lankan palm leaf manuscriptsthat were published in Google Scholar between 2015 and 2022 and used bibliometric methodology to analyze the data. The Google Scholar advanced searching techniques were used to obtain data from Google Scholar with keywords including “palm leaf manuscript," “Sri Lanka," “Ola leaf manuscript," and “Sri Lanka." VOS viewer software and the Excel package were used to analyze and visualize the data in the study.

[1, 2, 3, 4] Senior Assistant Librarian, University of Sri Jayewardenepura
kumara@sjp.ac.lk /nishanthi@sjp.ac.lk /
chandani@sjp.ac.lk / anura@sjp.ac.lk

According to the visualization data, the highest number of articles was published in 2016, 2017, 2019 and 2021, with 6 (17%) each. Most of the research in this field was carried out by individual authors. Of these, 19 (53%) were published by individual authors and 17 (47%) with co-authors. The results of this study have shown that “Sri Lanka” (30) and “Palm Leaf Manuscript” (33) are the strongest keywords of general link strength. Padmasiri G. R. was the author who the highest citations (12 citations) in his publication had titled “Management of indigenous knowledge in Sri Lanka, with special reference to indigenous medicine”. The most significant affiliation was the University of Kelaniya, which had the highest number of publications.

**Keywords:** Bibliometric Analysis, Palm leaf manuscripts, Ola leaf manuscripts, Google Scholar, VOSviewer

# A study of the use of RFID technology for securing university libraries in Sri Lanka

W.R.N Indrachapa[1]

The library is a growing organism. As it grows in size, so do the problems related to document maintenance and security. RFID technology is one of the best technologies available for security in libraries. RFID (Radio Frequency Identification) for libraries refers to the use of RFID technology to manage and track library materials. It involves tagging library items with RFID tags containing unique identification information and installing RFID readers and antennas in libraries to detect and track these items. RFID technology offers several benefits for libraries. There are Efficient Inventory Management, Streamlined Check-in and Check-out, Enhanced Security, Improved Patron Experience, Space Optimization, and Automation of Routine Tasks. RFID technology offers libraries a range of benefits, including improved operational efficiency, enhanced security, and a better experience for patrons. The problem of this study was whether RFID technology is used to secure university libraries. The main objective of this study was to identify the use of RFID technology in securing university libraries. All the university libraries in Sri Lanka were the population of this study and government university libraries (17) under the University Grants Commission (UGC) were selected as the sample of this study. Data was collected using questionnaire methods. According to the collected data analysis, Only 2 libraries use RFID technology from the selected sample. Other 15 libraries do not use RFID technology however they use other securing systems. Lack of budget allocation, existing system, lack of trained staff, privacy concerns, security issues, and compatibility issues were found to be the main reasons for not using RFID technology. Suggestions for mitigating this problem include cost-benefit analysis, funding allocation, staff training, privacy and security measures, success stories, and showcasing collaboration and partnerships.

**Keywords:** Libraries, university library, library securing, RFID technology

[1] Assistant librarian, CINEC Campus
nayananjalee.indrachapa@cinec.edu

# Navigating personal name headings: challenges in online Public Access Catalogues (OPACs) at the University of Kelaniya and the University of Colombo

W.M.T.A.P. Wasala[1]

Libraries employ the Online Public Access Catalogue (OPAC) to give users free access to many resources in the modern digital era. Authority control is essential to the establishment of these resources in libraries. Using personal names in authority control makes identifying authors, contributors, and other people associated with library materials simple and improves information retrieval. It also makes it easier for users to engage with various databases and library systems and to share information. The need for more authority control in libraries makes writing Sinhala personal names in English more challenging. The problem was identifying the Authority controlling issues arising in the OPACs in the university libraries in Kelaniya and Colombo. Personal names were searched in both libraries' OPACs using an observation tool. In the OPACs, authority control was observed using twenty Sinhala author names transliteration in English by time constraints. SPSS was used to analyse and visualise the collected data. It has been found that the authors' names have been used in multiple ways. Problems in dividing the verses of personal names and transliteration problems from Sinhala to English were identified issues from OPACs. Some personal names have been placed in Sinhala and English for the same author. Using the personal name authority to control documents published by the National Library and Documentation Service Board is an option to reduce issues in personal names in OPACs at the university, public, and special library levels. By creating a union or centralized catalogue for all libraries and conducting workshops for the librarians, libraries can improve the legitimacy and Authority of their services. It is also crucial to reduce problems with personal names in OPACs.

**Keywords:** Personal Names, Authority Control, Online Public Access Catalogue, Issues in personal names, Authority controlling in Personal names

[1] Librarian, Law and Society Trust, Colombo
aroshaprabhashwari@gmail.com

# මාර්ගගත පොදු ප්‍රවේශ සූචියේ භාවිතය පිළිබඳ අධ්‍යයනයක් කැලණිය විශ්වවිද්‍යාලයේ තෙවන වසර විද්‍යාර්ථීන් ඇසුරින්

ඉරේෂා මධුමාලි[1]

පරිගණකය පුස්තකාල ක්ෂේත්‍රයට සම්ප්‍රාප්ත විම මත පරිගණකසූචිය බිහිවිමේ ප්‍රතිඵලයක් ලෙස මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය (Online Public Access Catalogue) බිහි විය. ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල පුස්තකාල පද්ධතිය තුළ ද සූචිකරණයේ නව ප්‍රවණතාව වන මාර්ගගත පොදු ප්‍රවේශන සූචිය වර්තමානයේ දි භාවිත කරනු ලබයි. මෙම පර්යේෂණයේ අරමුණු ලෙස, විද්‍යාර්ථීන් OPAC පිළිබඳ පවත්නා දැනුවත්භාවය පිළිබඳ අධ්‍යයනය කිරිම, විද්‍යාර්ථීන් OPAC භාවිත කිරිමේ අරමුණු අධ්‍යයනය කිරිම, විද්‍යාර්ථීන් OPAC ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සෙවිමේදි මුහුණ දෙන ගැටලු පිළිබඳ අධ්‍යයනය කිරිම සහ එම ගැටලු විසඳීම සඳහා විසඳුම් යෝජනා ඉදිරිපත් කිරීම දැක්විය හැකිය. කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් මෙම පර්යේෂණය සඳහා සංගහනය ලෙස යොදා ගැනුන අතර ඒ අතුරින් සරල අහඹු නියැදි ක්‍රමය යොදාගනිමින් කැලණිය විශ්වවිද්‍යාලයේ තෙවන වසර විද්‍යාර්ථීන් 100 නියැදිය ලෙස තෝරාගන්නා ලදි. දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයේ දී ප්‍රාථමික දත්ත ලෙස සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි, නිරීක්ෂණයන් ක්‍රමවේද භාවිත කරන ලදී. ලබාගත් තොරතුරු SPSS මෘදුකාංගය  භාවිත කරමින් ප්‍රස්තාර සටහන් ඔස්සේ සහ වගු සටහන් ඔස්සේ විශ්ලේෂණය කරන ලදී. පර්යේෂණ ප්‍රතිඵල ලෙස, 85% ක පාඨක ප්‍රතිශතයක් OPAC පිළිබඳව දැනුවත්භාවයෙන් යුක්ත අතර 15%ක පිරිසක් OPAC පිළිබඳ දැනුවත්භාවයක් නොමැතිබව හඳුනාගන්නා ලදී. OPAC අන්තර්ජාල පහසුකම් සහිත ඕනෑම ස්ථානයක සිට ප්‍රවේශ විය හැකි ගවේෂණ උපක්‍රමයක් ලෙස 63%ක පිරිසක් දැනුවත්භාවයෙන් යුක්ත අතර 37% දැනුවත්භාවයක් නොමැතිබව අනාවරණය විය. අන්තර්ජාල පහසුකම් සහිත ඕනෑම ස්ථානයක සිට OPAC භාවිත කළ හැකි ආකාර පිළිබඳ දැනුවත් වු ක්‍රම අතර පළමු වසරේදී ලබා දෙන උපදේශන පාඨමාලාව මගින් 55.55%, පුස්තකාලය මගින් ලබාදෙන පාඨක අධ්‍යාපන වැඩසටහන් මගින් 9.52%, පුස්තකාල කාර්ය මණ්ඩලයෙන් විමසීම මගින් 7.93%, හිතවතෙකු මාර්ගයෙන් 11.11%, ස්වයං පරිශීලනයෙන් 7.93%, ආචාර්යවරයෙකු මාර්ගයෙන් 4.76% දැනුවත් වු බව හඳුනාගන්නා ලදී.

[1] පුස්තකාලයාධිපති,බණ්ඩාරනායක අනුස්මරණ පුස්තකාලය සහ සංස්කෘතික මධ්‍යස්ථානය, නිට්ටඹුව
madhumaliiresha80@gmail.com

විද්‍යාර්ථීන් OPAC මගින් අපේක්ෂිත ප්‍රයෝජන අතර 51% පිරිසක් අදාළ තොරතුරු මූලාශ්‍රය පුස්තකාලයෙහි තිබේද යන්න සොයා ගැනීම අරමුණු කරන බව ද 76% ක් පොත රාක්ක ගත වී ඇති ස්ථානය සොයා ගැනීමට OPAC භාවිත කරන බව පැහැදිලි විය. පාඨකයන් විසින් කරනු ලබන සෙවීම් ක්‍රම අධ්‍යයනය කිරීමේදී කර්තෘ නාමයෙන් 32.25%, ග්‍රන්ථ නාමයෙන් 44.87%, විෂය නාමයෙන් 10.89% ගවේෂණය කරන බව හඳුනාගන්නා ලදී. OPAC භාවිත කිරීමේදී විද්‍යාර්ථීන් විසින් විවිධ ගැටලු, අභියෝග ලෙස, ග්‍රන්ථ පිළිබඳ වැරදි තොරතුරු ලැබීම, OPAC පරීක්ෂා කිරීමට ඇති පරිගණක ප්‍රමාණවත් නොවීම, සංකීර්ණ ගවේෂණ ක්‍රම, තාක්ෂණික බාධා, ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරුවල ප්‍රමිති සහගත බවක් නොවීම, ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත භාවිතයේ දී පැන නගින ගැටලු ආදිය දක්වා ඇත. OPAC පිළිබඳ හඳුන්වාදීමේ වැඩසටහන් නිරන්තරයෙන් පැවැත්වීම, විද්වත් වශයෙන් ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු භාවිත කිරීම සඳහා අවශ්‍ය පිළියම් භාවිත කිරීම අත්‍යවශ්‍ය බව හඳුනාගත් අතර ඒ සඳහා ප්‍රමිතිගත ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු භාවිතය, සාධිකාරී ගොනු පවත්වාගෙන යාම ආදී ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය බව මෙහිදී පෙන්වා දිය හැකිය.

**ප්‍රමුඛ පද :** මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය, සූචිකරණය, විද්‍යාර්ථීන්

# කැස්බෑවුන් පිළිබඳ අතථ්‍ය පුස්තකාලයක් (Virtual Library) නිර්මාණය කිරීම

ටි.එම්.පි. වික්‍රමතිලක[1]
කේ.ඒ.ඩි.ඒ.ඩි. ගුණරත්න[2]

ලෝකයේ උරග (Reptiles) කුලකයට අයත් එක් විශේෂයක් ලෙස සැලකෙන කැස්බෑවුන්ගේ (Turtles) ඉතිහාසය අවුරුදු මිලියන 150 පමණ ඈතට දිවයයි . දැනට වඳ වී යාමේ තර්ජනයට ලක් ව ඇති මොවුන් පිළිබඳව තොරතුරු එකතුවක්, අතථ්‍ය පුස්තකාලයක් ආකාරයෙන් නිර්මාණය කිරීම මෙහි දී සිදු වේ. අන්තර්ජාලය තුළින් විද්‍යුත් ස්වරූපයෙන් ලබා ගත හැකි කළමනාකරණය කරන ලද තොරතුරු සම්පත් සහ සේවාවන්ගේ එකතුවක් ලෙස සරලව අතථ්‍ය පුස්තකාලය යන්න නිර්වචනය කළ හැකිය. මෙම පර්යේෂණ අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ මුද්‍රිත මාධ්‍යයෙන් පවතින තොරතුරු සම්පත් සංඛ්‍යාංකකරණය (Digitization) මගින් සහ විද්‍යුත් තොරතුරු වර්ගීකරණයට ලක් කිරීමෙන් කැස්බෑවුන් පිළිබඳ පරිශීලනය කරන ඕනෑම අයෙකුට ප්‍රවේශ සැපයීම සඳහා අතථ්‍ය පුස්තකාලයක් සංවිධානය කිරීමයි. ලංකාවේ අතථ්‍ය පුස්තකාල නිර්මාණය කිරීමට ජාතික විද්‍යා පදනම සැලකිය යුතු කාර්යයභාරයක් ඉටු කරන අතර, අප සතුව තිබෙන තාක්ෂණික දැනුම ප්‍රමාණවත් නොමැති නිසාවෙන් මෙම අතථ්‍ය පුස්තකාලය නිර්මාණය කිරීමේදී මෘදුකාංග තෝරා ගැනීම (Selection of Software), අවශ්‍යතාව අනුව එය වෙනස්කම්වලට ලක් කිරීම (Customization of Software), මුද්‍රිත සංලේඛවලට අදාළ දත්ත ආදානය කිරීම (Data Input), ප්‍රධාන ලේඛනය උඩුගත කිරීම (Uploading), තොරතුරු සමුද්ධරණ කටයුතු සඳහා බීජ පද නිර්මාණය (Compilation of Key Words for Data Retrieval), පසු මෙහෙයුම් සිදු කිරීම (Post Operations) ආදී තාක්ෂණික කටයුතු සිදු කරනු ලබයි. ඒ අනුව තාක්ෂණික පැතිකඩ ජාතික විද්‍යා පදනම මගිනුත් පුස්තකාල විද්‍යා පැතිකඩ පර්යේෂකයන් විසිනුත් සිදු කරනු ලබයි. මෙහිදී පළමුව අතථ්‍ය පුස්තකාලය සඳහා අවශ්‍ය තොරතුරු හඳුනා ගැනීම සිදු කරන ලදී. අතථ්‍ය පුස්තකාලය සංවිධානය සඳහා අවශ්‍ය විද්‍යුත් පොත්, පත්‍රිකා, සඟරා සහ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ආදී තොරතුරු වර්ගීකරණයට ලක් කළ අතර, මුද්‍රිත තොරතුරු වර්ගීකරණය කිරීමේ දී දුර්ලභ, එනම් සංරක්ෂණය කළ යුතු ලේඛන, ප්‍රකාශන හිමිකම් නීතිය යටතේ ගැටලුවක් ඇති නොවන ලේඛන (Open Access) හා ආයතනික ප්‍රකාශන (Institutional Publications) සඳහා නිසි අවසරය ලබා ගෙන ප්‍රමුඛත්වයක් ලබා

[1] පුස්තකාලයාධිපති, ලංකා හයිඩ්‍රොලික් ආයතනය, රත්මලාන
manohawickrama@gmail.com

[2] පුස්තකාලයාධිපති, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය, මට්ටක්කුලිය
iamaruna123@gmail.com

දෙන ලදී. භෞතික තොරතුරු එකතුව නිවැරදිව ක්‍රමානුකූලව සකස් කිරීම, ද්විත්වකරණය වී ඇති තොරතුරු සම්පත් හඳුනා ගෙන ඒවා ඉවත් කිරීම, ගොඩනැගෙන තොරතුරු එකතුවෙහි ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත වෙනම ලේඛනගත කිරීම සහ එම තොරතුරු උඩුගත කිරීමේ දී ඒවා ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත අනුව සූචිකරණ සම්මතයන්ට අනුව සිදු කිරීමටත්, නැවත බා ගත කිරීමටත් පහසු පරිදි සකස් කිරීමටත් ජාතික විද්‍යා පදනමට ලබා දේ. සේවක පාඨක අතුරු මුහුණත් (Staff User Interface) වරින් වර පරීක්ෂා කරමින්, පවතින දෝෂ නිරාකරණය කරමින් වඩා හොඳ අතථ්‍ය පුස්තකාලයක් නිර්මාණය කිරීමට බලාපොරොත්තු වේ. අතථ්‍ය පුස්තකාලයට ප්‍රවේශ වීම සඳහා විශ්වීය සම්පත් ස්ථානගතකරණය (Uniform Resource Locator-URL) හා ඊට අයත් පරිශීලක ලියාපදිංචිය (User Registration) සහ මුර පද (Passwords) ඉහත කී මෘදුකාංගය මගින් කරනු ලබයි. අතථ්‍ය පුස්තකාලයට දෙස් විදෙස් පරිශීලකයන්ට පිවිසිය හැකි අතර එම තොරතුරු වාණිජමය අරමුණු සහිත පිරිස් විසින් ලබා ගැනීමට අදාළ නෛතික තත්ත්වය හා බුද්ධිමය දේපළ සම්බන්ධ කරුණු ද නිරීක්ෂණය කෙරිණි. විද්‍යුත් ලේඛන බාගත කිරීමේදී (Downloading) අවසර ලබා ගැනීමේ ක්‍රියාවලියක් සකස් කිරීම අත්‍යවශ්‍ය වේ. මෙය අතථ්‍ය පුස්තකාලයක් බැවින් ලෝකයේ ඕනෑම කෙනෙකුට සාමාජිකත්වය ලබා ගැනීමට හැකියාව හිමිවන අතර එහිදී මෙම පුස්තකාලය නිර්මාණය කරන ප්‍රධාන භාෂාව ලෙස ඉංග්‍රීසි භාෂාව තෝරා ගනු ලබන අතර මේ වටා එක් රොක්වන සාමාජිකයන් ගණනය කිරීමට විද්‍යුත් දත්ත පදනමක් (Electronic Database) යටතේ කටයුතු සම්පාදනය කරනු අතර පරිශීලකයන්ට වැඩි දුරටත් තොරතුරුවලට පිවිසීමට අවශ්‍ය අවසරලත් ආයතනයන්හි සබැඳි (Instittional Link) මෙහි දී එක් කරණු ලැබීම සිදුවේ.

මෙම අතථ්‍ය පුස්තකාලය සඳහා ගල්බොක්ක මුහුදු කැස්බෑ සංරක්ෂණ සහ පර්යේෂණ මධ්‍යස්ථානය පවත්වාගෙන යන සමාජ මාධ්‍ය ජාලා ලෙස සැලකෙන FaceBook, YouTube සහ Instagram ප්‍රවේශ සම්බන්ධ කිරීමට අපේක්ෂා කෙරේ. මෙම පර්යේෂණ ක්‍රියාවලියේදී ප්‍රධාන අනාවරණය වූයේ J-ISI මගින් මෙවැනි දුර්ලභ/ අවදානම් සහගත සතුන් විශේෂ සඳහා ඇති මුද්‍රිත තොරතුරු, අතථ්‍ය එකතුන් ලෙස නිර්මාණය කළ හැකි බවයි. එසේම මෙම අතථ්‍ය පුස්තකාලයේ ස්ථිරව ගබඩා කර ඇති තොරතුරුවලට අමතරව මේ ඔස්සේ සබැඳි නිර්මාණය කිරීමේ හැකියාව පවතින බවය. මෙහි ප්‍රධානතම සොයාගැනීම වනුයේ කැස්බෑවුන් පිළිබඳ අතථ්‍ය පුස්තකාලයක් නිර්මාණය වීමයි. එම පුස්තකාල නිර්මාණය වීම හරහා කැස්බෑවුන් සම්බන්ධයෙන් පර්යේෂණවල නියැලෙන හා ඒ සම්බන්ධ තොරතුරු ගවේෂණය කරන පිරිසෙහි හරස්කඩක් පරීක්ෂා කර බැලිය හැකිය. මේ වන විට ලේඛන (PDF) 70, සඟරා 15, පොත් 15, දෘශ්‍ය සංගෘහිත තැටි 500, අතථ්‍ය පුස්තකාලය තුළට උඩු ගත කර ඇත. මෙම අතථ්‍ය පුස්තකාලය, නවතම තොරතුරු මූලාශ්‍ර ඔස්සේ නිතිපතා යාවත්කාලීන විය යුතුය. විශේෂ පුස්තකාලවල පුස්තකාලවේදීන් මෙම අතථ්‍ය පුස්තකාලය සංවර්ධනය කිරීම සඳහා සුදුසු පියවර

ගත යුතුය. එසේම මෙම අතථ්‍ය පුස්තකාලයේ ලියාපදිංචි වන පරිශීලකයන්ට, නවතම තොරතුරු මූලාශ්‍ර මෙම අතථ්‍ය පුස්තකාලයට යොමුගත වූ පසු ඒ පිළිබඳ කෙටි පණිවිඩයක් (SMS) හෝ විද්‍යුත් තැපැල (E-Mail) මාර්ගයෙන් දැනුවත් කිරීමට අවශ්‍ය මූලික සැකැස්ම සිදු කළ යුතු බවට නිර්දේශ කරනු ලබයි. මෙම අතථ්‍ය පුස්තකාලය ශ්‍රී ලංකාවේ තොරතුරු සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ සුවිශේෂ මෙහෙවරක් කරනු ලබන අංශයක් වන බැවින්, ඒ සඳහා අවශ්‍ය වන තාක්ෂණික පහසුකම්, මෘදුකාංග නඩත්තු හා යාවත්කාලීන කිරීම්, හා දෝෂ සුමටකරණය සහ කළමනාකරණය (Errors Fine Tuning and Management) සඳහා ඊට අදාළ පිළිගත් රාජ්‍ය ආයතනවල (ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, ජාතික විද්‍යා පදනම සහ තොරතුරු සහ තාක්ෂණික සන්නිවේදන නියෝජිතායතනය) සහාය නිරතුරුව ලබා ගත යුතු බවට නිර්දේශ කෙරේ.

**ප්‍රමුඛ පද** : සාගර ජීවීන්, මුහුදු කැස්බෑවුන්, කැස්බෑවුන් සංරක්ෂණය, අතථ්‍ය පුස්තකාල, පාරිසරික සංචාරක කර්මාන්තය

# ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාලවල මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය භාවිතයේ දී මුහුණපාන ගැටලු පිළිබඳ අධ්‍යයනයක්

එච්. ජේ. එල්. පෙරේරා[1]
ප්‍රියංවදා වනිගසූරිය[2]

පුස්තකාලයක පවතින දැනුම පාඨකයන්ට මුණ ගැස්වීම සඳහා භාවිත ප්‍රධානම මෙවලම වනුයේ සූචියයි. පාඨකයාට අවශ්‍ය නිවැරදි තොරතුරු මූලාශ්‍රය වෙත යොමු කරවන සූචිය වෙනස්කම් රාශියකට භාජනය විය. මුද්‍රිත සූචියේ සිට පරිගණකසූචිය දක්වා විකාශනය වෙමින් පැමිණි ගමන් මග දෙස බලන විට එතෙක් භාවිත ශ්‍රමික (Manual) වූ සූචි වර්ගවලට සාපේක්ෂව පරිගණක සූචිය වඩාත් සුවිශේෂී කාර්යයභාරයක් ඉටු කරන්නට සමත් වී ඇත. OPAC යනු මාර්ගගත පොදු ප්‍රවේශසූචිය යන්න හැඳින්වීමට භාවිත කරන කෙටි යෙදුමය. කිසියම් පුස්තකාලයක් සතුව ඇති පුස්තකාල ද්‍රව්‍යයන්ගේ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් මාර්ගගත දත්ත පදනමක් මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය ලෙස සරලව හඳුනාගත හැකිය. මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය වඩාත් ඵලදායී තොරතුරු ගවේශන මාධ්‍යයක් ලෙස පුස්තකාල ක්ෂේත්‍රය තුළ අද්විතීය ස්ථානයක් හිමි කරගෙන ඇත. 1983 වන විට මෙරට පුස්තකාල කටයුතු සඳහා පරිගණක භාවිත කිරිම දක්නට ලැබුණු අතරම ස්වයංක්‍රීයකරණය කරන ලද පුස්තකාල ආශ්‍රිතව මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය හඳුන්වා දීම 20 වන සියවසේ අග භාගයේදී පමණ සිදු විය. ඒ අනුව ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාලවල මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය (OPAC) භාවිතයේදී පාඨකයන් ගැටලුවලට මුහුණපාන්නේද යන්න හඳුනා ගැනීම අධ්‍යයනය ගැටලුව වශයෙන් ගනිමින් මෙම පර්යේෂණය සිදුකර ඇත. මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය භාවිතයේදී මුහුණපාන ගැටලු හඳුනා ගැනීම සහ ගැටලුවලට විසඳුම් යෝජනා කිරීම පර්යේෂණ අරමුණු ලෙස දැක්විය හැකිය. ලංකාවේ මහජන පුස්තකාල අතුරින් පුස්තකාල 25 ක පමණ මාර්ගගත පොදු ප්‍රවේශ සූචි පහසුකම ලබා දෙන බව හඳුනාගත් අතර මෙම තොරතුරු ලබා ගැනීමේදී ලිඛිත මූලාශ්‍ර සොයා ගැනීමට නොහැකි වීම නිසාවෙන් අන්තර්ජාලය පරිශීලනය කිරීමෙන් තොරතුරු රැස්කර ගන්නා ලදී. OPAC ප්‍රවර්ධනය කරනු ලබන පුස්තකාල 25 අතුරින් පුස්තකාල 3 ක් නියැදිය ලෙස තෝරා ගන්නා ලදි. කොළඹ මහජන පුස්තකාලය, කිරිමැටියාන මහජන පුස්තකාලය සහ සෙනරත් පරණවිතාන මහජන පුස්තකාලය යන පුස්තකාල ත්‍රිත්වය ඒ අතර විය.

1 ගුරු පුස්තකාලයාධිපති, ,සෝමාදේවි බාලිකා විද්‍යාලය
lakshaniperera894@gmail.com
2 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය

මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය පාදක කොට ගෙන සිදු කරන ලද මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත සහ ද්විතීක දත්ත භාවිත කරන ලදී. නියැදිය වශයෙන් තෝරා ගන්නා ලද පුස්තකාල ත්‍රිත්වයෙන් එක් පුස්තකාලයකින් අහඹු ලෙස පාඨකයන් 60 දෙනෙකු නියෝජනය වන සේ පාඨකයන් 180 දෙනෙකු තෝරා ප්‍රශ්නාවලි ලබාදෙමින් දත්ත රැස් කිරිම කරන ලදී. මහජන පුස්තකාලවල මාර්ගගත පොදු ප්‍රවේශ සූචි අනුසාරයෙන් වෙබ් පාදක සමීක්ෂණයක් ද මහජන පුස්තකාලයකින් පුස්තකාලයාධිපති ඇතුලූ කාර්යය මණ්ඩල සාමාජිකයන් 4 දෙනෙකු නියෝජනය වන පරිදි කාර්යය මණ්ඩල සාමාජිකයින් 12 දෙනෙකු මගින් සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කිරීම සිදු කරන ලදී. ප්‍රශ්නාවලි මගින් රැස් කළ දත්ත විශ්ලේෂණය කිරීම සඳහා SPSS මෘදූකාංග පද්ධතිය උපයෝගී කර ගන්නා ලදී.

මාර්ගගත පොදු ප්‍රවේශසූචිය භාවිත කිරීමේදී බහුතර පරිශීලකයන් ප්‍රමාණයකට මුහුණ පෑමට සිදු වූ ගැටලුව ලෙස, වෙනත් භාෂාවල පොත් සෙවීමේදී ඇති වන භාෂාමය ගැටලු ඇති වීම 78.64% (81) හඳුනාගත හැකි අතර අවම වශයෙන් පරිශීලකයන් මුහුණ පෑ ගැටලුව ලෙස, පුසත්කාල කාර්ය මණ්ඩලය සහාය වීමට අකමැත්තක් පෙන්වීම 25.24% (26) හඳුනාගත හැකිය. කෙසේ නමුත් ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල මගින් ක්‍රියාත්මක මාර්ගගත පොදු ප්‍රවේශ සූචි භාවිතයේදී පරිශීලකයන් ගැටලුවලට මුහුණපාන බව නිගමනය කළ හැකි අතර OPAC පිළිබද අධ්‍යයනය කිරීමේදී ප්‍රතිසංවිධාන විය යුතු තත්ත්වයන් පවතින බව හඳුනාගත හැකිය. එකී යෝජනාවන් අතර සිංහල, දෙමළ භාෂාවලින් පොත් සෙවීම පහසු කරලීම (හෙළකුරු වැනි යතුරු පුවරුවක් භාවිත කිරීමෙන් සිංහල Unicode මගින් ලියන ලද සිංහල අකුරු මෙම මෙවලම (Tool) මගින් Fmabhaya වැනි සිංහල Legacy Fonts වලට හුවමාරු කිරීමේ පහසුකම් ලබා දෙනු ලැබේ), Spell checker, transliteration වැනි පහසුකම් සහිතව තාක්ෂණික දෝෂ අවම වන අයුරින් OPAC ක්‍රියාත්මක කිරීම, මාර්ගගත පොදු ප්‍රවේශ සූචියෙහි සමස්ථ, ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධයක් පරිශීලකයන්ට ලබා දීම, මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය පිළිබද පාඨකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය තවදුරටත් සරල කිරීම, මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය ආශ්‍රිත සහාය පහසුකම් සංවිධානය දැක්විය හැකිය.

ප්‍රමුඛ පද : මහජන පුස්තකාල, මාර්ගගත පොදු ප්‍රවේශ සූචිය, කොළඹ මහජන පුස්තකාලය, කිරිමැටියාන මහජන පුස්තකාලය, සෙනරත් පරණවිතාන මහජන පුස්තකාලය

**Sri Lanka Library Association**
**275/75, Stanley Wijesundara Mawatha,**
**Colombo 07, Sri Lanka**

ISBN 978-624-5987-05-4
9 786245 987054